## ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

# වාර්ෂික වාර්තාව සහ ගිණුම්

# 2023

## දැක්ම ...

“දේශීය වෛද්‍ය ක්‍රමය සහ සේවා පිළිබඳ අධ්‍යාපනය සහ පර්යේෂණ සම්බන්ධයෙන් විශිෂ්ට කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම”

## මෙහෙවර.......

“ජාතික සහ ගෝලීය අවශ්‍යතාවන් සපුරාලන දැනුම, කුසලතා සහ ආකල්පවලින් පොහොසත් වෘත්තිකයින් බිහි කිරීම පිණිස දේශීය වෛද්‍ය ක්‍රමය සහ විද්‍යා පිළිබඳ ඉහළ ගුණාත්මකභාවයකින් යුත් ඉගෙනුම් පරිසරයක් සැලසීම සහ නවීන පර්යේෂණ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම”

## ඉලක්ක...

- දේශීය වෛද්‍ය අධ්‍යාපනය වැඩිදියුණු කිරීම පිණිස විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීම.
- දේශීය වෛද්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම හරහා ඒ පිළිබඳ රාජ්‍ය උසස් අධ්‍යාපනයට ඇති ප්‍රවේශය වැඩි දියුණු කිරීම.
- දේශීය වෛද්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළ ගුණාත්මක පර්යේෂණ සහ නවෝත්පාදන හරහා ශාස්ත්‍රීය විශිෂ්ටත්වය වැඩිදියුණු කිරීම.
- ඉහළ ගුණාත්මක, කාර්යක්ෂම මානව ප්‍රාග්ධනය සමඟ විශ්වවිද්‍යාලය වැඩිදියුණු කිරීම.
- ශක්තිමත් නිපුණතාවලින් පොහොසත් උපාධිධාරියෙකු බිහි කිරීම.
- කාර්යක්ෂම සහ ඵලදායී කළමනාකරණ සංස්කෘතියක් අත්කර ගැනීම පිණිස ආරක්ෂිත සහ ස්ථාවර පද්ධති හරහා විශ්වවිද්‍යාලයේ පාලනය සහ කළමනාකරණය ශක්තිමත් කිරීම.

## උපකුලපතිතුමාගේ සමාලෝචනය



ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ 2023 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව නිකුත් කිරීම මාගේ ඉමහත් ප්‍රීතියට කරුණකි. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය ජීවිතයේ අභියෝග ජයගැනීම පිණිස වර්ෂ ගණනාවක් තිස්සේ යොදා ගන්නා දේශීය දැනුම් පද්ධතිවල ප්‍රගතිය වෙනුවෙන් කැපවී සිටින ප්‍රමුඛතම උසස් අධ්‍යාපන ආයතනයකි. අධ්‍යයන ක්‍රියාකාරකම්, පර්යේෂණ සහ සමස්ත ගුණාත්මකභාවය යනා දී අංශ අනුව සැලකීමේ දී විශ්වවිද්‍යාලය සීඝ්‍ර ඉදිරි ගමනක් වෙනුවෙන් පියවර ගෙන ඇති බවට අනාවරණය වේ. ආයතනය විශ්වවිද්‍යාලයක් බවට පත්වීමෙන් අනතුරුව එහි භෞතික යටිතල පහසුකම් සහ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය කැපී පෙනෙන ලෙස වැඩිදියුණු කර ඇත. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය අපරදිග සහ බටහිර දැනුම පාදම් දෙකම ඇදා ගනිමින් ඉගෙනුම් සහ පර්යේෂණ සංස්කෘතියක් ගොඩනගා ඇත. ජාතික ආර්ථිකයේ පැවති තත්ත්වය හේතුවෙන් මූලික පසුබෑමකට මුහුණ දීමට සිදු වුව ද මෙම නව විශ්වවිද්‍යාලය ඉදිරි වසර කිහිපය තුළ දී විශිෂ්ට ජයග්‍රහණ රැසක් අත් කර ගැනීමට අපේක්ෂා කරනු ලබයි. මානව ශිෂ්ටාචාරයේ ප්‍රගමනය වෙනුවෙන් සිය සේවාවන් කැපකිරීමට සමත් දැනුමින් පොහොසත්, දක්ෂ නිපුණ වෘත්තිකයින් උත්පාදනය කිරීමට විශ්වවිද්‍යාලය ඉලක්ක කරයි. මෙම වාර්තාව මඟින් අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන ව්‍යායාමයන් අනුව පීඨ හතර මඟින් අත්කර ගෙන ඇති ජයග්‍රහණ අවධාරණය කරනු ලබයි. විශේෂයෙන්ම වර්තමාන ජාතික සහ ගෝලීය දුෂ්කරතාවන් සැලකීමේ දී විශ්වවිද්‍යාලය ඉතාම කෙටි කාලයක් ඇතුළත අති විශිෂ්ට දියුණුවක් සාක්ෂාත් කර ගෙන ඇත.

අභාවප්‍රාප්ත ආයුර්වේද චක්‍රවර්තී පණ්ඩිත ජී. පී. වික්‍රමාරච්චි මැතිතුමා වර්ෂ 1929 දී ජාතියේ අවශ්‍යතාවක් සපුරාලමින් "ගම්පහ සිද්ධායුර්වේද වෛද්‍ය විද්‍යාලය" ස්ථාපිත කරමින් මෙම විශ්වවිද්‍යාලය සඳහා වූ මූලික පදනම ආරම්භ කරන ලදී. විශ්වවිද්‍යාලයේ පළමු උපකුලපති වන ජ්‍යෙෂ්ට මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ "කැළණිය විශ්වවිද්‍යාලයේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය" 2021 වර්ෂයේ දී රාජ්‍ය විශ්වවිද්‍යාලයක් මට්ටමට උසස් කිරීම සඳහා ඉමහත් සේවයක් ඉටු කරන ලදී.

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය ස්ථාපිත කරනු ලැබුවේ ඉහළ අධ්‍යාපන ප්‍රමිති, පර්යේෂණ සහ නවෝත්පාදන ප්‍රදර්ශනය කරනු වස් දේශීය දැනුම විද්‍යාව පාදක තාක්ෂණය සමඟ මුසු කර ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි අධ්‍යාපනය සම්බන්ධයෙන් පදනමක් ස්ථාපිත කිරීම පිණිස වේ. විශ්වවිද්‍යාලය දේශීය වෛද්‍ය විද්‍යා පීඨය, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය, දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය, සහ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය යන පීඨ හතරකින් සැදුම්ලත් වේ. දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය නුගේගොඩ පිහිටා ඇති අතර අනෙකුත් පීඨ තුන යක්කල ප්‍රධාන පරිශ්‍රයේ පිහිටා ඇත. සියලුම පීඨ අධ්‍යයන අංශ 14කින් සමන්විත වේ. විශ්වවිද්‍යාලය 2021 වර්ෂයේ දී ප්‍රථම උපාධිධාරීන් සඳහා නව උපාධි වැඩසටහන් කිහිපයක්ම හඳුන්වා දී ඇති අතර පසුව සහතිකපත්‍ර පාඨමාලා සහ පශ්චාත් උපාධි මට්ටම් සඳහා නව පාඨමාලා හඳුන්වා දී ඇත. විදේශීය විශ්වවිද්‍යාල සහ අදාළ ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් සහ සබැඳි ගණනාවක් ස්ථාපිත කර ගෙන ඇත. එයට අමතරව, ශිෂ්‍යයින්ගේ ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය කිරීම සඳහා මෙන්ම විශ්වවිද්‍යාලය සඳහා ආදායම උත්පාදනය කරන පිණිස විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර සබැඳි හරහා සමාන්තර අධ්‍යයන වැඩසටහන් සහ ව්‍යාපාර හවුල්කාරත්වයන් දියත් කර ඇත.

## විශ්වවිද්‍යාලයේ වැදගත් සිදුවීම්

- රාජ්‍ය අංශය සඳහා වූ විශිෂ්ටතම වාර්ෂික වාර්තා සහ ගිණුම් (විශ්වවිද්‍යාල කාණ්ඩය) සම්මාන ප්‍රදානෝත්සවයේ දී අනුකූලතා සහතිකය ප්‍රදානය කරන ලදී - 2022 (2023.12.04 වැනි දින ප්‍රදනය කරන ලදී)







- උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධන මෙහෙයුම් වේගවත් කිරීම පිළිබඳ ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රමුඛ විෂයයන් සම්බන්ධයෙන් බඳවාගැනීම ඉහළ නැංවීම (STEM) ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමේ සහතිකපත්‍රය ප්‍රදානය කරන ලදී.



CERTIFICATE OF IMPLEMENTATION

THIS CERTIFICATE IS AWARDED TO

Gampaha Wickramarachchi University of Indigenous Medicine

FOR IMPLEMENTING
INCREASING ENROLLMENT IN HIGHER EDUCATION IN PRIORITY DISCIPLINES (STEM) FOR
ECONOMIC DEVELOPMENT OF THE
ACCELERATING HIGHER EDUCATION EXPANSION AND DEVELOPMENT OPERATION
MINISTRY OF EDUCATION, SRI LANKA

Senior Professor Chandana P. Udawatte
Program Director, AHEAD Operation &
Vice Chairman/ UGC

Dr.(Ms.) SJMNG Samarakoon
Senior Academic Expert, Management,
Monitoring & HRD, AHEAD Operation

AHEAD

THE WORLD BANK

- 2023.02.21 වැනි දින රුසියානු නියෝජිතයින්ගේ පැමිණීම.



- **2023.07.31 වැනි දින  ශ්‍රී ලංකා රුසියානු තානාපති ලෙවාන් සගරියන් මහතාගේ පැමිණීම.**



- **2023.08.17 වැනි දින MAA නිෂ්පාදන සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.**



- **2023 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ව්‍යාපාර සබැඳි නිලධාරීන් (University Business Linkage officials) විශ්වවිද්‍යාලයට පැමිණීම**




මහාචාර්ය රංජන වික්‍රම සෙනෙවිරත්න
උපකුලපති

# පටුන


දැක්ම ... i

මෙහෙවර... ... i

ඉලක්ක... i

උපකුලපතිතුමාගේ සමාලෝචනය ii

**1.** හැඳින්වීම – ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය 1

1.1 නව විශ්වවිද්‍යාලයේ පැවරුම් බලය 2

1.2 විශ්වවිද්‍යාලයේ වැදගත් සන්ධිස්ථාන 3

**2.** විශ්වවිද්‍යාලයේ සාරධර්ම 4

**3.** ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යුහය 5

**4.** පාලක සභාවේ සාමාජිකයින් – 2023 6

**5.** විශ්වවිද්‍යාලයේ නිලධාරීහු - 2023 7

**6.** පීඨ සහ අධ්‍යයන අංශ 8

**7.** පීඨ පිරිනමන ප්‍රථම උපාධි වැඩසටහන් 9

**8.** විශ්වවිද්‍යාලය පිරිනමන පශ්චාත් උපාධි වැඩසටහන් 9

**9.** විශ්වවිද්‍යාලය පිරිනමන බාහිර පාඨමාලා 9

**10.** ආරම්භ කළ නව පාඨමාලා විස්තර - 2023 10

**11.** දේශීය ශිෂ්‍යයින්ගේ විස්තර - 2023 11

**12.** 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා ශිෂ්‍යයින්ගේ විස්තර 12

**13.** උපාධිධාරී නිමැවුම - 2023 12

**14.** පශ්චාත් උපාධිධාරී නිමැවුම - 2023 13

**15.** මානව සම්පත් සහ ශිෂ්‍යයින් පිළිබඳ විස්තර - 2023 14

**16.** ශිෂ්‍ය කටයුතු 16

16.1 ප්‍රථම උපාධි අපේක්ෂකයින් සඳහා නේවාසිකාගාර පහසුකම් - 2023 16

16.2 ශිෂ්‍යාධාර/ මහපොළ ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව - 2023 16

**17.** මානව සම්පත් 18

17.1 2023.12.31 දිනට සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය, අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය, විධායක කාර්ය මණ්ඩලය, පුස්තකාල කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර 18

**18.** පර්යේෂණ සහ සංවර්ධනය 20

18.1 පර්යේෂණ කවුන්සිලය 20

18.2 පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර ....................................... 22
18.3 ලැබූ සම්මාන පිළිබඳ විස්තර ....................................... 23
**19.** වෙනත් ඒකක සහ මධ්‍යස්ථාන ....................................... 25
19.1 පණ්ඩිත ජී.පී. වික්‍රමාරච්චි අනුස්මරණ පුස්තකාලය ....................................... 26
19.2 ශාරීරික අධ්‍යාපන ඒකකය ....................................... 31
19.3 වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය ....................................... 34
19.4 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය ....................................... 37
19.5 වෛද්‍ය මධ්‍යස්ථානය ....................................... 39
19.6 තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය ....................................... 40
19.7 මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මධ්‍යම විද්‍යාගාරය ....................................... 42
19.8 ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය/සමානාත්මතාව සඳහා මධ්‍යස්ථානය (CGEE) ....................................... 44
19.9 සමාජ සංහිඳියා මධ්‍යස්ථානය (SRC) ....................................... 47
19.10 තත්ත්ව සහතික මධ්‍යස්ථානය (CQA) ....................................... 48
19.11 ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ මධ්‍යස්ථානය (ELTC) ....................................... 52
19.12 මාධ්‍ය සහ මුද්‍රණ අංශය ....................................... 54
19.13 ගම්පහ වික්‍රමාරච්චි අන්තර්ජාතික මධ්‍යස්ථානය (GWIC) ....................................... 58
19.14 විශ්වවිද්‍යාල ව්‍යාපාර සබැඳිය (UBL) ....................................... 62
**20.** මූල්‍ය කාර්යයසාධනය **2023** ....................................... 67
20.1 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර ....................................... 68
20.2 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර ....................................... 68
20.3 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්) ....................................... 68
20.4 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උපයන ලද ආදායම) ....................................... 69
20.5 මූල්‍ය කාර්යසාධනය විශ්ලේෂණය – 2023 ....................................... 69
20.6 එක් ශිෂ්‍යයෙක් වෙනුවෙන් පිරිවැය 2019 – 2023 (මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම් ඇතුළුව) ....................................... 69
**21.** මූල්‍ය ප්‍රකාශන **- 2023** ....................................... 70
**22.** තිරසාර සංවර්ධන ඉලක්කවලට අනුකූලවීම **2023/2024** ....................................... 100
**23.** විගණකාධිපති වාර්තාව **- 2023** ....................................... 110
**24. 2023** වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාවට පිළිතුරු ....................................... 117

# කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| GWUIM | - | ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය |
| FIM | - | දේශීය වෛද්‍ය පීඨය |
| FIHST | - | දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණය පීඨය |
| FISSMS | - | දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය |
| FGS | - | පශ්චාත්උපාධි අධ්‍යයන පීඨය |
| SDC | - | කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය |
| ICTC | - | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය |
| CGU | - | වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය |
| CGEE | - | ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය/සමානාත්මතාව සඳහා මධ්‍යස්ථානය |
| SRC | - | සමාජ සංහිඳියා මධ්‍යස්ථානය |
| CQA | - | තත්ත්ව සහතික මධ්‍යස්ථානය |
| DR | - | නියෝජ්‍ය ලේඛකාධිකාරී |
| DB | - | නියෝජ්‍ය මූල්‍යාධිකාරී |
| SAR | - | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී |
| SAL | - | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති |
| SAIA | - | ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක |
| AR | - | සහකාර ලේඛකාධිකාරී |
| AB | - | සහකාර මූල්‍යාධිකාරී |



# 1. හැඳින්වීම - ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය



විශ්වවිද්‍යාලය කොළඹින් කිලෝ මීටර 30ක් පමණ දුරින් කොළඹ - නුවර මාර්ගයේ යක්කල ප්‍රදේශයේ පිහිටා ඇත. අභාවප්‍රාප්ත වූ ආයුර්වේද චක්‍රවර්ති පණ්ඩිත ගේබ්‍රියල් පෙරේරා වික්‍රමාරච්චි ශ්‍රීමතාණන් විසින් 1929 වර්ෂයේ දී ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය ලෙස මෙම ආයතනය ස්ථාපනය කිරීම සමඟ මෙම ආයතනය ආරම්භ කරන ලදී. ඒ සාම්ප්‍රදායක වෛද්‍යවරුන් හට ඔසු ඖෂධ සකස් කිරීම සහ චිකිත්සාව ඇතුළු අෂ්ඨාංග ආයුර්වේදය පිළිබඳ දැනුම සහ නිපුණතා ලබාදීම පිණිස යක්කල පිහිටි තම පෞද්ගලික ඉඩමේ දීය. ඖෂධ නිෂ්පාදන ඒකකයක්, රෝහලක් සහ දුර්ලභ ඖෂධ පැළ එකතුවකින් සැඳුම්ලත් ඖෂධ උද්‍යානයක් ආයතනය ආරම්භක අවස්ථාවේ දී ආයතනය සතුවූ අගනි සම්පත් විය. ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ නැඟී එන නව ප්‍රවණතා සහ එමඟින් ජාතික සෞඛ්‍ය අංශයට දක්වන අති විශාල දායකත්වය හඳුනා ගනිමින් 1951 වර්ෂයේ දී විද්‍යාලය රාජ්‍ය පිළිගත ආයතනයක් බවට ප්‍රකාශ කරනු ලැබුවේ එකී ආයතනයෙන් පිරිනමන ඩිප්ලෝමාධාරීන්ට රාජ්‍ය අංශයේ ආයුර්වේද රෝහල්වල සේවයට සුදුසුකම් සපුරාලන වෘත්තිකයින් බවට පත් කරමිනි. 1982 වර්ෂයේ දී සම්මත කළ 1982 අංක 30 දරන පාර්ලිමේන්තු පනත මඟින් විද්‍යාලය දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය ලෙස සංස්ථාගත කරන ලදී. වර්ෂ 1995 පෙබරවාරි 23 වැනි දිනැති අංක 859/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් ආයතනය කැළණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ කිරීමත් සමඟ එය විශ්වවිද්‍යාල විද්‍යායතනයක තත්ත්වයට උත්ශ්‍රේණිගත කරන ලදී.

2020.07.08 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී "සෞභාග්‍යයේ දැක්ම" ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ ගම්පහ දිස්ත්‍රික්කය සංවර්ධනය කිරීමට සමගාමීව යක්කල, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය අංගසම්පූර්ණ විශ්වවිද්‍යාලයක තත්ත්වයට උසස් කිරීම සඳහා තීරණය කරන ලදින් වර්තමාන විද්‍යායතනය 2021.03.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි "ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය" නමින් විශ්වවිද්‍යාලයක් බවට උසස් කිරීම සඳහා වූ එකී නියෝගය 2020.10.28 දිනැති අංක 2199/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයෙන් නිකුත් කරන ලදී.

නව විශ්වවිද්‍යාලයට පීඨ හතරක් සහ අධ්‍යයන අංශ 13ක් ඇතුළත් වන අතර ප්‍රථම උපාධි වැඩසටහන් 08ක් සහ පශ්චාත් උපාධි පාඨමාලා 09ක් පිරිනමනු ලබයි. විශ්වවිද්‍යාලය 2020 වර්ෂයේ උසස් පෙළ ප්‍රතිඵල මත පදනම්ව ප්‍රථම උපාධි මට්ටම සඳහා ශිෂ්‍යයින් 600ක් පමණ ඇතුළත් කරවා ගැනීමට යෝජනා කරන ලද අතර මෙම ශිෂ්‍ය බඳවා ගැනීම ක්‍රමයෙන් වැඩි කරනු ඇත.

විශ්වවිද්‍යාලය දේශීය වෛද්‍ය පීඨය, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය, දේශීය සමාජ විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය සහ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය යන පීඨ හතරකින් සැදුම්ලත් වේ. මෙම පීඨවලට අධ්‍යයන අංශ 14ක් ඇතුළත් වේ. විශ්වවිද්‍යාලය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය

(BAMS) හැරුණු කොට 2021 වර්ෂයේ දී නව ප්‍රථම උපාධි පාඨමාලා හතක් ආරම්භ කිරීමටත් පසුව ක්‍රමයෙන් ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි මට්ටම්වලට නව පාඨමාලා හඳුන්වා දීමට අපේක්ෂා කරයි.

නිර්මාතෘ පණ්ඩිත ජී පී වික්‍රමාරච්චි ශ්‍රීමතාණන්. ඔහු ඉටු කළ කාර්යභාරයට ඉතා පුළුල් පිළිගැනීමක් හිමි වූ අතර ඔහු ආයුර්වේද වෛද්‍යවරයෙක් සඳහා පිරිනමන ඉහළම ගෞරවය වන ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් පිරිනමන ‘ආයුර්වේද චක්‍රවර්ති රාජ වෛද්‍ය’ යන අභිධානය ප්‍රදානය කළ පළමු වැන්නා විය. (ඡායාරූපය සීමසහිත ගම්පහ වික්‍රමාරච්චි සිද්ධායුර්වේද ඖෂධ (පුද්ගලික) සමාගමෙන් ලබා ගන්නා ලදී).



## 1.1 නව විශ්වවිද්‍යාලයේ පැවරුම් බලය

“සෞභාග්‍යයේ දැක්ම” වර්තමාන ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුව ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, විශ්වවිද්‍යාලයක තත්ත්වයට උසස් කිරීම ඉහළම ප්‍රමුඛතාව විය. ඒ අනුව, 2020 ජුලි 08 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී විද්‍යායතනය අංගසම්පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට උසස් කිරීමට තීරණය කරන ලදී. නව විශ්වවිද්‍යාලය 2020 ඔක්තෝබර් මස 28 දිනැති අංක 2199/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වැනි වගන්තිය යටතේ 2021 මාර්තු 01 වැනි දින සිට ස්ථාපනය කරනු ලැබූ අතර 2021 පෙබරවාරි මස 28 වැනි දින සිට 1995 පෙබරවාරි මස 23 දිනැති අංක 859/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් අවලංගු කරන ලදී.

දේශීය වෛද්‍ය විද්‍යා පිළිබඳ අධ්‍යයන ශාඛාවන් හි උසස් අධ්‍යාපනය ලබාදීම, දියුණු කිරීම සහ සංවර්ධනය කිරීම සහ අනාගත ඉල්ලුම සපුරා ලිය හැකි එකී ක්ෂේත්‍රවල මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම නව විශ්වවිද්‍යාලයේ පැවරුම් බලය වේ. විශ්වවිද්‍යාලය සාම්ප්‍රදායක විශ්වවිද්‍යාලයක් ලෙස ක්‍රියාත්මක නොවේ. ඇතැම් උපාධි වැඩසටහන් පැවැත්වීම සහ නේවාසිකාගාර පහසුකම් සලසා ලනු පිණිස පෞද්ගලික රාජ්‍ය හවුල්කාරත්ව (PPP) වැඩසටහන් ඇති කර ගැනීමට විශ්වවිද්‍යාලය සැලසුම් කර ඇත. ශිෂ්‍යයින්ට කථිකාචාර්යවරුන්ගේ සහ කාර්මික විද්වතුන්ගේ අධීක්ෂණය යටතේ ආධුනිකයෙක් වශයෙන් වැඩ කරන අතරතුර ඔහු/ ඇය පන්ති කාමරය තුළ දී අත්කර ගන්නා න්‍යායාත්මක දැනුම සැබෑ ලෝකයට අදාළ කර ගැනීමට අවස්ථාව හිමි වන "ඉගෙනුම අතර වැඩ කිරීම" සංකල්පය ලෙස නව සංකල්පයක් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියට හඳුන්වා දීමට විශ්වවිද්‍යාලය අපේක්ෂා කරනු ලබයි.

## 1.2 විශ්වවිද්‍යාලයේ වැදගත් සන්ධිස්ථාන

| | |
|---|---|
| **1929** | ආයුර්වේද චක්‍රවර්ති පණ්ඩිත ජී.පී. වික්‍රමාරච්චි ශ්‍රීමතාණන් විසින් 1929.07.19 වැනි දින ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය ආරම්භ කරන ලදී. |
| **1951** | ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලයේ ඩිප්ලෝමාධාරීන්ට රජයේ ආයුර්වේද රෝහල්වල සේවය කළ හැකි පරිදි ආණ්ඩුව මඟින් ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය පිළිගැනීම |
| **1982** | අංක 30 දරන පර්ලිමේන්තු පනත මඟින් ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය දේශීය වෛද්‍ය විද්‍යා අමාත්‍යාංශය යටතට ගැනීම. |
| **1995** | 1995 පෙබරවාරි 23 දිනැති අංක 859/12 මඟින් 1995.03.01 දින සිට බලාත්මක වන පරිදි විද්‍යාලය "ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය" කැළණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ කිරීම. |
| **1998** | ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධි වැඩසටහනේ (BAMS) 1වැනි ශිෂ්‍ය කණ්ඩායම ඇතුළත් කර ගැනීම (BAMS) |
| **2002** | පශ්චාත් උපාධි වැඩසටහන් ආරම්භ කරන ලදී. |
| **2018** | ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධි වැඩසටහන (BAMS) ඉන්දියානු වෛද්‍ය මධ්‍යම කවුන්සිලය (CCIM) මඟින් අනුමත කිරීම |
| **2021** | 2020 ඔක්තෝබර් 28 දිනැති අංක 2199/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් 2021.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විද්‍යායතනය "ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය" ලෙස උසස් කිරීම. |

## 2. විශ්වවිද්‍යාලයේ සාරධර්ම

විශ්වවිද්‍යාලයේ සාරධර්ම සංවිධානය විශ්වාස කරනු ලබන්නේ කුමක් ද, සංවිධානය තුළ සිටින තැනැත්තන් එකිනෙකා සමඟ, ගනුදෙනුකරුවන් සමඟ සහ සැපයුම්කරුවන් සමඟ සහ අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශ්ව සමඟ කටයුතු කිරීමට අපේක්ෂා කරන්නේ කෙසේ ද යන්න අර්ථදක්වයි.

විශ්වවිද්‍යාලයේ ප්‍රධාන සාරධර්ම හතර පහත අර්ථ දක්වා ඇත.

1. **අවංකභාවය (Integrity)**

   අපට අවංකභාවය සහ විශ්වාසනීයත්වය හරහා උනන්දුවක් දක්වන පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය දිනා ගත හැකි බවට අපි විශ්වාස කරන්නෙමු

2. **අභිප්‍රේරණය (Motivation)**

   අපි අභිප්‍රේරණය හරහා විශිෂ්ටත්වය කරා ගමන් කරන්නෙමු

3. **නවෝත්පාදනය (Innovation)**

   අපි නව මංපෙත් විවර කර ගැනීම සඳහා නවෝත්පාදනය සහ නිර්මාණශීලීත්වය හරහා නව දැනුම උත්පාදනය කරන්නෙමු

4. **ගරු කිරීම (Respect)**

   අපි කණ්ඩායම් වැඩ සහ එකිනෙකා සඳහා ගෞරවය ඇති කරවන සාමූහික පරිසරයක් තුළින් සාරධර්ම අත්කර ගන්නෙමු



## 3. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යුහය



# 4. පාලක සභාවේ සාමාජිකයින් – 2023

**උපකුලපතිතුමා**

i. මහාචාර්ය රංජන වික්‍රම සෙනෙවිරත්න මහතා (වැඩබලන) - 01.10.2021 – 06.06.2022
   මහාචාර්ය රංජන වික්‍රම සෙනෙවිරත්න මහතා - 07.06.2022 – මේ දක්වා

**පීඨාධිපතිවරු**

i. පීඨාධිපති - දේශීය වෛද්‍ය විද්‍යා පීඨය
   ආචාර්ය ඩබ්ලිව්.ජේ. වික්‍රමාරච්චි මහත්මිය - 23.12.2021 - මේ දක්වා

ii. පීඨාධිපති - දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය
   ආචාර්ය එන්.ටී.බී. මධුශංක මහතා - 29.09.2021 - 11.05.2023
   ආචාර්ය වයි.එච්.පී.එස්.එස්. පතිරත්න මහතා - 12.05.2023 - මේ දක්වා

iii. පීඨාධිපති - දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය
   ආචාර්ය ජී.කේ. ජයතිලක මහත්මිය - 01.10.2021 - මේ දක්වා

iv. පීඨාධිපති - පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය
   ආචාර්ය ඩබ්ලිව්.ඒ.එල්. චන්ද්‍රසිරි වැලිවිට මහතා - 01.03.2021 – මේ දක්වා

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පත් කළ සාමාජිකයන්**

i. මහාචාර්ය හරිස්චන්ද්‍ර අබේගුණවර්ධන මහතා
ii. වෛද්‍ය එච්. ධර්මවිජය මහතා
iii. සිරිමල් සේනාරත්න මහතා
iv. ආචාර්ය පී. ඩබ්ලිව්. ඩබ්ලිව්. දිසානායක මහතා
v. ප්‍රශාන්ත ලාල් ද අල්විස් මහතා
vi. සුනිල් ජයලත් මහතා
vii. ගීතා කරදවල මහත්මිය
viii. වෛද්‍ය අනුෂා වික්‍රමාරච්චි මහත්මිය

**සනාතන සහ නාමික නිලධරයන්**

i. ආචාර්ය ටී.එච්.එන්.ආර්.ටී. හේවගේ මහතා
ii. ආචාර්ය පූජ්‍ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි

**ලේඛකාධිකාරී (ලේකම්)**

බී.ඒ.එන්. ක්‍රිශාන්ත මහතා

## 5. විශ්වවිද්‍යාලයේ නිලධාරීහු - 2023

| | | |
|---|---|---|
| **කුලපති** | **මල්වතු පාර්ශ්වයේ අති පූජ්‍ය සාහිත්‍ය චක්‍රවර්ති, ආචාර්ය නියන්ගොඩ ධර්මකීර්ති ශ්‍රී සංඝරක්ඛිත විජිතසිරි අනුනායක ස්වාමීන්වහන්සේ** |  |
| **උපකුලපති** | මහාචාර්ය රංජන වික්‍රම සෙනෙවිරත්න මහතා |  |
| **පීඨාධිපති, දේශීය වෛද්‍ය විද්‍යා පීඨය** | ආචාර්ය ඩබ්ලිව්.ජේ. වික්‍රමාරච්චි මහත්මිය |  |
| **පීඨාධිපති, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය** | ආචාර්ය වයි.එච්.පී.එස්.එස්. පතිරත්න මහතා |  |
| **පීඨාධිපති, සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය** | ආචාර්ය ජී.කේ. ජයතිලක මහත්මිය |  |
| **පීඨාධිපති, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය** | ආචාර්ය ඩබ්ලිව්.ඒ.එල්.සී.වැලිවිට මහතා |  |
| **ලේඛකාධිකාරී** | බී.ඒ.එන්. ක්‍රිශාන්ත මහතා |  |
| **වැඩබලන පුස්තකාලයාධිපති** | ආචාර්ය ජී.ආර්. පද්මසිරි මහතා |  |
| **මූල්‍යාධිකාරී** | සී.ජී. කොතලාවල මහතා |  |

# 6. පීඨ සහ අධ්‍යයන අංශ

### දේශීය වෛද්‍ය විද්‍යා පීඨය

- ආයුර්වේද මූලධර්ම අධ්‍යයන අංශය
- චිකිත්සා අධ්‍යයන අංශය
- ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය
- ශල්‍යශාලක්‍ය අධ්‍යයන අංශය
- කෞමාරභෘත්‍ය සහ ස්ත්‍රී රෝග අධ්‍යයන අංශය
- භාෂා අධ්‍යයන අංශය
- දේශීය චිකිත්සා අධ්‍යයන අංශය
- රෝග විඥාන අධ්‍යයන අංශය

### දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය

- දේශීය සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන අංශ
- දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයන අංශය
- තාක්ෂණ අධ්‍යයන අංශය

### දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය

- දේශීය සාමාජීය විද්‍යා අධ්‍යයන අංශය
- කළමනාකරණ අධ්‍යයන අංශය
- තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය

### පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය



## 7. පීඨ පිරිනමන ප්‍රථම උපාධි වැඩසටහන්

| පීඨය | උපාධි වැඩසටහන |
|---|---|
| දේශීය වෛද්‍ය විද්‍යා පීඨය | ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය |
| දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය | ජෛව වෛද්‍ය තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යා ගෞරව උපාධිය |
| | සෞඛ්‍ය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය |
| | දේශීය ඖෂධ තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය |
| | දේශීය වෛද්‍ය සම්පත් පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය |
| | යෝග සහ පාරමනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය |
| | සෞඛ්‍ය සංචාරක සහ ආගන්තුක සත්කාර පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය |
| දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය | දේශීය දැනුම පිළිබඳ සාමාජීය අධ්‍යයන පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය |

## 8. විශ්වවිද්‍යාලය පිරිනමන පශ්චාත් උපාධි වැඩසටහන්

| පීඨය | පශ්චාත් උපාධිය/ඩිප්ලෝමාව |
|---|---|
| පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | ශල්‍යතන්ත්‍ර පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | කායචිකිත්සාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | පංචකර්ම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | ආයුර්වේද ආයතන කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව |
| | ආයුර්වේද ආයතන කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය |
| | කායචිකිත්සා පිළිබඳ විද්‍යාපති උපාධිය |

## 9. විශ්වවිද්‍යාලය පිරිනමන බාහිර පාඨමාලා

| පීඨය/ඒකකය/මධ්‍යස්ථානය | පාඨමාලාව |
|---|---|
| දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය | ජෛව වෛද්‍ය තාක්ෂණ උපකරණ පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව |
| | එක් දින වැඩමුළුව – වෙබ් අඩවි සංවර්ධනය පිළිබඳ වැඩමුළුව |
| | සෞඛ්‍ය සංචාරක කර්මාන්තය සඳහා සම්බාහන මධ්‍යස්ථාන කළමනාකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව |
| | උසස් විශ්ලේෂණ සහ අණුක ජෛව විද්‍යා උපකරණ පිළිබඳ ඩිප්ලෝමාව |

## 10. ආරම්භ කළ නව පාඨමාලා විස්තර - 2023

| පීඨය (FIHST) | පාඨමාලාව | මාධ්‍යය | සහතිකපත්‍ර/ ඩිප්ලෝමා | උපාධි | පශ්චාත් උපාධි ඩිප්ලෝමා | ශාස්ත්‍රපති | දර්ශනපති | ආචාර්ය උපාධිය |
|---|---|---|---|---|---|---|---|---|
| තාක්ෂණ අධ්‍යයන අංශය | ජෛව වෛද්‍ය උපකරණ පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව | ඉංග්‍රීසි | උසස් සහතිකපත්‍ර | - | - | - | - | - |
| දේශීය සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන අංශය | සෞඛ්‍ය සංචාරක කර්මාන්තය සඳහා සම්බාහන මධ්‍යස්ථාන කළමනාකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව | ඉංග්‍රීසි | උසස් සහතිකපත්‍ර | - | - | - | - | - |
| දේශීය වෛද්‍ය සම්පත් පිළිබඳ අධ්‍යයන අංශය | උසස් විශ්ලේෂණ සහ අණුක ජෛව විද්‍යා උපකරණ පිළිබඳ ඩිප්ලෝමාව | ඉංග්‍රීසි | ඩිප්ලෝමා | - | - | - | - | - |



## 11. දේශීය ශිෂ්‍යයින්ගේ විස්තර - 2023

| පීඨයේ නම | උපාධි වැඩසටහන | මාධ්‍යය | 2022 බඳවා ගැනීම | ශිෂ්‍යයින් 1 වැනි වසර (2021/ 2022) | 2 වැනි වසර (2020/ 2021) | 3 වැනි වසර (2019/ 2020) | 3 වැනි වසර (2018/ 2019) | 4 වැනි වසර (2017/ 2018) | 5 වැනි වසර (2016/ 2017) |
|---|---|---|---|---|---|---|---|---|---|
| දේශීය වෛද්‍ය විද්‍යා පීඨය | ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය | ඉංග්‍රීසි | 176 | 71 | 82 | 112 | 95 | 88 | 102 |
| දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය | ජෛව වෛද්‍ය තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යා ගෞරව විද්‍යාවේදී උපාධිය | ඉංග්‍රීසි | 50 | 49 | 44 | - | - | - | - |
| | සෞඛ්‍ය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය | ඉංග්‍රීසි | 50 | 49 | 59 | - | - | - | - |
| | යෝග සහ පාරමනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | ඉංග්‍රීසි | 50 | 57 | 64 | - | - | - | - |
| | සෞඛ්‍ය සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | ඉංග්‍රීසි | 50 | 47 | 38 | - | - | - | - |
| | දේශීය ඖෂධ තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය | ඉංග්‍රීසි | 50 | 39 | 44 | - | - | - | - |
| | දේශීය වෛද්‍ය සම්පත් පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | ඉංග්‍රීසි | 50 | 19 | 20 | - | - | - | - |
| දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය | දේශීය දැනුම පිළිබඳ සාමාජීය අධ්‍යයන පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | ඉංග්‍රීසි | 50 | 39 | 59 | - | - | - | - |

## 12. 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා ශිෂ්‍යයින්ගේ විස්තර

| පීඨයේ නම | උපාධි වැඩසටහන | එකඟ වූ බඳවා ගැනීම | ලියාපදිංචි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| දේශීය වෛද්‍ය විද්‍යා පීඨය | ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය | 176 | 77 |
| දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය | ජෛව වෛද්‍ය තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යා ගෞරව විද්‍යාවේදී උපාධිය | 50 | 60 |
| | සෞඛ්‍ය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය | 50 | 55 |
| | යෝග සහ පාරමනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | 50 | 64 |
| | සෞඛ්‍ය සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | 50 | 38 |
| | දේශීය ඖෂධ තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය | 50 | 47 |
| | දේශීය වෛද්‍ය සම්පත් පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | 50 | 22 |
| දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය | දේශීය දැනුම පිළිබඳ සාමාජීය අධ්‍යයන පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | 50 | 46 |

## 13. උපාධිධාරී නිමැවුම - 2023

| පීඨයේ නම | උපාධි වැඩසටහන | උපාධිය ලබා ගත් ශිෂ්‍යයින් සංඛ්‍යාව |
|---|---|---|
| දේශීය වෛද්‍ය පීඨය | ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය (2018/2019 අතිරේක) | 15 |
| | ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය (2019/2020 වාර්ෂික)* | 49 |
| | ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය (2019/2020 අතිරේක)* | 14 |
| එකතුව | | **78** |

* මෙම ප්‍රතිඵල 2024.01.12 වැනි දින නිකුත් කරන ලදී.



## 14. පශ්චාත් උපාධිධාරී නිමැවුම - 2023

| පීඨයේ නම | උපාධි වැඩසටහන | පශ්චාත් උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| පශ්චාත් අධ්‍යයන පීඨය | පංචකර්ම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 08 |
| | කායචිකිත්සා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 13 |
| | ශල්‍යතන්ත්‍ර පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 02 |
| | ආයුර්වේද ආයතන කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය | 02 |



## 15. මානව සම්පත් සහ ශිෂ්‍යයින් පිළිබඳ විස්තර - 2023

| පීඨයේ නම | උපාධි වැඩසටහන | මුළු ශිෂ්‍යයින් | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මුළු පරිපාලන කාර්ය මණ්ඩලය | මුළු අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|---|---|
| දේශීය වෛද්‍ය විද්‍යා පීඨය | ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය | 550 | 34 | 01 | - | 22 |
| දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය | ප්‍රථම උපාධි වැඩසටහන් හයක් | 529 | 31 | 01 | - | 07 |
| දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය | දේශීය දැනුම පිළිබඳ සාමාජීය අධ්‍යයනය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | 98 | 09 | 01 | - | 01 |
| පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | පශ්චාත් උපාධි වැඩසටහන් හයක් | 344 | - | 01 | - | 02 |
| | එකතුව | **1521** | **74** | **04** | **-** | **32** |

# 16. ශිෂ්‍ය කටයුතු

**16.1 ප්‍රථම උපාධි අපේක්ෂකයින් සඳහා නේවාසිකාගාර පහසුකම් - 2023**

**16.2 ශිෂ්‍යාධාර/ මහපොළ ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව - 2023**





# 16. ශිෂ්‍ය කටයුතු

## 16.1 ප්‍රථම උපාධි අපේක්ෂකයින් සඳහා නේවාසිකාගාර පහසුකම් - 2023

| නේවාසිකාගාරයේ නම | හිමිකාරත්වය | ධාරිතාව | | පහසුකම් සැලසූ සංඛ්‍යාව (2023 දෙසැම්බර් 31 වැනි දිනට) | |
|---|---|---|---|---|---|
| | | පිරිමි | කාන්තා | පිරිමි | කාන්තා |
| වික්‍රමාරච්චි නේවාසිකාගාරය | විශ්වවිද්‍යාලීය | - | 158 | - | 158 |
| සෙනෙවිරත්න නේවාසිකාගාරය | පෞද්ගලික | 41 | - | 41 | - |
| සමගි මාවත නේවාසිකාගාරය | පෞද්ගලික | 38 | - | 38 | - |
| පරාක්‍රම නේවාසිකාගාරය | පෞද්ගලික | - | 57 | - | 57 |
| මහවිට නේවාසිකාගාරය | පෞද්ගලික | 18 | - | 04 | - |
| කරුණානායක නේවාසිකාගාරය | පෞද්ගලික | - | 45 | - | 22 |
| තිස්ස නේවාසිකාගාරය | පෞද්ගලික | 42 | - | 42 | - |
| නදීෂා නේවාසිකාගාරය | පෞද්ගලික | - | 49 | - | 48 |
| සමර නේවාසිකාගාරය | පෞද්ගලික | - | 52 | - | 48 |
| නිශ්ශංක නේවාසිකාගාරය | පෞද්ගලික | 04 | 20 | 02 | 16 |
| | එකතුව | **143** | **381** | **127** | **349** |

## 16.2 ශිෂ්‍යාධාර/ මහපොළ ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව - 2023

| පීඨය | මහපොළ | ශිෂ්‍යාධාර |
|---|---|---|
| දේශීය වෛද්‍ය විද්‍යා පීඨය | 149 | 188 |
| දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය | 140 | 295 |
| දේශීය සමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය | 23 | 53 |
| එකතුව | **312** | **536** |

# 17. මානව සම්පත්

## 17.1 2023.12.31 දිනට සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය, අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය, විධායක කාර්ය මණ්ඩලය, පුස්තකාල කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර



# 17. මානව සම්පත්

## 17.1 2023.12.31 දිනට සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය, අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය, විධායක කාර්ය මණ්ඩලය, පුස්තකාල කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

| සේවා කාණ්ඩය | වැටුප් කේතය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| **ප්‍රාථමික මට්ටම** | | | | |
| ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු | UPL - 1 | 50 | 31 | 19 |
| ප්‍රාථමික ශ්‍රේණිය - අර්ධ පුහුණු | UPL - 2 | 09 | 04 | 02 |
| ප්‍රාථමික ශ්‍රේණිය - පුහුණු | UPL - 3 | 17 | 18 | 02 |
| **ද්විතීය මට්ටම** | | | | |
| කළමනාකරණ සහකාර – තාක්ෂණික නොවන | U-MN 1 | 69 | 40 | 07 |
| මාණ්ඩලික සහකාර/අධිපන්ති සහ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර | U-MN 4 | | 28 | |
| කළමනාකරණ සහකාර - තාක්ෂණික* | U-EX 1<br>U-MT 1 | 20 | 09 | 05 |
| ආශ්‍රිත නිලධාරීන් - 2 වැනි කාණ්ඩය | U-MN 2 | 02 | 02 | 00 |
| ආශ්‍රිත නිලධාරීන් - 1 වැනි කාණ්ඩය | U-MN 3 | 02 | 02 | 00 |
| **ද්විතීය මට්ටම** | | | | |
| ශාස්ත්‍රීය සහායක - 2 වැනි කාණ්ඩය | U-AS 1 | 01 | 01 | 00 |
| කණිෂ්ඨ විධායක / කළමනාකරුවන්* | U-EX 1 | 12 | 06 | 06 |
| ශාස්ත්‍රීය සහායක - 1වැනි කාණ්ඩය | U-AS 2 | 05 | 02 | 03 |
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | |
| වෛද්‍ය නිලධාරී | U-MO 1 | 02 | 00 | 02 |
| ප්‍රධාන වෛද්‍ය නිලධාරී | U-MO 2 | | | |
| මැදි පෙළ විධායක නිලධාරීන් | U-EX 2 | 06 | 06 | 00 |
| මැදි පෙළ විධායක නිලධාරීන් | U-EX 2(a) | | | |
| **ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්** | U-EX 3 | 02 | 02 | 00 |
| **කථිකාචාර්ය** | U-AC 3 | 82 | 79 | 03 |
| **ආශ්‍රිත මහාචාර්යවරු** | U-AC 4 | | | |
| **මහාචාර්ය/ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය** | U-AC 5 | | | |
| | **එකතුව** | **279** | **230** | **49** |

මෙම ආකෘතියේ UPL 2 හි විද්‍යාගාර සහායක පිළිබඳ සේවක සංඛ්‍යා කිහිපයක් UGC චක්‍රලේඛ 975 (දරන්නාට පෞද්ගලික වන ලෙස පදනම) අනුව UPL 3 කාණ්ඩයේ ඇතුළත් කර ඇත. තව ද කළමනාකරණ සහායක/තාක්ෂණික නිලධාරීන් අනුමත සේවක සංඛ්‍යාව UMN 1/ UMT 1 හි සිටින නමුත් දැනට සිටින සේවක සංඛ්‍යාව UMN 4 කාණ්ඩයේ ඇතුළත් කර ඇත.

# 18. පර්යේෂණ සහ සංවර්ධනය

**18.1** පර්යේෂණ කවුන්සිලය
**18.2** පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර
**18.3** ලැබූ සම්මාන පිළිබඳ විස්තර





# 18. පර්යේෂණ සහ සංවර්ධනය

## 18.1 පර්යේෂණ කවුන්සිලය

**ඉලක්කය**

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය පර්යේෂණවල විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම පිණිස 2021 වසරේ ජූලි මාසයේ දී පර්යේෂණ කවුන්සිලය ස්ථාපිත කරන ලදී. කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ වෘත්තීය ජීවිතයේ විවිධ අදියරවල දී ඔවුන් දිරිමත් කිරීම සහ පර්යේෂණ සොයා ගැනීම් ජාතික සහ ගෝලීය වශයෙන් බෙදාහැරීම පර්යේෂණ කවුන්සිලයේ ක්‍රියාකාරකම්වල ඉලක්කය වේ.

**දැක්ම**

දේශීය සම්පත් පදනම සඳහා වටිනාකම් එකතු කිරීම සඳහා විශ්ෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානයක් වීම.

**මෙහෙවර**

දැනුම වැඩිදියුණු කිරීම සහ දේශීය සම්පත් හරහා මනුශ්‍ය සංහතියේ සුභසිද්ධිය පිණිස ජාතික සංවර්ධනය සඳහා කැපීපෙනෙන දායකත්වයක් දැක්වීම සඳහා පර්යේෂණ අංශය තුළින් විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම.

**පර්යේෂණ කවුන්සිලයේ සංයුතිය**

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ උපකුලපති පර්යේෂණ කවුන්සිලයේ විධායක සභාපති වේ.

පර්යේෂණ කවුන්සිලය පහත දැක්වෙන සාමාජිකයින්ගෙන් සමන්විත වේ:

අ) අධ්‍යක්ෂ - පර්යේෂණ කවුන්සිලය
ආ) සියලුම පීඨවල පීඨාධිපතිවරු
ඇ) පීඨ පර්යේෂණ සම්බන්ධීකාරකවරු
ඈ) ලේඛකාධිකාරී
ඉ) පුස්තකාලයාධිපති
ඊ) මූල්‍යාධිකාරී
උ) විශ්වවිද්‍යාල පාලක සභාව නම් කළ එක් නිලධරයෙක්
ඌ) සනාතන සභාව නම් කළ එක් නිලධරයෙක්
එ) උපකුලපති නම් කළ නිලධාරීන් තිදෙනෙක්
ඒ) විශ්වවිද්‍යාල වෙබ්මාස්ටර්
ඔ) ආචාරධර්ම සමාලෝචන කමිටුවේ නියෝජිතයෙක්

පර්යේෂණ කවුන්සිලයේ අධ්‍යක්ෂ සහ ලේකම් උපකුලපති විසින් පත් කරනු ලබයි.

## වැඩමුළු සහ වෙබිනාර් සම්මන්ත්‍රණ

### වැඩමුළු





| වැඩමුළුවේ නම | සම්පත්දායක | දිනය/වේලාව/ ස්ථානය | සහභාගීවූවන් |
|---|---|---|---|
| පර්යේෂණ ප්‍රදාන සඳහා යෝජනා ඇගයීම් පිළිබඳ විශේෂ නේවාසික වැඩසටහන | -වෛද්‍ය බී.ජේ.සී. පෙරේරා - ළමා රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය<br><br>-වෛද්‍ය ඉනෝකා සඳනායක - විද්‍යා නිලධාරී, පර්යේෂණ අංශය, ජාතික විද්‍යා පදනම<br><br>-මනුජ කරුණාරත්න මහතා - ප්‍රධාන තොරතුරු නිලධාරී, ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථාන ප්‍රධානී, ජාතික විද්‍යා පදනම | 2023 ඔක්තෝබර් 11 සහ 12<br><br>පෙ.ව. 09.00 - 05.00<br><br>හෙක්ටර්කොබ්බෑකඩුව කෘෂි පර්යේෂණ සහ පුහුණු ආයතනයේ දී. | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින් |

### වෙබිනාර් සම්මන්ත්‍රණ

| වෙබිනාර් සම්මන්ත්‍රණයේ නම | සම්පත්දායක | දිනය/වේලාව/ ස්ථානය | සහභාගීවූවන් |
|---|---|---|---|
| මෙන්ඩෙලී විමර්ශන කළමනාකරණ මෘදුකාංගය සමඟ ග්‍රන්ථ නාමාවලි සංවිධානය කිරීම සහ උපුටා ගැනීම් කළමනාකරණය කිරීම | එම්.පී.පී. දිල්හානි මිය<br>ජ්‍යෝෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති<br>වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය (PGIM)<br>කොළඹ විශ්වවිද්‍යාලය | 2023 පෙබරවාරි 02<br><br>පෙ.ව. 02.00 – පෙ.ව. 04.00<br><br>සූම් තාක්ෂණය හරහා | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින් |

### රිසර්ච්ගේට් සහ ගූගල් විද්වත් උපුටා ගැනීමේ ගිණුම් - 2023

2023.12.31 වැනි දිනට එක් එක් පීඨයේ රිසර්ච්ගේට් සහ ගූගල් විද්වත් උපුටාගැනීම් ගිණුම් පිළිබඳ සාරාංශ විස්තර පහත දැක්වේ.

| පීඨය | 2023/12/31 දිනට |
|---|---|
| **දේශීය වෛද්‍ය විද්‍යා පීඨය** | |
| ගූගල් විද්වත් උපුටා ගැනීමේ පැතිකඩ | 32 (94%) |
| රිසර්ච්ගේට් ගිණුම් | 31 (91%) |
| **දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය** | |
| ගූගල් විද්වත් උපුටා ගැනීමේ පැතිකඩ | 29 (97%) |
| රිසර්ච්ගේට් ගිණුම් | 29 (97%) |
| **දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය** | |
| ගූගල් විද්වත් උපුටා ගැනීමේ පැතිකඩ | 09 (100%) |
| රිසර්ච්ගේට් ගිණුම් | 09 (100%) |

## 18.2 පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

### දේශීය වෛද්‍ය විද්‍යා පීඨය

| | ප්‍රකාශන කාණ්ඩය | | සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | දේශීයව ප්‍රකාශ කළ | විදේශීයව ප්‍රකාශ කළ |
| 1 | විද්‍යුත්-වාරසඟරා ඇතුළු යොමු කළ සුවිගත වාරසඟරාවල ප්‍රකාශන සංඛ්‍යාව | | - | 23 |
| 2 | විද්‍යුත්-වාරසඟරා ඇතුළු යොමු කළ සුවිගත නොකළ වාරසඟරාවල ප්‍රකාශන සංඛ්‍යාව | | - | 07 |
| 3 | සම්මන්ත්‍රණ කාර්යසටහන් | 3.1 සම්පූර්ණ ලිපි ලෙස ප්‍රකාශ කළ ලිපි සංඛ්‍යාව | - | 11 |
| | | 3.2 උද්‍යත ප්‍රකාශන සංඛ්‍යාව | 21 | 83 |
| 4 | ග්‍රන්ථ පරිච්ඡේද ප්‍රකාශන සංඛ්‍යාව | | - | - |
| 5 | විශේෂඥ ක්ෂේත්‍රවල ප්‍රකාශයට පත් කළ ග්‍රන්ථ/ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව | 5.1 ප්‍රකාශකයෙක් මගින් | 02 | - |
| | | 5.2 කර්තෘ මගින් | - | - |

### දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය

| | ප්‍රකාශන කාණ්ඩය | | සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | දේශීයව ප්‍රකාශ කළ | විදේශීයව ප්‍රකාශ කළ |
| 1 | විද්‍යුත්-වාරසඟරා ඇතුළු යොමු කළ සුවිගත වාරසඟරාවල ප්‍රකාශන සංඛ්‍යාව | | - | 04 |
| 2 | විද්‍යුත්-වාරසඟරා ඇතුළු යොමු කළ සුවිගත නොකළ වාරසඟරාවල ප්‍රකාශන සංඛ්‍යාව | | 02 | 01 |
| 3 | සම්මන්ත්‍රණ කාර්යසටහන් | 3.1 සම්පූර්ණ ලිපි ලෙස ප්‍රකාශ කළ ලිපි සංඛ්‍යාව | 03 | 04 |
| | | 3.2 උද්‍යත ප්‍රකාශන සංඛ්‍යාව | 10 | 20 |
| 4 | ග්‍රන්ථ පරිච්ඡේද ප්‍රකාශන සංඛ්‍යාව | | 04 | - |
| 5 | විශේෂඥ ක්ෂේත්‍රය තුළ ප්‍රකාශයට පත් කළ ග්‍රන්ථ/ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව | 5.1 ප්‍රකාශකයෙක් මගින් | - | - |
| | | 5.2 කර්තෘ මගින් | 02 | - |

## දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය

| | ප්‍රකාශන කාණ්ඩය | | සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | දේශීයව ප්‍රකාශ කළ | විදේශීයව ප්‍රකාශ කළ |
| 1 | විද්‍යුත්-වාරසඟරා ඇතුළු යොමු කළ සුවිගත වාරසඟරාවල ප්‍රකාශන සංඛ්‍යාව | | 01 | - |
| 2 | විද්‍යුත්-වාරසඟරා ඇතුළු යොමු කළ සුවිගත නොකළ වාරසඟරාවල ප්‍රකාශන සංඛ්‍යාව | | 03 | - |
| 3 | සම්මන්ත්‍රණ කාර්යසටහන් | 3.1 සම්පූර්ණ ලිපි ලෙස ප්‍රකාශ කළ ලිපි සංඛ්‍යාව | 02 | - |
| | | 3.2 උද්‍යත ප්‍රකාශන සංඛ්‍යාව | 15 | 01 |
| 4 | ග්‍රන්ථ පරිච්ඡේද ප්‍රකාශන සංඛ්‍යාව | | 01 | 01 |
| 5 | විශේෂඥ ක්ෂේත්‍රය තුළ ප්‍රකාශයට පත් කළ ග්‍රන්ථ/ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව | 5.1 ප්‍රකාශකයෙක් මඟින් | 01 | - |
| | | 5.2 කර්තෘ මඟින් | 01 | - |

## 18.3 ලැබූ සම්මාන පිළිබඳ විස්තර

**<u>සනාතන සභා ගෞරව සම්මාන (2023.05.04 දින ප්‍රදානය කළ)</u>**

| නම | පීඨය | සම්මානයේ විස්තරය |
|---|---|---|
| ආචාර්ය ටී.එච්.එන්.ආර්.ටී. හේවගේ | දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය | ඉහළ ගුණාත්මක පර්යේෂණ පැවැත්වීම සහ 2023 වර්ෂයේ දී අන්තර්ජාතික සුවිගත වාරසඟරාව රෝයල් සොසයිටි බී ෆිලෝසොෆිකල් ට්‍රාන්සැක්ෂන්ස් හි ප්‍රකාශනයට පත් කිරීම<br>වෙළුම 378, නිකුත්ව 1871,<br>DOI:10.1098/rstb.2022.0033 |

**<u>උපකුලපති සම්මාන (2023 වර්ෂයේ දී ප්‍රදානය කළ)</u>**

| සම්මාන කාණ්ඩය | සම්මානලාභීන්ගේ නම | පීඨය |
|---|---|---|
| 2022 වර්ෂය සඳහා වූ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ සිටින වඩාත්ම කැපීපෙනෙන වෘත්තීය ආරම්භ පර්යේෂකයා | වෛද්‍ය එස්.එච්.කේ. දීප්තිකා මහත්මිය | කෞමාරභෘත්‍ය සහ ස්ත්‍රීරෝග අධ්‍යයන අංශය,<br>දේශීය වෛද්‍ය විද්‍යා පීඨය |
| 2022 වර්ෂය සඳහා වූ **දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ** සිටින වඩාත්ම කැපී පෙනෙන වෘත්තීය ආරම්භ පර්යේෂකයා | වෛද්‍ය එස්.එච්.කේ. දීප්තිකා මහත්මිය | කෞමාරභෘත්‍ය සහ ස්ත්‍රීරෝග අධ්‍යයන අංශය,<br>දේශීය වෛද්‍ය විද්‍යා පීඨය |



**<u>ලැබූ සම්මාන පිළිබඳ විස්තර</u>**

| පීඨය | සම්මානලාභීන්ගේ නම | සම්මාන කාණ්ඩය | සම්මානයේ නම | ජාතික/ අන්තර්ජාතික | සම්මානය පිළිබඳ විස්තරය | සම්මානලාභියාගේ නම සහ රට |
|---|---|---|---|---|---|---|
| දේශීය වෛද්‍ය | වෛද්‍ය යූ.ඩී. විතානාච්චි | සෞඛ්‍ය සහ මානසික සෞඛ්‍ය | සැසියේ විශිෂ්ටතම ඉදිරිපත් කරන්නා | අන්තර්ජාතික | සෞඛ්‍ය සහ මානසික සෞඛ්‍ය | ශ්‍රී ලංකාව |
| | වෛද්‍ය එන්.එස්. ගුණසේකර | ගෝලීය සෞඛ්‍ය | විශිෂ්ටතම නිබන්ධන ඉදිරිපත් කිරීම සඳහා වූ සම්මානය | අන්තර්ජාතික | ගෝලීය සෞඛ්‍ය | භූග්මභූමි පර්යේෂණ මධ්‍යස්ථානය - නේපාලය |
| | වෛද්‍ය එන්.එස්. ගුණසේකර | පශ්චාත් උපාධිය | විශිෂ්ටතම ශිෂ්‍යයා සඳහා වූ ජාතික සම්මානය | අන්තර්ජාතික | ආයුර්වේදයේ අනාගතය 2050 | ආයුර්වේද ගුරුවරුන්ගේ සංගමය |
| දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ | ආචාර්ය ඩී.ඒ.එන්. ඩී. දරණගම | | UBL පර්යේෂණ ප්‍රදානය | ජාතික | - | |
| | ආචාර්ය ඩී.ඒ.එන්. ඩී. දරණගම | | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදානය | ජාතික | - | |
| | බී.අයි. කසුරි බාලසූරිය | | UBL පර්යේෂණ ප්‍රදානය | ජාතික | - | |
| | ඩී.එම්.සී. දිසානායක | | විශිෂ්ටතම පත්‍රිකා සම්මානය (InCIT 2023-IEEE, තායිලන්තය) | අන්තර්ජාතික | - | |
| | ආචාර්ය ටී.අයි.එන්.ආර්.ටී. හේවගේ | සුවිගත වාරසඟරා ප්‍රකාශනය | සනාතන සභා සම්මානය | ජාතික | සනාතන සභා සම්මානය | GWUIM |
| | ශිෂ්‍යයින්, IMR සම්මාන 3 | SLAAS | | ජාතික | පළමු ස්ථානය- විශිෂ්ටතම වීඩියෝව, රසායන විද්‍යා ප්‍රශ්න | විද්‍යාවේ දියුණුව සඳහා වූ ශ්‍රී ලංකා සම්මානය |



## 19. වෙනත් ඒකක සහ මධ්‍යස්ථාන

**19.1** පණ්ඩිත ජී.පී. වික්‍රමාරච්චි අනුස්මරණ පුස්තකාලය
**19.2** ශාරීරික අධ්‍යාපන ඒකකය
**19.3** වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය
**19.4** කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
**19.5** වෛද්‍ය මධ්‍යස්ථානය
**19.6** තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය
**19.7** මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මධ්‍යම විද්‍යාගාරය
**19.8** ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය/සමානාත්මතාව සඳහා මධ්‍යස්ථානය (CGEE)
**19.9** සමාජ සංහිඳියා මධ්‍යස්ථානය (SRC)
**19.10** තත්ත්ව සහතික මධ්‍යස්ථානය (CQA)
**19.11** ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ මධ්‍යස්ථානය (ELTC)
**19.12** මාධ්‍ය සහ මුද්‍රණ අංශය
**19.13** අන්තර්ජාතික මධ්‍යස්ථානය
**19.14** විශ්වවිද්‍යාල ව්‍යාපාර සබැඳිය







## 19.1 පණ්ඩිත ජී.පී. වික්‍රමාරච්චි අනුස්මරණ පුස්තකාලය




**පසුබිම් තොරතුරු**

විශ්වවිද්‍යාලයේ ආයුර්වේදය, දේශීය වෛද්‍ය ක්‍රමය, වෛද්‍ය විද්‍යා, සෞඛ්‍ය විද්‍යාව සහ වෙනත් ආශ්‍රිත විෂයන් පිළිබඳ ශික්ෂණය, ඉගෙනුම සහ පර්යේෂණ යන ප්‍රධාන කුළුණු ත්‍රිත්වය සඳහා අවශ්‍ය සම්පත් සම්පාදනය මෙම පුස්තකාලයේ ප්‍රධාන පරමාර්ථයන් වේ. පුස්තකාලය මඟින් විශිෂ්ට සහ නවෝත්පාදන පුස්තකාල සේවාවන් සහ නිපැයුම් සම්පාදනය සහ ප්‍රවර්ධනය හරහා මෙම පරමාර්ථ අත්කර ගනු ඇත. මෙයට අමතරව, දුරස්ථ ප්‍රවේශය සහ පුස්තකාල කාර්යයන් ස්වයංක්‍රීයකරණය ඇතිව ඉලෙක්ට්‍රොනික සම්පත් වැඩිවශයෙන් ප්‍රදානය කිරීමට අපේක්ෂා කරනු ලබන අතර සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාවගේ ප්‍රතිලාභය සඳහා වඩාත් කාර්යක්ෂම සහ ඵලදායී පුස්තකාල සේවා සපයනු ඇත. ඉහත සඳහන් කළ පරමාර්ථ සාක්ෂාත් කර ගනු පිණිස, පුස්තකාලය එහි ග්‍රන්ථ එකතුව, පොත් බැහැරදීමේ අංශය, උපලේඛණගත යොමු අංශය, ස්ථිර යොමු අංශය සහ දුර්ලභ ග්‍රන්ථ එකතුව ලෙස සංවිධානගත කර ඇත.

පුස්තකාල එකතුවට සිංහල, ඉංග්‍රීසි, සංස්කෘත, පාලි, හින්දි සහ බෙංගාලි භාෂාවලින් ප්‍රකාශයට පත් කළ 34,000කට අධික ශාස්ත්‍රීය නිබන්ධන අන්තර්ගත වේ. මෙම එකතුවට පැල් කොළ මත ලියන ලද අත්පිටපත් කිහිපයක් ද ඇතුළත් වේ. පුස්තකාලයේ ඇති සියලුම ග්‍රන්ථ සම්මත වර්ගීකරණ ක්‍රමයක් වන ඩේවි දශම වර්ගීකරණ ක්‍රමය (Dewey Decimal Classification System) අනුව වර්ගීකරණය කර සකසා ඇති අතර ඇන්ග්ලෝ-ඇමෙරිකානු නාමාවලි රීති (AACR-2 R) අනුකූලව වර්ගීකරණය කර ඇත. මෙම එකතුව කොහා ඒකාබද්ධ පුස්තකාල කළමනාකරණ ක්‍රමය (Koha integrated library management system) භාවිතා කරමින් පරිගණකගත කරමින ඇත. Koha යනු විවෘත-මූලාශ්‍ර මෘදුකාංග පද්ධතියකි.

**ගොඩනැගිල්ල**

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ පුස්තකාලය මහල් හතරකින් සැදුම්ලත්, පණ්ඩිත ජී. පී. වික්‍රමාරච්චි අනුස්මරණ පුස්තකාල ගොඩනැගිල්ලේ පිහිටුවා ඇත. එය උසස් අධ්‍යාපන අවශ්‍යතාවන් සපුරාලීම පිණිස එම මට්ටමට සංවර්ධනය කරමින් ඇත.

**පුස්තකාල දිශානති**

a) නවක ශිෂ්‍යයින් සඳහා පුස්තකාල දිශානති වැඩසටහන් පවත්වන ලදී.

b) අධ්‍යයන සාමාජිකයින් ඇතුළු පර්යේෂණ ප්‍රජාව සඳහා පර්යේෂණ දෘශ්‍යතාව සහ විශිෂ්ට ගුණාත්මක වාරසඟරා සහ කොල්ලකාරී වාරසඟරා හඳුනා ගැනීම පිළිබඳව දැනුවත් කිරීමේ සැසි පවත්වන ලදී.

**පර්යේෂණ සහ ප්‍රකාශන**

වෛද්‍ය ආර්.ඩී.ඒ. තිස්ස - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති

| ක්ෂේත්‍රය | දායකත්වය |
|---|---|
| අ. (ii) යොමුගත සුවිගත නොකළ වාරසඟරාවල පළකිරීම් | තිස්ස, ආර්. ඩී. ආනන්ද (2023), **ධනවාදී පංති විෂමතා ග්‍රහණ පාරිභෝගික සමාජයේ කැඩපතක් බඳු තෘෂ්ණාභරණ නවකතාවේ සමාජ හා දේශපාලන දර්ශනය,** පානදුර : 306 1 සිංහ සමාජය, පි. 17-18 |
| | තිස්ස, ආර්. ඩී. ආනන්ද (2023), **ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයක් වන ලේඛනකරණය හා සම්බන්ධ වෘත්තීය නාම පුස්තකාලය සේවයේ ආරම්භයට කර ඇති බලපෑම පිළිබඳ මූලාශ්‍ර අධ්‍යයනයක්,** ප්‍රතිරාව 2, කොළඹ : ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, පි. 02 - 12 |
| | තිස්ස, ආර්. ඩී. ආනන්ද (2023), **ස්වදේශීය ආර්ථික සංවර්ධනයට හා කළමනාකරණයට අදාළ තනතුරු නාම භාවිතය පිළිබඳ විචාරාත්මක විශ්ලේෂණය,** ප්‍රතිභා විද්‍යුත් සඟරාව, වෙළුම 2, කොළඹ : ජාතික විගණන කාර්යාලය, පි. 13-21 |
| ආ. සම්මන්ත්‍රණ/ පරිසංවිධානවල ඉදිරිපත් කිරීම (i) සාරාංශයක් ලෙස පළ කිරීම | සංස්කෘත විශ්වකෝෂ පුස්තකාල සහ තොරතුරු විඥාපන විෂයමාලාවේ සංවර්ධනයට ඇති බලපෑම අධ්‍යයනය **(පිටුව 132)**<br>ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ භාෂා සහ සංස්කෘතික අධ්‍යයන පීඨයේ භාෂා අධ්‍යයන අංශය මඟින් සංවිධානය 2023 දෙසැම්බර් 20 වැනි දින සංවිධානය කළ "වඩාත් යහපත් ලෝකයක් සඳහා සංස්කෘත විවිධ විෂයයන්" තේමාව යටතේ සංස්කෘත පිළිබඳ ICS 2023 අන්තර්ජාතික සම්මන්ත්‍රණය |
| (ii) සම්පූර්ණ ලිපියක් ලෙස පළ කරන ලද | **නක්ෂත්‍රය ආශ්‍රිත පාරිභාෂික ශබ්ද පිළිබඳ දේශීය දැනුම පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක්** (පිටුව **19-29)**<br>කැළණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලයේ 1වැනි මේස පර්යේෂණ සම්මන්ත්‍රණයේ කාර්යසටහන්, “ද්විතීය තොරතුරු සම්පත්වලින් වටිනා දැනුම ලබා ගැනීම” ශ්‍රී ලංකා කැළණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලය මඟින්2023 දෙසැම්බර් 06 වැනි දින පවත්වන ලදී. |
| ඉ. වාරසඟරා/ ග්‍රන්ථ සංස්කරණය (ii) සංස්කාරක මණ්ඩල සාමාජික/ අවම වශයෙන් වසරකට දෙවරක් පළ කරනු ලබන වාරසඟරාවල සමාලෝචක | ශ්‍රී ලංකා පුස්තකාල සමාලෝචන මණ්ඩලයේ සාමාජික (SLLR) |
| | ශ්‍රී ලංකා වෘත්තීය සංගම් සංවිධානයේ (OPA) වාරසඟරා කමිටුවේ සමාලෝචක සාමාජික |
| | පේරාදෙණිය පුස්තකාල එකතුවේ ශතවර්ෂ වෙළුම (1921-2021) |
| | කැළණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලය මගින් සංවිධානය කරනු ලැබූ 1 වැනි මේස පර්යේෂණ සම්මන්ත්‍රණයේ කාර්යසටහන්වල සමාලෝචක සාමාජික. |
| ඊ. (iii) GWUIM ප්‍රාග්ධන ප්‍රදානයෙන් ලැබූ අරමුදල් | තිස්ස, ආර්. ඩී. ආනන්ද, සංජීවනී, එච්. ඩබ්ලිව්. කුසල් සහ දුල්ෂාන්, ශ්‍රී ලංකාවේ සාමාජීය ආර්ථික සංවර්ධනය සඳහා දේශීය දැනුම් පද්ධති (IKS) එක්රැස් කිරීම: සාම්ප්‍රදායක වාරි කර්මාන්තය සහ ජල කළමනාකරණ ක්‍රම පිළිබඳ විශේෂ යොමුවක් ඇති අධ්‍යයනයකි |

| ක්ෂේත්‍රය | දායකත්වය |
|---|---|
| වැඩමුළු දේශීය | කළුතර පළාත් පාලන සහ නගර සභා දෙපාර්තමේන්තුව මඟින් 2023 අගෝස්තු 29 වැනි දින බස්නාහිර පළාතේ පළාත් පාලන පුස්තකාල සඳහා කළුතර පුස්තකාලයේ ශ්‍රවණාගාරයේ දී සංවිධානය කළ "ඒකතු කළමනාකරණය සහ පුස්තකාල ගෘහ පාලනය" පිළිබඳ වැඩමුළුවේ සම්පත් දායකයෙක් ලෙස කටයුතු කරන ලදී. |
| | හොරණ පළාත් පාලන සහ නගර සභා දෙපාර්තමේන්තුව මඟින් 2023 සැප්තැම්බර් 05 වැනි දින පොකුණුවිට මහජන පුස්තකාලයේ දී සංවිධානය කළ "ජාතික පුස්තකාල කියැවීම් මාසයේ ලේඛන සකස් කිරීම, පුස්තකාල පොත් බැහැර කිරීම, ග්‍රන්ථ සංරක්ෂණය සහ සුරැකීම සිදු කරන්නේ කෙසේ ද" පිළිබඳ වැඩමුළුවේ සම්පත් දායකයෙක් ලෙස කටයුතු කරන ලදී. |
| | ජාතික අධ්‍යාපන ආයතනය මඟින් 2023 නොවැම්බර් 25 වැනි දින පවත්වන ලද "ග්‍රන්ථ වර්ගීකරණය: ඩිවි දශම වර්ගීකරණය" පිළිබඳ පාසැල් පුස්තකාල සහ පුස්තකාල කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ වැඩමුළුවේ වැඩමුළුවේ සම්පත් දායකයෙක් ලෙස කටයුතු කරන ලදී. |
| | ජාතික අධ්‍යාපන ආයතනය මඟින් 2023 දෙසැම්බර් 12 වැනි දින පවත්වන ලද "ග්‍රන්ථ වර්ගීකරණය: ඩිවි දශම වර්ගීකරණය" පිළිබඳ පාසැල් පුස්තකාල සහ පුස්තකාල කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ වැඩමුළුවේ වැඩමුළුවේ සම්පත් දායකයෙක් ලෙස කටයුතු කරන ලදී. |
| පුහුණු වැඩසටහන් දේශීය | GWUIM හි දේශීය වෛද්‍ය පීඨයේ පර්යේෂණ කමිටුව මඟින් 2023 ජූලි 06 වැනි දින සූම් තාක්ෂණය හරහා සංවිධානය කළ 'Iතොරතුරු සෙවීම සහ තොරතුරු සදාචාරාත්මක භාවිතය'Ä වෛද්‍ය ජී. ආර්. පද්මසිරි සමඟ |
| | GWUIM හි දේශීය වෛද්‍ය පීඨයේ පර්යේෂණ කමිටුව මඟින් 2023 ජූලි 27 වැනි දින සූම් තාක්ෂණය හරහා එච්. ඩබ්ලිව්. කේ. එස්. පුෂ්පකාන්ති සමඟ සංවිධානය කළ 'වාරසඟරාවල පළ කිරීම සහ ඇගයීම'. |
| | **තොරතුරු දැන ගැනීමේ පනත, බුද්ධිමය දේපළ පනත හා ශ්‍රී ලංකා පුස්තකාල සංගම් පනත පිළිබඳ දේශනය, රජයේ පුස්තකාලයාධිපති සේවයේ නිලධාරීන් සඳහා** 2023.08.31 වන දින සංවිධාන, ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය |
| ආරාධිත දේශක වෙබිනාර් අන්තර්ජාතික | ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් 2023 ජුනි 26 වැනි දින පවත්වන ලද පුස්තකාල සහ විඥාපන විද්‍යාව පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණය (ICLIS) – 2023 |
| ආරාධිත දේශක වෙබිනාර් | **ප්‍රවීණ පුස්තකාලයාධිපති මහාචාර්ය වී. බ. දොරකුඹුර 92 වන ජන්ම දින සැමරුම**, 2023.10.03 වන දින රාත්‍රි 08.00-10.00 සූම් තාක්‍ෂණය යටතේ, සංවිධානය තොරතුරු හා මහජන සම්බන්ධතා කමිටුව, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය |
| | **ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ආරම්භය හා විකාශනය**, 2023.12.12 වන දින රාත්‍රි 08.00-10.00 සූම් තාක්‍ෂණය යටතේ, තොරතුරු හා මහජන සම්බන්ධතා කමිටුව, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය |
| ආරාධිත දේශක රූපවාහිනී වැඩසටහන | **ශ්‍රී ලංකාවේ ලේඛන සංරක්‍ෂණය හා දේශීය සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදාය ආරක්‍ෂා කිරීමට භික්‍ෂූන් වහන්සේලාගෙන් වූ සේවාව**<br>මහාචාර්ය කොත්ගස්තැන්නේ ආනන්ද හිමි<br>**ආචාර්ය ආර්. ඩී. ආනන්ද තිස්ස**<br><br>ඓතිහාසික බුද්ධංගල රජමහා විහාරස්ථානයේ සිට සජීවී විකාශය (පස්වරු 02.00-04.00) විකාශයඃ සියත රූපවාහිනිය, අමාවැස්ස වැඩසටහන, 2023.03.06 වන මැදින් පුන් පොහෝ දින දී ය. |
| | **ජනතාව කියවීමෙන් ඈත්වෙලා ද?**<br>**ආචාර්ය ආර්. ඩී. ආනන්ද තිස්ස**<br>සුගත් ගුණතිලක<br><br>විකාශය ඃ ස්වර්ණ රූපවාහිනිය, 7 වන පැය වැඩසටහන සජීවී විකාශය (පෙරවරු 07.00-08.00) 2023.0629 වන දින දී ය. |

| | |
|---|---|
| ආරාධිත දේශක ගුවන්විදුලි වැඩසටහන | **තිරසාර සංවර්ධනය සඳහා දේශීය දැනුම**<br>ජනරාවය ගුවන්විදුලි ශාස්ත්‍රීය සංග්‍රහය, ස්වදේශීය සේවය, (91.7/91.9) 2023.02.22 දින පෙරවරු 09.00 - 10.00<br>උපකුලපති මහාචාර්ය රංජන වික්‍රම සෙනෙවිරත්න<br>**ආචාර්ය ආර්. ඩී. ආනන්ද තිස්ස**<br><br>(ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය විවෘත කර වසර දෙකක් සම්පූර්ණ වීම නිමිත්තෙනි) |
| සංගීත වීඩියෝ | ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ තේමා ගීතය රචනා කිරීම |
| වාර්තාමය නිෂ්පාදන | SLLA ප්‍රතිගාමී පරාවර්තනය<br>ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ වසර 63ක ගමන්මඟ සහ ශ්‍රී ලංකාවේ පුස්තකාල සේවා පිළිබඳ වීඩියෝ වැඩසටහනක් සඳහා තිර රචනය ලිවීම සහ වාර්තා කිරීම.<br>(කියවීම සඳහා වාර්තාමය වැඩසටහන මේ සමඟ අමුණා ඇත) |

The launching ceremony of the magazine, "...
The launching ceremony of the first issue of the second volume of the quarterly magazine,...
Navachandi and Dhanvantari Homam Puja...
We are thrilled to announce that the
Public
None
Copyright
5 Sept 2023
22 Aug 2023
17 Aug 2023
3 Aug 2023
3 Aug 2023
Published


Studio
Search across your channel
CREATE
Videos
Shorts
Live
Posts
Playlists
Podcasts
Promotions
Filter
Video
Visibility
Restrictions
Date
Views
Comments
Likes (vs dislikes)
Your channel
University of Indigenous Medicine
Dashboard
Content
Analytics
Comments
Subtitles
Copyright
Earn
Customisation
Settings
Send feedback
Navachandi and Dhanvantari Homam Puja...
Robowars 2023 intro
GWUIM NEWS
Add description
Public
None
3 Aug 2023
4 Jul 2023
31 Mar 2023
3 Mar 2023
13 Feb 2023
2 Dec 2022
Published

# මුහුණුපොත (Facebook) වැඩිදියුණු කිරීම









## උපාධි අපේක්ෂක ශිෂ්‍ය දේශන සඳහා වීඩියෝපට







## ඉදිරි වර්ෂයේ දී සිදු කිරීමට සැලසුම් කර ඇති ක්‍රියාකාරකම්

විශ්වවිද්‍යාලයක මාධ්‍ය සහ මුද්‍රණ ඒකකය ඉදිරි වර්ෂය සඳහා සිදු කිරීමට අපේක්ෂා කරන ක්‍රියාකාරකම් එකී ආයතනයේ ඉලක්ක සහ ප්‍රමුඛතාවන් අනුව වෙනස් වේ. කෙසේවුව ද, මෙම ඒකකය මඟින් සිදු කළ හැකි සැලසුම් කර ඇති කටයුතු කිහිපයක් පහතින් විස්තර කර ඇත:

i. **පුළුල් කළ උත්සව ආවරණය:** දේශන, වැඩමුළු, සහ සංස්කෘතික උත්සව ඇතුළු විශ්වවිද්‍යාලයේ පවත්වනු ලබන උත්සව අවස්ථාවන් ඡායාරූපගත කිරීම සහ වීඩියෝ වාර්තාගත කිරීම හරහා ආවරණය කිරීම ඉහළ නැංවීම.

ii. **සමාජ මාධ්‍ය කටයුතු ඉහළ නැංවීම:** වර්තමාන ශිෂ්‍යයින්, අනාගත ශිෂ්‍යයින්, ආදි ශිෂ්‍යයින් සහ පුළුල් මහජනතාව සමඟ ගනුදෙනු කිරීම පිණිස මුහුණුපොත, ට්විටර්, ඉන්ටග්‍රෑම් සහ යූ ටියුබ් ඇතුළු සක්‍රීය සමාජ මාධ්‍ය නාලිකා තවදුරටත් සංවර්ධනය කිරීම.

iii. අන්තර්ගතය නිර්මාණය කිරීම: ශාස්ත්‍රීය පර්යේෂණ, ශිෂ්‍ය ජයග්‍රහණ, පීඨ විශේෂඥතා සහ විශ්වවිද්‍යාල ජීවිතය ආදිය ප්‍රදර්ශනය කිරීම පිණිස වීඩියෝ, ඉන්ෆෝග්‍රැෆික්ස්, සහ බ්ලෝග් පෝස්ට් වැනි ඉහළ ගුණාත්මක බහුමාධ්‍ය අන්තර්ගතය නිෂ්පාදනය කිරීම.

iv. **සජීවී විකාශනය:** ආරම්භක උත්සව, ආරාධිත දේශන, සහ මණ්ඩල සාකච්ඡා පුළුල් ප්‍රේක්ෂක පිරිසක් වෙත ප්‍රචාරණය කිරීම සඳහා සජීවී විකාශන හැකියාවන් ව්‍යාප්ත කිරීම.

v. **මාධ්‍ය පුහුණුව:** විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ගේ සහ කාර්ය මණ්ඩලයේ ඵලදායී සන්නිවේදන, මාධ්‍ය සම්බන්ධතා සහ ප්‍රසිද්ධ කථා පැවැත්වීමේ කුසලතා වැඩිදියුණු කිරීම පිණිස මාධ්‍ය පුහුණු වැඩමුළු සංවිධානය කිරීම.

vi. **ප්‍රකාශන නිර්මාණය:** විශ්වවිද්‍යාලයේ ජයග්‍රහණ සහ මුල්පිරීම් ඉස්මතු කිරීම සඳහා අත්පත්‍රිකා, පුවත්හසුන්, වාර්ෂික වාර්තා වැනි දෘශ්‍යමය වශයෙන් ආකර්ෂණීය ප්‍රකාශන නිර්මාණය කර නිෂ්පාදනය කිරීම.

vii. **හවුල්කාරීත්වයන්:** විශ්වවිද්‍යාලයේ පණිවුඩය ප්‍රචාරය කිරීමට සහ පුළුල් ප්‍රේක්ෂකයන් පිරිසක් වෙත ලඟාවීමට දේශීය මාධ්‍ය සංවිධාන, කර්මාන්ත සංවිධාන සහ ප්‍රජා කණ්ඩායම් සමඟ හවුල්කාරත්වයන් ඇති කර ගැනීම.

viii. **සංරක්ෂණය කිරීම:** ආයතනික ඉතිහාසය සුරක්ෂිත කිරීම සහ අනාගත ප්‍රවර්ධන ව්‍යායාම සඳහා විශ්වවිද්‍යාලයේ ඡායාරූප සහ වීඩියෝ ලේඛනාගාරය අඛන්ඩව පවත්වාගෙනයාම සහ නඩත්තු කිරීම.

ix. **ප්‍රේක්ෂක සහභාගීත්වය:** තරඟ සංවිධානය කිරීම, ප්‍රශ්න විචාර වැඩසටහන් සහ සජීවී සංවාද වැනි සමාජ මාධ්‍ය වේදිකාවල ප්‍රේක්ෂක සහභාගීත්වය සහ අන්තර්ක්‍රියාකාරීත්වය ඉහළ නැංවීම සඳහා උපායමාර්ග ක්‍රියාත්මක කිරීම.

x. **ඇගයීම සහ විශ්ලේෂණය:** ප්‍රේක්ෂක ප්‍රවේශය, නියැලීමේ අනුපාත, ප්‍රතිපෝෂණ සමීක්ෂණ වැනි ප්‍රමිතික හරහා මාධ්‍ය සහ ප්‍රකාශන ප්‍රයත්නවල සඵලතාවය නිතිපතා තක්සේරු කිරීම සහ ඒ අනුව උපාය මාර්ග සකස් කිරීම.

මෙම ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කිරීමෙන්, මාධ්‍ය සහ ප්‍රකාශන ඒකකයට විශ්වවිද්‍යාලයේ දෘශ්‍යතාව, කීර්තිය සහ එහි විවිධ පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වීම ඉහළ නැංවීමට දායක විය හැකිය.

## 19.13 ගම්පහ වික්‍රමාරච්චි අන්තර්ජාතික මධ්‍යස්ථානය (GWIC)

### හැඳින්වීම

වර්තමාන සන්දර්භය තුළ, ඕනෑම උසස් අධ්‍යාපන ආයතනයකට (HEI) ගෝලීය තලයේ සැලකිය යුතු පිළිගැනීමක් ලබා ගැනීමට මූලික වී ඇති ශක්තිමත් ජාත්‍යන්තර සහයෝගීතාවයක් අවශ්‍ය වේ. ශ්‍රී ලංකා ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලයේ (GWUIM) දැක්ම සහ මෙහෙවර සමඟ සමගාමීව විවිධ විදේශීය විශ්වවිද්‍යාල, පර්යේෂණ මධ්‍යස්ථාන, ජාත්‍යන්තර සංවිධාන සහ වාණිජ ආයතන සමඟ නව ගෝලීය සම්බන්ධතා ඇති කර ගැනීම නිසැකවම දේශීය වෛද්‍ය විද්‍යාව, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ, සහ දේශීය සමාජ විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන යන ශ්‍රී ලාංකික වසම් ජාත්‍යන්තර තලයට ප්‍රවර්ධනය සඳහා විශාල විභවයන් සඳහා දොරටු විවර කරනු ඇත. එම පිළිගැනීම ආයතනික මට්ටමින් පමණක් නොව සිසුන්, කථිකාචාර්යවරුන්,

පර්යේෂකයන් සහ විශ්ව විද්‍යාල සන්නාම සංවර්ධනය පිළිබඳ දෘෂ්ටිකෝණයන්හි දී ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලයේ සමස්ත ක්‍රියාකාරිත්වය සඳහා අතිශයින්ම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම සන්දර්භය තුළ, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලයේ අන්තර්ජාතික මධ්‍යස්ථානය සහයෝගී පර්යේෂණ ප්‍රවර්ධනය, කාර්ය මණ්ඩල/ ශිෂ්‍ය හුවමාරුව, සංස්කෘතික හුවමාරුව, අරමුදල් අවස්ථා සහ ප්‍රදාන ගවේෂණය කිරීම, ආයතනික/ අධ්‍යයන හවුල්කාරිත්වයන් සඳහා පහසුකම් සැලසීම, ජාත්‍යන්තර සිසුන් ආකර්ෂණය කර ගැනීම සඳහා වූ විවිධ මාර්ගගත/ නොබැඳි අධ්‍යයන වැඩසටහන් සහ පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සමඟ ජාත්‍යන්තර සම්බන්ධතා ගොඩනැගීමේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

### දැක්ම

අන්තර්ජාතික සහයෝගය ව්‍යාප්ත කිරීම සඳහා දොරටුවක් බවට පත්වීම

### මෙහෙවර

දේශීය දැනුම් සාරධර්මවලට නිසි ගෞරවය සුරක්ෂිත කරන අතරතුර අන්තර්ජාතික සහයෝගීතා ප්‍රවර්ධනය කිරීම, විවිධ සංස්කෘතීන් පිළිබඳ අවබෝධය වැඩිදියුණු කිරීම සහ ශිෂ්‍යයින්ගේ ගෝලීය පුරවැසිභාවය සවිබලගැන්වීම සඳහා මූලාරම්භ ක්‍රියාත්මක කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

### පරමාර්ථ

- ලෝකය පුරා විශ්වවිද්‍යාල සහ විවිධ ආයතන සමඟ අන්තර්ජාතික පර්යේෂණ සහ ශාස්ත්‍රීය සහයෝගය ප්‍රවර්ධනය කිරීම.
- විදේශ භාෂාවලින් සන්නිවේදනය කිරීමේ කුසලතා ක්ෂේත්‍රවල අන්තර්ජාතික පුහුණු වැඩසටහන් සහ වැඩමුළු සඳහා පහසුකම් සැලසීම.
- දේශීයකරණයේ සාරධර්ම වැඩිදියුණු කරමින් ගෝලීය සන්දර්භයක් තුළ සුරක්ෂිත කර ඇති දේශීය දැනුම හුවමාරු කිරීම.
- විවිධ ජනකොට්ඨාස අතර වෙනස් සංස්කෘතික වටිනාකම්වලට ගරු කරන පුද්ගලයෙක් පෝෂණය කරන සාරධර්ම පාදක අධ්‍යාපනයක් හරහා ගෝලීයකරණය පිළිබඳ අවබෝධය වැඩිදියුණු කිරීම.

### අපගේ ආයතනික ව්‍යුහය



**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලයේ අන්තර්ජාතික මධ්‍යස්ථානය පහසුකම් සැලසූ/ ක්‍රියාත්මත කළ ක්‍රියාකාරකම් – 2023**

| දිනය | ක්‍රියාකාරකම |
|---|---|
| 21-04-2022 | රුසියාවේ මහජනතාවගේ මිත්‍ර විශ්වවිද්‍යාලය සමඟ මාර්ගගත රැස්වීම (RUDN විශ්වවිද්‍යාලය, රුසියාව) |
| 06-06-2022 | යකොව්ලෙව් ෂුවාෂ් රාජ්‍ය අධ්‍යාපන විශ්වවිද්‍යාලය සමඟ මාර්ගගත රැස්වීම (ChSPU, රුසියාව) |
| 22-10-2022 | APAC සිනර්ජි (චීනය) සමඟ මාර්ගගත රැස්වීම |
| 17-11-2022 | යන්කා කුපාලා ග්‍රොඩ්නෝ රාජ්‍ය විශ්වවිද්‍යාලය සමඟ මාර්ගගත රැස්වීම (YKSUG, බෙලරුස්) |
| 29-12-2022 | රුසියාවේ ඉන්නොපොලිස් විශ්වවිද්‍යාලය සමඟ මාර්ගගත රැස්වීම |
| 30-12-2022 | ජපානයේ සිට පැමිණි ජපන් නියෝජිත කණ්ඩායම සමඟ පැවති හමුව<br>ශිෂ්‍යයින් 4 සහ "ස්පයිස් අප්" සහ ජපන් විදේශ වෙළඳ සංවිධානයේ (JETRO) නිලධාරීන් GWUIM හි සංචාරය කළහ. ඔවුන් සමඟ පැවති හමුව පළ කරන ලදී : https://www.jetro.go.jp/biz/areareports/2023/a02cca8ea93dd608.html |
| 06-01-2023 | බ්‍රසීල විශ්වවිද්‍යාලවල අන්තර්ජාතික සහයෝගීතා කණ්ඩායම සමඟ පැවති මාර්ගගත රැස්වීම (GCUB, බ්‍රසීලය) |
| 09-01-2023 | ගොමෙල් රාජ්‍ය වෛද්‍ය විශ්වවිද්‍යාලය සමඟ පැවති මාර්ගගත රැස්වීම (GSMU, බෙලරුස්) |
| 25-01-2023 | යුරාල් ෆෙඩරල් විශ්වවිද්‍යාලය සමඟ පැවති රැස්වීම (UrFU. රුසියාව) |
| 27-01-2023 | ජපානයේ සිට පැමිණි ජපන් දූත පිරිස සමඟ පැවති හමුව<br>තොරතුරු කර්මාන්තයේ ප්‍රධාන විධායක නිලධාරී GWUIM හි සංචාරය කළේය. තාක්ෂණික ශිෂ්‍යයින් සඳහා ආධුනිකත්ව පුහුණුවක් ලබා ගැනීමේ හැකියාව පිළිබඳව සාකච්ඡා කරන ලද අතර ඒකාබද්ධ පර්යේෂණ හැකියාවන් පිළිබඳව ද සාකච්ඡා විය. |
| 01-02-2023 | ලක්නව්, කුන්වාර් ග්ලෝබල් පාසැලෙන් පැමිණි ඉන්දියානු නිලධාරී පිරිස |
| 03-02-2023 | ශ්‍රී ලංකා, AIESEC සමඟ පවත්වන ලද රැස්වීම. AIESEC නිලධාරීන් දෙදෙනෙක් GWUIM හි සංචාරය කළහ. |
| 14-02-2023 | කුස්ක් රාජ්‍ය වෛද්‍ය විශ්වවිද්‍යාලය සමඟ පවත්වන ලද මාර්ගගත රැස්වීම (KSMU, රුසියාව) |
| 13-03-2023 | චුවාෂ් නියෝජිත පිරිස/ ඉවාන් යකොව්ලෙව් රුසියානු සංස්කෘතික මධ්‍යස්ථානය විවෘත කිරීම |
| 15-03-2023 | බෙලරුස් රාජ්‍ය වෛද්‍ය විශ්වවිද්‍යාලය සමඟ පැවති මාර්ගගත රැස්වීම (BSMU, බෙලරුස්) |
| 20-03-2023 | උරල් ෆෙඩරල් විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම (UrFU, රුසියාව) |
| 21-03-2023 | උරල් ආර්ථික විද්‍යාව පිළිබඳ රාජ්‍ය විශ්වවිද්‍යාලය සමඟ මාර්ගගත රැස්වීම (USUE, රුසියාව) |
| 29-03-2023 | එන්රික් ජෝෂ් වරෝනා අධ්‍යාපන විද්‍යා විශ්වවිද්‍යාලය සමඟ මාර්ගගත රැස්වීම (UCPEJV, කියුබාව) |
| 07-04-2023 | වොල්ගා පරිපාලන ආයතනය සමඟ පැවති මාර්ගගත රැස්වීම (RANEPA, රුසියාව) |
| 02-05-2023 | කුස්ක් රාජ්‍ය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ නියෝජිත පිරිස (KSMU, රුසියාව) |
| 15-06-2023 | ChSPU සිට පැමිණි නියෝජිත පිරිස, රුසියාව |
| 31-07-2023 | රුසියානු තානාපතිවරයා GWUIM හි සිදු කළ සංචාරය. |
| 25-01-2024 | මැලේසියානු අන්තර්ජාතික සංස්කෘතික සන්නිවේදන මධ්‍යස්ථානය සමඟ පැවති මාර්ගගත රැස්වීම (ICCCM) |

## 2023 වර්ෂයේ දී අපගේ වැඩසටහන්වලින් ලැබූ ප්‍රතිලාභ සහ ඉඩප්‍රස්ථා

2023 වර්ෂයේ දී, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලයේ අන්තර්ජාතික මධ්‍යස්ථානය එම විශ්ව විද්‍යාලයේ ගෝලීය හවුල්කාරිත්වයන් පෝෂණය කිරීමට සහ හරස් සංස්කෘතික හුවමාරු වැඩි දියුණු කිරීමට උපකාරී වී ඇත. රුසියාවේ RUDN විශ්වවිද්‍යාලය, යකොව්ලෙව් චුවාෂ් රාජ්‍ය අධ්‍යාපනික විශ්වවිද්‍යාලය මෙන්ම බෙලරුස්, බ්‍රසීලය සහ කියුබාව වැනි රටවල විශ්ව විද්‍යාල සමඟ සහයෝගීතාවයෙන් යුත් ප්‍රමුඛ ආයතන සමඟ උපායමාර්ගික මැදිහත්වීම් මාලාවක් හරහා අපි අපගේ ජාලය පුළුල් කර ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වටිනා අවස්ථා නිර්මාණය කර ඇත්තෙමු. මෙම මුල පිරීම් ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලයේ සමෘද්ධිමත් රුසියානු මධ්‍යස්ථානයක් පිහිටුවීමට පමණක් නොව සති 6 ක කඩිනම් රුසියානු භාෂා පුහුණු පාඨමාලාවක් සාර්ථකව සංවිධානය කිරීම වැනි බලපෑම් සහගත ප්‍රතිඵලවලට ද හේතු වී ඇති අතර, TRFL පරීක්ෂණයට සහභාගිවූවන් 50 දෙනෙකුට A1 මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගැනීමට හැකි වේ. තවද, කර්මාන්ත නායකයින් සහ රුසියාව, බෙලරුස්, ජපානය සහ ඉන්දියාවේ නියෝජිතයින් සමඟ සිදු කළ අපගේ නියැලීම් අපගේ සිසුන්ගේ සහ පීඨ සාමාජිකයින්ගේ අධ්‍යයන අත්දැකීම් පොහොසත් කරමින් සීමාවාසික වැඩසටහන්, ඒකාබද්ධ පර්යේෂණ ව්‍යායාම සහ සංස්කෘතික හුවමාරු සඳහා දොරටු විවර කර ඇත. ChSPU වෙතින් රුසියානු මධ්‍යස්ථානය වෙත සිදු කළ ගෘහ භාණ්ඩ සහ උපකරණ පරිත්‍යාග කිරීම GWIC ජාත්‍යන්තර මධ්‍යස්ථානය විසින් පෝෂණය කරන ලද ධනාත්මක රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිළිබඳ සාක්ෂියක් වන අතර, අපගේ වැඩසටහන් 2023 වර්ෂය තුළ දී ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලයට ලබා දී ඇති ස්පර්ශ්‍ය ප්‍රතිලාභ සහ අවස්ථා ප්‍රදර්ශනය කරයි. එම රුසියානු සහ බෙලරුස් හවුල්කාරිත්වයන් සැලකීමේ දී රුසියානු සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ තානාපති අසාමාන්‍ය සහ පූර්ණ බලධාරි ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිත අබේවික්‍රම ලියනගේ විසින් පිරිනමන අඛණ්ඩ සහයෝගය ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලයේ අන්තර්ජාතික මධ්‍යස්ථානය මඟින් කෘතඥතාපූර්වකව සිහිපත් කරමු.

### කාර්ය මණ්ඩලය

- අධ්‍යක්ෂ
- සම්බන්ධීකාරක - ජාත්‍යන්තර සහයෝගය
- සම්බන්ධීකාරක - වැඩසංවිධානය
- සම්බන්ධීකාරක - ශිෂ්‍ය කටයුතු
- සම්බන්ධීකාරක - මුදල්
- සහකාර සම්බන්ධීකාරක - ජාත්‍යන්තර සහයෝගය











## 19.14 විශ්වවිද්‍යාල ව්‍යාපාර සබැඳිය (UBL)

### හැඳින්වීම

විශ්ව විද්‍යාල යනු දැනුම, පර්යේෂණ, නවෝත්පාදන සහ නවීන තාක්ෂණයේ ප්‍රමුඛයින් වෙයි. අති නවීන පර්යේෂණවල නියැලෙන කැපවීමෙන් යුත්, විවිධ වූ සහ පරිණත පර්යේෂකයන් කණ්ඩායම ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලය (GWUIM) සතු ප්‍රධාන ශක්තියකි. එබැවින්, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලය පර්යේෂණ සහ නවෝත්පාදන මත පදනම් වූ ශාස්ත්‍රීය සංස්කෘතියක් නිර්මාණය කිරීමට උත්සාහ කරන අතර පර්යේෂණ ප්‍රතිඵල මහජන භාවිතය සඳහා ප්‍රයෝජනවත් නිෂ්පාදන සහ සේවා බවට පත් කළ යුතු බවටත් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමෙන් මිනිසුන්ට ප්‍රතිලාභ ලබා දිය යුතු බවටත් අපේක්ෂා කරයි. ඉහත සඳහන් කළ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා විශ්ව විද්‍යාලයේ පර්යේෂණ ප්‍රතිඵල කර්මාන්ත හා ව්‍යාපාර වෙත පැවරීම අත්‍යවශ්‍ය වේ. මෙම පසුබිම යටතේ, විශ්වවිද්‍යාල ව්‍යාපාර සබැඳි (UBL) කුටිය ස්ථාපිත කිරීම උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ව්‍යාපෘතියේ අනුග්‍රහය ඇතිව ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය තුළ අංක 10/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ක්‍රියාවට නැංවීම සඳහා අත්‍යවශ්‍ය පියවරකි. ඇත්ත වශයෙන්ම, විශ්වවිද්‍යාල ව්‍යාපාර සබැඳි (UBL) කුටිය ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ තාක්ෂණ හුවමාරු කාර්යාලය (TTO) ලෙස ක්‍රියා කරයි. UBL-GWUIM විශ්ව විද්‍යාල නවෝත්පාදනයන් ආරක්ෂා කිරීම, කළමනාකරණය කිරීම සහ වාණිජකරණයට පහසුකම් සපයන අතර මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා පර්යේෂණ ප්‍රතිඵල වෙළඳපොළට ගෙන ඒමට සහාය වේ.

### දැක්ම

ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ විශ්වවිද්‍යාල ව්‍යාපාර සබැඳි (UBL) කුටියේ දැක්ම වන්නේ; අධ්‍යාපනික පුහුණුව සහ සහයෝගීතාවය තුළින් ආරම්භකයින්, ශිෂ්‍යයින් සහ දැනට සිටින ව්‍යවසායකයින් දිරිමත් කිරීම, සම්බන්ධ කිරීම, දිරිගැන්වීම සහ සහාය වීමයි.

**මෙහෙවර**

ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලයේ විශ්වවිද්‍යාල ව්‍යාපාර සබැඳි (UBL) කුටියේ මෙහෙවර වන්නේ ප්‍රවේශ්‍යතාව, සේවාවේ ගුණාත්මකභාවය, ඉඩප්‍රස්ථාවල සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම සහ නව නිපැයුම්කරුවෙකු හෝ ව්‍යවසායකයෙකු වීම පිණිස ශිෂ්‍යයින්ට ආරක්ෂිත සහ අනුග්‍රාහක පරිසරයක් ලබා දීමයි. සේවා සපයන්නෙකු වීම, අපගේ උපාධිධාරීන්ට දේශීය, ජාතික සහ ජාත්‍යන්තර වෙළඳපොළ තුළ අදාළව සිටීමට උපකාර කිරීම සඳහා අපගේ ඉලක්ක නිතිපතා තක්සේරු කිරීමේ සහ පිරිපහදු කිරීමේ අවශ්‍යතාවය තවදුරටත් හඳුනා ගනී.

**පරමාර්ථ**

- ව්‍යහාර සහ ව්‍යාපාර කේන්ද්‍රීය ශිෂ්‍ය ව්‍යාපෘති ගොඩනැගීම සහ ව්‍යාපාර සඳහා පුහුණු සහ පුහුණු කිරීමේ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම
- ගනුදෙනුකරුවන්ගේ ව්‍යාපාර පිරිනැමීම් සඳහා සහාය වන විශේෂඥ සහ විශේෂඥ සේවා සපයන ව්‍යාපාර සඳහා (තාක්ෂණික) උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම; ව්‍යාපාර සැලසුම් සංවර්ධනය, ඇගයීම, සමාලෝචනය, සැලසුම් පිරික්සීම යනාදී පරීක්ෂණ සහ ප්‍රමිතිකරණය සහ වෙනත් අගය එකතු කළ ආධාරක
- විශ්ව විද්‍යාලයේ අධ්‍යයන පර්යේෂණවලින් හෝ සේවාලාභීන් විසින් පත් කරන ලද පරිදි හෝ විශ්වවිද්‍යාල ඉල්ලුම මත පදනම් වූ සංවර්ධිත පර්යේෂණ ලෙසින් පැන නගින නව බුද්ධිමය දේපළ (IP) ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ විශ්වවිද්‍යාලයේ නවෝත්පාදන නිර්මාණය කිරීම ප්‍රවර්ධනය කිරීම.
- වසායකයින්ගේ නව මූලාරම්භයන් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් වෙළඳපොළට ඇතුළත් කරවීම සඳහා අනුග්‍රහය දැක්වීම පිණිස පර්යේෂණ සහ උපදේශන කටයුතුවලට සම්බන්ධ වීම, දේශීය වෛද්‍ය විද්‍යාව සහ අනෙකුත් ක්ෂේත්‍රවල නව නිපැයුම් සඳහා සහය වීම සහ ව්‍යාපාර සහ විශ්වවිද්‍යාලය අතර පර්යේෂණ සහයෝගය ප්‍රවර්ධනය කිරීම.
- විශ්වවිද්‍යාලයේ පර්යේෂණ යටිතලපහසුකම් සහ ධාරිතා සංවර්ධනය කිරීම පිණිස පෞද්ගලික අංශය සමඟ උපායමාර්ගික සබඳතා ප්‍රවර්ධනය කිරීම.
- GWUIM ප්‍රජාවට ඉඩප්‍රස්ථාවන් ලබාදීම සඳහා GWUIM ව්‍යාපාර අංශයක් ස්ථාපිත කිරීම.
- දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය තුළ විශිෂ්ට ව්‍යවහාර හුවමාරු කර ගැනීම සඳහා සංසදයක් නිර්මාණය කිරීම.
- දේශීය ඖෂධ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සඳහා GWUIM අනුමත කිරීමක් ලබාදීම.
- දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා බාහිර ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.
- දේශීය වෛද්‍ය විද්‍යාව - කර්මාන්තය අතර සහයෝගීතාව සඳහා මාර්ගෝපදේශ, ප්‍රමිති සහ චර්යා සංග්‍රහයන් සකස් කිරීම.
- දේශීය වෛද්‍ය විද්‍යාව - විශ්වවිද්‍යාල සහයෝගීතාව සිතියම්ගත කිරීම සඳහා වෙබ් අඩවි වේදිකා නිර්මාණය කිරීම.

**කාර්ය මණ්ඩල තනතුරු**

UBL අධ්‍යක්ෂවරයා

UBL කළමනාකරු

**විශ්වවිද්‍යාල ව්‍යාපාර සබැඳිය 2023 වර්ෂය තුළ පවත්වන ලද විශේෂ වැඩසටහන්.**

| වැඩසටහනේ නම | සහභාගීවූවන් |
|---|---|
| 1. ව්‍යවසායකයින්ගේ, ආයෝජකයින්ගේ, කුඩා හා විශාල ව්‍යාපාරවල සම්බන්ධතා ජාලයක් ගොඩනැගීම | 1.1 පස්යාල හෙළ ඔසු<br>1.2 වික්‍රමාරච්චි ඖෂධ<br>1.3 හෙට්ටිගොඩ ඉන්ඩස්ට්‍රීස්<br>1.4 ඩාර්ලි බට්ලර් සමාගම සහ සුවසෙත හෙළ ඔසු සමාගම<br>1.5 උමන්දාව<br>1.6 නෙෆ්කා ඔස්ට්‍රේලියා<br>1.7 බාබෙරියන් බීච් ආයුර්වේද රිසෝට්<br>1.8 හේමාස් හෝල්ඩින්ග්ස් පීඑල්සී |
| 2. ආයුර්වේද කලාපය | 2.1 ආයුර්වේද කලාපයක් ක්‍රියාත්මක කිරීම සඳහා GWUIM හි අභ්‍යන්තර සාමාජිකයින් සහ කර්මාන්තයේ බාහිර සාමාජිකයින් සමඟ සාකච්ඡා කිරීම. |
| 3. පර්යේෂකයින් සහ කර්මාන්ත හවුල්කරුවන් අතර සම්බන්ධතා ඇතිකරවීම | 3.1 මා (MAA) නිෂ්පාදන<br>3.2 ඩාර්ලි බට්ලර් සමාගම සහ සුවසෙත හෙළ ඔසු සමාගම<br>3.3 ඔරෙල් ඉලෙක්ට්‍රොනික්ස්/ ඔරෙල් සමාගම |
| 4. වාණිජකරණ ව්‍යායාම තුළ සිටින අනෙකුත් (AHEAD නොවන) ප්‍රදාන ලැබූවන්ට අනුග්‍රහය දැක්වීම | 4.1 වාණිජකරණ ව්‍යායාම තුළ සිටින අනෙකුත් (AHEAD නොවන) ප්‍රදාන ලැබූවන්ට අනුග්‍රහය දැක්වීමේ අරමුණ ඇතිව AYU පෞද්ගලික සමාගම සමඟ සාකච්ඡා කිරීම. |
| 5. අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම | 5.1 ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය මා නිෂ්පාදන (පුද්) සමාගම සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරයි. |
| 6. UBL අරමුදල් සම්පාදක පර්යේෂණ ව්‍යාපෘති | 6.1 GWUIM ප්‍රථම උපාධි අපේක්ෂකයින්/ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා සම්පූර්ණයෙන්ම UBL අරමුදල් සම්පාදනය කරන ලද පර්යේෂණ ව්‍යාපෘති 09ක් පිරිනමන ලදී. |
| 7. නවෝත්පාදන හෙළිදරව් කිරීමේ ආකෘතිපත්‍ර (IDF) භාරදීම | 7.1 GWUIM හි UBL මඟින් විවිධ අධ්‍යයන අංශවල පර්යේෂකයින් සඳහා IDF ආකෘතිපත්‍ර සකස් කිරීම සහ ගොනු කිරීමට සහාය ලබා දෙයි. |
| 8. පර්යේෂකයින් විසින් දැනුවත් කිරීමේ වැඩසටහන් දිරිමත් කිරීම සහ පහසුකම් සැලසීම | 8.1 ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ ශිෂ්‍ය පර්යේෂණ කේන්ද්‍රය, විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර සබැඳි කුටි සමඟ සහයෝගීත්වය ඇතිව නවෝත්පාදකයින්, ප්‍රදාන ලැබූවන් සහ පර්යේෂකයින් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වයි. |



හේමාස් හෝල්ඩින්ග්ස් පීඑල්සී

## වෙනත් තොරතුරු (වාර්තාකරණ කාලය: 2023-10-26 සිට 2024-01-17)

### I. වෙබ් අඩවි සහ මාර්ගගත ව්‍යාපාර වේදිකා සංවර්ධනය

UBL GWUIM වෙබ් අඩවිය සහ මාර්ගගත ව්‍යාපාර වේදිකා ගොඩනැගීම සිදු කරමින් පවතියි. මෙම වේදිකාව GWUIM හි නවෝත්පාදන නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීමට සහ වාණිජකරණ ව්‍යායාමවලට පහසුකම් සැලසීම සඳහා ප්‍රධාන මූලාශයක් වශයෙන් කටයුතු කරනු ඇත. සම්පූර්ණයෙන්ම නිමා කර දියත් කිරීම ඉදිරි කාර්තුව ඇතුළත සිදු කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

### II. ශිෂ්‍ය නිෂ්පාදන තෝරා ගැනීම සහ වාණිජකරණය

UBL කුටිය දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨයේ ශිෂ්‍යයින් විසින් ගොඩනඟන ලද නව නිෂ්පාදන 50ක් පමණ ඇගයීමේ කටයුතුවල නිරතව සිටී.

ඉහළම වාණිජ විභවතාවක් ඇති නිෂ්පාදන හඳුනා ගැනීම සඳහා දැඩි ඇගයීම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරනු ලැබේ. තෝරා ගත් නිෂ්පාදන මාස තුනක් ඇතුළත වෙළඳපොළට ඇතුළත් කිරීම සඳහා ඉක්මන් පියවර ගනු ඇත.

### III. GWUIM වෙළඳපොළ පරිශ්‍ර ව්‍යාපෘතිය

විශ්වවිද්‍යාල ආසන්නයේ නව වෙළඳ සංකීර්ණයක් ඉදිකරමින් ඇත. ව්‍යාපෘති යෝජනා සකස් කිරීම සහ කර්මාන්ත හවුල්කරුවෙකු තෝරා ගැනීම ද සිදුවෙමින් පවතී.

GWUIMහි ශක්තිජනක පානය වාණිජකරණය පිළිබඳව මා නිෂ්පාදන සමාගම සමඟ සිදු කරනු ලබන සාකච්ඡා ද සිදු කරමින් ඇත.

(මා නිෂ්පාදන සමඟ දැනටමත් අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත) නිෂ්පාදනය සහ වෙළඳපොළ දියත් කිරීම මාස දෙකක් ඇතුලත සිදු කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

### IV. ප්‍රධාන ජයග්‍රහණ

ශිෂ්‍යයින්ගේ නව නිෂ්පාදන 50කට අධික සංඛ්‍යාවක් වාණිජකරණය සඳහා හඳුනගෙන ඇගයීම් සිදු කරමින් ඇත. මා නිෂ්පාදන වැනි ප්‍රමුඛ පෙළේ කර්මාන්ත තරඟකරුවන් සමඟ හවුල්කාරත්ව එකඟතාවන් ස්ථාපිත කර ඇත. වෙන් වූ වෙළඳපොළ පරිශ්‍රයක් ඉදිකිරීමේ කටයුතු ද සිදු වේ.

03 වැනි අදියර කටයුතු අවසන් කර ප්‍රසම්පාදන වියදම් සැලසුම් (PEP) ලේඛන AHED ශ්‍රී ලංකා වෙත ලබාදීමට නියමිත වේ.

### V. ඉදිරි පියවර

වෙබ් අඩවිය සහ මාර්ගගත ව්‍යාපාර වේදිකා කටයුතු අවසන් කිරීම.

ඉහළ වාණිජ හැකියාවක් ඇති ශිෂ්‍යයින්ගේ නිෂ්පාදන තෝරා ගැනීම සහ වාණිජකරණය මාස තුනක් ඇතුළත සිදු කිරීම.

මා නිෂ්පාදන සමඟ හවුල්කාරීත්වයක් සඳහා වූ සාකච්ඡා අඛණ්ඩ සිදු කිරීම සහ නිෂ්පාදන සහ අලෙවිකරණ දියත් කිරීමේ කටයුතු අවසාන කිරීම.

උපරිම ඵල නෙළා ගැනීම සඳහා UBL කුටි මෙහෙයුම් සහ ව්‍යාප්තිය ප්‍රශස්ත කිරීම.

### VI. නිමාව

GWUIM හි UBL කුටි ශාස්ත්‍රීය සන්දර්භය සහ කර්මාන්තය අතර සම්බන්ධතා ගොඩනැගීම සඳහා වූ එහි ප්‍රධාන පරමාර්ථ ඉටු කර ගැනීම සම්බන්ධයෙන් කැපීපෙනෙන ප්‍රගතියක් අත්කර ගෙන ඇත. ඉදිරියේ දී සිදු කිරීමට නියමිත වෙබ් අඩවි දියත් කිරීම, කඩිනම් කළ ශිෂ්‍ය නිෂ්පාදන වාණිජකරණය, සහ නව වෙළපොළ පරිශ්‍රයක් ඉදිකිරීම දේශීය වෛද්‍ය ක්‍රමය ක්ෂේත්‍රය තුළ නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය ඉහළ නැංවීම සඳහා වූ UBL කුටියේ කැපවීම වෙනුවෙන් සාක්ෂි වේ.

මෙම වාර්තාව UBL කුටියේ වත්මන් ක්‍රියාකාරකම් සහ ජයග්‍රහණ පිළිබඳ සංක්ෂිප්ත සහ විධිමත් දළ විශ්ලේෂණයක් සපයයි. එමගින් ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දැක්ම සඳහා මෙම කුටියේ අඛණ්ඩ දායකත්වය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා දෙමින් එමඟින් ලබා ඇති ප්‍රගතියේ ප්‍රධාන ක්ෂේත්‍ර, ඉදිරි සන්ධිස්ථාන සහ මීළඟ පියවර ඉස්මතු කරයි,



ඔරෙල් ඉලෙක්ට්‍රොනික්ස් / ඔරෙල් කෝපරේෂන්

# 20. මූල්‍ය කාර්යසාධනය 2023

20.1 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

20.2 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

20.3 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්)

20.4 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උපයන ලද ආදායම)

20.5 මූල්‍ය කාර්යසාධනය විශ්ලේෂණය - 2023

20.6 එක් ශිෂ්‍යයෙක් වෙනුවෙන් පිරිවැය 2019-2023



## 20.1 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

| විෂය | 2023 (රු.) | 2022 (රු.) |
|---|---:|---:|
| සේවක පාරිශ්‍රමිකය | 489,833,756 | 496,464,241 |
| ප්‍රවාහනය | 308,458 | 209,058 |
| සැපයුම් සහ භාවිතා කළ පරිභෝජන භාණ්ඩ | 26,012,771 | 24,361,851 |
| නඩත්තුව | 23,994,105 | 13,414,386 |
| ගිවිසුම්ගත සේවා | 109,626,817 | 67,983,805 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 31,103,435 | 15,569,768 |
| ස්වයං-මූල්‍ය වැඩසටහන්වල වියදම් | 48,709,508 | 33,750,398 |
| එකතුව | **729,588,850** | **651,753,507** |

## 20.2 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

| විෂය | 2023 (රු.) | 2022 (රු.) |
|---|---:|---:|
| පුනරුත්ථාපනය සහ ප්‍රාග්ධනය වැඩිදියුණු කිරීම | 81,523,254 | 48,906,270 |
| ස්ථාවර වත්කම් අත්කර ගැනීම | 56,303,604 | 101,053,916 |
| ඉදිකිරීම් ව්‍යාපෘති | 1,900,032 | - |
| මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය | 1,233,750 | 120,000 |
| එකතුව | **140,960,640** | **150,080,186** |

## 20.3 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්)

| විෂය | 2023 දී වෙන්කිරීම් (රු.) | 2023 දී වියදම් (රු.) | ඉතුරුම්/(අතිරික්තය) (රු.) |
|---|---:|---:|---:|
| පුනරාවර්තන ප්‍රදාන | 656,500,000 | 729,588,850 | 46,018,994 |
| ආදායම්වල අභ්‍යන්තර මූලාශ්‍රය | 119,107,844 | | |
| වෙනත් ප්‍රදාන | - | - | - |
| ප්‍රාග්ධන ප්‍රදාන | 96,528,000 | 134,999,403 | (38,471,403) |
| **AHEAD** ප්‍රදාන | 5,961,237 | 5,961,237 | - |
| එකතුව | **878,097,081** | **870,549,490** | **7,547,591** |

## 20.4 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උපයන ලද ආදායම)

| ආදායම් මූලාශ්‍රය | 2023 වර්ෂයේ එකතුව (රු.) |
|---|---|
| ණය සහ අත්තිකාරම්වලින් පොලිය | 803,946 |
| විවිධ ලැබීම් | 2,027,070 |
| ආයෝජනවලින් පොලිය | 71,989,416 |
| ලියාපදිංචි ගාස්තු | 1,338,100 |
| පරීක්ෂණ ගාස්තු | 209,850 |
| පුස්තකාල දඩ | 44,439 |
| වෛද්‍ය ගාස්තු | 50,200 |
| දේපළවලින් කුලිය | 826,137 |
| තොග අලෙවිය | 166,000 |
| ස්වයං-මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ආදායම | 41,652,686 |
| එකතුව | **119,107,844** |

## 20.5 මූල්‍ය කාර්යසාධනය විශ්ලේෂණය – 2023

| විෂය | සූත්‍රය | එක් ශිෂ්‍යයෙක් සඳහා වියදම (රු.) |
|---|---|---|
| පුනරාවර්තන | පුනරාවර්තන වියදම් / මුළු ශිෂ්‍යයින් | **564,260** |

## 20.6 එක් ශිෂ්‍යයෙක් වෙනුවෙන් පිරිවැය 2019 – 2023 (මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම් ඇතුළුව)

| විශ්වවිද්‍යාලය | එක් ශිෂ්‍යයෙක් වෙනුවෙන් වියදම (රු.) | | | | |
|---|---|---|---|---|---|
| | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
| **GWUIM** | 681,810 | 713,095 | 845,881 | 621,109 | 564,260 |



# 21. මූල්‍ය ප්‍රකාශන - 2023



# ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

## 2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන


| | පිටු අංකය |
|---|---|
| 1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය | 01 |
| 2 මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය | 02 |
| 3 ශුද්ධ වත්කම්/ කොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශන | 03 |
| 4 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශන | 04 |
| 5 වැදගත් මූල්‍ය ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 05-26 |
| 6 අයවැය සහ තථ්‍ය සැසඳීම පිළිබඳ ප්‍රකාශන | 27 |

**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය**

**2023 දෙසැම්බර් මස 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

*(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් වේ)*

| විස්තරය | සටහන් | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| ජංගම වත්කම් | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 2 | 13,261,903 | 12,048,280 |
| වෙනත් ලැබිය යුතු දේ | 3 | 1,444,000 | 2,380,430 |
| ණය හා අත්තිකාරම් | 4 | 20,473,444 | 20,132,674 |
| බඩු ලේඛනය | 5 | 12,225,751 | 5,315,202 |
| පූර්ව ගෙවීම් | 6 | 565,182 | 461,678 |
| කෙටි කාලීන ආයෝජන | | 93,845,858 | 136,858,285 |
| වෙනත් ජංගම වත්කම් | 7 | 29,300,431 | 33,668,094 |
| | | **171,116,569** | **210,864,643** |
| **ආයෝජන** | | | |
| ස්ථාවර වත්කම් | | 263,734,499 | 208,845,908 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 8 | 1,043,674,588 | 729,483,767 |
| කෙරී ගෙන යන වැඩ | 9 | 9,841,118 | 159,130,818 |
| ප්‍රාග්ධන අත්තිකාරම් | | 1,290,541 | 7,048,140 |
| අස්පර්ෂණීය වත්කම් | 10 | 2,672,109 | 1,549,633 |
| වෙනත් (මානව ප්‍රාග්ධනය) | 11 | - | 221,607 |
| | | **1,321,212,855** | **1,106,279,874** |
| | | | |
| **මුලු වත්කම්** | | **1,492,329,424** | **1,317,144,517** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| සම්මුච්චිත වියදම් | 12 | 23,770,719 | 24,920,397 |
| කළ යුතු ගෙවීම් | 13 | 7,586,101 | 18,782,575 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු හා වෙනත් | 14 | 48,690,882 | 52,676,534 |
| | | **80,047,702** | **96,379,506** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 15 | 134,072,662 | 138,622,486 |
| **මුළු වගකීම්** | | **214,120,364** | **235,001,992** |
| **මුළු ශුද්ධ වත්කම්** | | **1,278,209,060** | **1,082,142,525** |
| **ශුද්ධ වත්කම්/ සමකොටස්** | | | |
| සමුච්චිත අතිරික්තය - ප්‍රාග්ධනය | | 869,400,687 | 773,969,822 |
| සමුච්චිත අතිරික්ත -නොගෙවූ | | 24,431,780 | 12,971,328 |
| සමුච්චිත අතිරික්තය -පුනරාවර්තන | | 61,677,152 | 35,476,870 |
| සීමාකළ අරමුදල් සහ ප්‍රදාන | 16 | 83,573,657 | 29,174,152 |
| ප්‍රත්‍යාගණන සංචිත හා වෙනත් | 17 | 239,125,784 | 230,550,352 |
| **මුළු ශුද්ධ වත්කම/ සම කොටස්** | | **1,278,209,060** | **1,082,142,524** |

මෙම මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ සහ වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානවල අවශ්‍යතාවන්ට අනුකූල වේ.

සී.සී.ජී. කොතලාවල
**මූල්‍යාධිකාරී**

මහාචාර්ය රංජන ඩබ්ලිව්. සෙනෙවිරත්න
**උපකුලපති**

විශ්වවිද්‍යාලයේ පාලක සභාව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වගකීම දරයි.

සිරිමල් සේනාරත්න මහතා
**පාලක සභා සාමාජික**

සුනිල් ජයලත් මහතා
**පාලක සභා සාමාජික**

2024 පෙබරවාරි මස 28 වැනි දින
යක්කල

01

**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය**
**2023 දෙසැම්බර් 31 වැනි දිනට අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය**
*(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් වේ)*

| | සටහන් | 2023 | 2022 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **ආදායම** | | | |
| **හුවමාරු කළ නොහැකි ගනුදෙනුවලින් ආදායම** | | | |
| පුනරාවර්තන ප්‍රදාන (ආණ්ඩුව) | | 656,500,000 | 570,000,000 |
| | | **656,500,000** | **570,000,000** |
| ප්‍රාග්ධන ප්‍රදාන (ආණ්ඩුව) | | 96,528,000 | 65,000,000 |
| ප්‍රදාන -AHEAD | | 101,327,366 | 10,695,468 |
| ප්‍රදාන - ක්‍රීඩා ශූරතාවලිය | | - | 1,152,835 |
| ආධාර - වාහනය | | - | 10,000,000 |
| උත්පාදිත අරමුදල් | | 9,466,177 | - |
| ත්‍යාග හා ප්‍රදාන | | 2,059,012 | - |
| | | **209,380,555** | **86,848,303** |
| | | **865,880,555** | **656,848,303** |
| **හුවමාරු ගනුදෙනුවලින් ආදායම** | | | |
| ණය සහ අත්තිකාරම්වල පොළිය | | 803,946 | 834,737 |
| විවිධ ලැබීම් | 18 | 2,027,070 | 1,284,071 |
| ආයෝජන පොලිය | | 71,989,416 | 53,953,442 |
| ලියාපදිංචි ගාස්තු | | 1,338,100 | 1,508,440 |
| විභාග ගාස්තු | | 209,850 | 109,400 |
| පුස්තකාල දඩ මුදල් | | 44,439 | 37,151 |
| වෛද්‍ය ගාස්තු | | 50,200 | - |
| දේපළ කුලිය | 19 | 826,137 | 601,530 |
| තොග විකුණුම | | 166,000 | 85,575 |
| මහපොල හා ශිෂ්‍යාධාර | 20 | 18,296,430 | 17,356,430 |
| ස්වයං-මුල්‍ය වැඩසටහන්වලින් ආදායම | | 41,652,686 | 31,925,982 |
| | | **137,404,274** | **107,696,758** |
| **මුළු ආදායම** | | **1,003,284,829** | **764,545,061** |
| **මෙහෙයුම් ප්‍රතිඵල** | | | |
| **පුනරාවර්තන ආදායම** | | | |
| හුවමාරු නොකළ | | 656,500,000 | 570,000,000 |
| හුවමාරු කළ | | 137,404,274 | 107,696,758 |
| **එකතුව** | | **793,904,274** | **677,696,758** |
| **වියදම් - ජංගම (ප්‍රාග්ධ නොවන)** | | | |
| පුද්ගලික වැටුප් | | (489,833,756) | (496,464,241) |
| ගමන් වියදම් සහ යැපීම් දීමනාව | | (308,458) | (209,058) |
| සැපයුම් හා භාවිතා කළ පාරිභෝජන | | (26,012,771) | (24,361,851) |
| නඩත්තුව | | (23,994,105) | (13,414,386) |
| කොන්ත්‍රාත් සේවා | | (109,626,817) | (67,983,805) |
| ක්ෂයවීම සහ වියදම් ක්‍රමක්ෂය | | - | - |
| පර්යේෂණ හා සංවර්ධනය | | - | - |
| ශිෂ්‍යාධාර | 20 | (18,296,430) | (17,356,430) |
| වෙනත් මෙහෙයුම් වියදම් | | (31,103,435) | (15,569,768) |
| ස්වයං-මුල්‍ය වැඩසටහන් සඳහා වියදම් | | (34,922,606) | (26,098,727) |
| උත්පාදිත අරමුදල් වියදම් | | (13,786,902) | (7,651,671) |
| **මුළු විදයම්** | | **(747,885,280)** | **(669,109,937)** |
| **වර්තමාන අතිරික්තය/කාලසීමාව සඳහා (හිඟය)** | | **46,018,994** | **8,586,821** |
| **හුවමාරු නොවන ආදායම-ප්‍රාග්ධන ප්‍රදානය** | | **209,380,555** | **86,848,303** |
| **හුවමාරු ආදායම - ප්‍රාග්ධන** | | | |
| ක්ෂයවීම සහ වියදම් ක්‍රමක්ෂය | | (86,732,104) | (46,661,608) |
| **ප්‍රාග්ධන ප්‍රදානය සඳහා ගණනය කිරීමෙන් පසු පසු කාලය සඳහා අතිරික්තය/(හිඟය)** | | **122,648,451** | **40,186,695** |
| **කාලය සඳහා මුළු අතිරික්තය/(හිඟය)** | | **168,667,445** | **48,773,515** |

02

**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය**

**2022 දෙසැම්බර් 31 වැනි දෙනින් අවසන් වර්ෂය සඳහා**

**ශුද්ධ වත්කම්/ සමකොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය**

| විෂය ශේත්‍රය | ගෙවූ ප්‍රාග්ධන ප්‍රදාන | නොගෙවූ ප්‍රාග්ධන ප්‍රදාන | සමුච්චිත අතිරික්තය - පුනරාවර්තන | ප්‍රත්‍යාගණන සංචිතය | සීමාකළ අරමුදල්, ප්‍රදාන සහ ආධාර | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **2023 ජනවාරි 01වැනි දිනට ශේෂය** | **539,752,002** | **202,902,628** | **(10,439,360)** | **230,550,352** | **64,111,926** | 1,026,877,548 |
| වසර සඳහා අතිරික්තය/ (හිඟය) | | | 48,773,515 | | | 48,773,515 |
| ප්‍රාග්ධන ප්‍රදානය (GOSL) 2022 | | 65,000,000 | | | | 65,000,000 |
| ක්‍රීඩා ශූරතාව සඳහා ප්‍රදානය | | 1,152,835 | | | | 1,152,835 |
| යටිතලපහසුකම් සංවර්ධනය සඳහා AHEAD ප්‍රදානය | | 10,695,468 | | | | 10,695,468 |
| මාරු කිරීම්/ ශුද්ධ සංචලන | 199,931,300 | (199,931,300) | | | | - |
| | | | | | 9,348,746 | 9,348,746 |
| භුවමාරු නොවන ආදායමට මාරු කිරීම | | (76,848,303) | | | | (76,848,303) |
| ත්‍යාග සහ පරිත්‍යාග | 34,286,520 | 10,000,000 | | | (44,286,520) | - |
| සමුච්චිත අතිරේක පුනරාවර්තනවලට සිදු කළ ගැලපීම් - 2022 | | | (2,857,286) | | | (2,857,286) |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **773,969,822** | **12,971,328** | **35,476,870** | **230,550,352** | **29,174,152** | **1,082,142,524** |

| විෂය ශේත්‍රය | සමුච්චිත අතිරේකය- ප්‍රාග්ධනය | සමුච්චිත ප්‍රාග්ධනය (නොගෙවූ) | සමුච්චිත අතිරේකය- පුනරාවර්තන | ප්‍රත්‍යාගණන සංචිතය | සීමාකළ අරමුදල්, ප්‍රදාන සහ ආධාර | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **2023 ජනවාරි 01වැනි දිනට ශේෂය** | **773,969,822** | **12,971,328** | **35,476,870** | **230,550,352** | **29,174,152** | **1,082,142,524** |
| වසර සඳහා අතිරික්තය/ (හිඟය) | | | 168,667,445 | | | 168,667,445 |
| ප්‍රාග්ධන ප්‍රදානය (GOSL) 2023 | | 96,528,000 | | | | 96,528,000 |
| යටිතලපහසුකම් සංවර්ධනය සඳහා AHEAD ප්‍රදානය | 95,366,128 | 5,961,238 | | | | 101,327,366 |
| මාරු කිරීම්/ ශුද්ධ සංචලන | 34,530,018 | (34,530,018) | | | | - |
| | 9,466,177 | | | 8,575,432 | 4,399,505 | 22,441,114 |
| විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලට මාරු කිරීම | | | (50,000,000) | | 50,000,000 | - |
| භුවමාරු නොවන ආදායමට මාරු කිරීම | | (102,489,238) | (106,891,317) | | | (209,380,555) |
| ත්‍යාග සහ පරිත්‍යාග | 2,059,012 | | | | | 2,059,012 |
| සමුච්චිත අතිරේක පුනරාවර්තනවලට සිදු කළ ගැලපීම් - 2023 | (45,990,469) | 45,990,469 | 14,424,154 | | | 14,424,154 |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **869,400,687** | **24,431,780** | **61,677,152** | **239,125,784** | **83,573,657** | **1,278,209,060** |

03

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

මූල්‍ය ප්‍රවාහන ප්‍රකාශනය

**2023 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| විස්තරය | 2023<br>රු. 000' | 2022<br>රු. 000' |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාවලිවලින් මූල්‍ය ප්‍රවාහ** | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් අතිරික්තය (හිඟය) | 168,667 | 48,774 |
| **එකතු කළා: මූල්‍ය නොවන කටයුතු** | | - |
| ක්ෂයවීම් | 81,060 | 46,338 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන - පාරිතෝෂකය | 20,194 | 18,959 |
| මූල්‍ය නොවන සංචලනය - AHEAD ප්‍රදානය/ ජනනය කළ අරමුදල් | (108,640) | - |
| අස්පර්ෂණීය වත්කම් ක්‍රමක්ෂය | 433 | 254 |
| අස්පර්ශණීය වත්කම් ක්‍රමක්ෂය | 1,900 | - |
| මානව ප්‍රාග්ධනය ක්‍රමක්ෂය | 3,339 | 69 |
| **වැඩ ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ප්‍රතිලාභ** | **166,954** | **114,394** |
| | | - |
| සිදු කළ ගෙවීම්වල වැඩිවීම/ (අඩුවීම) | (12,346) | 33,575 |
| බඩු ලේඛනවල (වැඩිවීම)/අඩු කිරීම | (6,911) | (7,986) |
| ගනුදෙනු හා වෙනත් ලැබීම්වල අඩුවීම (වැඩිවීම)/අඩු කිරීම | 4,860 | 33,276 |
| ගනුදෙනු හා වෙනත් ගෙවීම්වල වැඩිවීම (වැඩිවීම/ (අඩුවීම) | | |
| ගනුදෙනු හා වෙනත් ගෙවීම්වල වැඩිවීම (වැඩිවීම/ (අඩුවීම) | (3,986) | 27,007 |
| **මෙහෙයුම්වලින් උත්පාදිත මුදල** | **148,571** | **200,267** |
| පාරිතෝෂික ගෙවීම් | (24,744) | (22,973) |
| **මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **123,827** | **177,294** |
| **ආයෝජන කටයුතුවලින් මූල්‍ය ප්‍රවාහය** | | |
| පිරියත හා උපකරණ මිල දී ගැනීම | (393,269) | (151,607) |
| කෙරී ගෙන යන වැඩ | 149,290 | (80,900) |
| වෙනත් හා ප්‍රාග්ධන අත්තිකාරම් | 5,758 | 6,648 |
| මානව ප්‍රාග්ධන සංවර්ධනය | (3,118) | (120) |
| ශුද්ධ ආයෝජනය | 11,876 | (44,094) |
| **ආයෝජන කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **(229,463)** | **(270,072)** |
| **මූල්‍ය කටයුතුවලින් මූල්‍ය ප්‍රවාහය** | | |
| පෙර වර්ෂයේ ගැලපීම් (ශුද්ධ) | (39) | 2,179 |
| විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලෙන් මාරු කිරීම | (50,000) | - |
| ලැබූ ප්‍රදාන | 102,489 | 78,195 |
| සීමා කළ අරමුදල් | 54,400 | (34,938) |
| **මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **106,849** | **45,436** |
| | | - |
| මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | 1,213 | (47,342) |
| වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දේ | 12,048 | 59,389 |
| කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දේ | **13,262** | **12,048** |

04

## ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය
## වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

### 1. ආයතනික තොරතුරු

#### 1.1 පදිංචිය හා නෛතික ස්වභාවය

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ නිකුත් කළ 1995 පෙබරවාරි මස 23 වැනි දිනැති අංක 859/12 දරන රජයේ ගැසට්පත්‍රය ප්‍රකාරව 1995 මාර්තු මස 01වැනි දින සිට 2021 පෙබරවාරි මස 28 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අහෝසි කරනු ලබන තෙක් කැළණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ විද්‍යායතනයක් ලෙස පිළිගනු ලැබිය.

2020.07.08 වැනි දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, යක්කල සියලුම පහසුකම්වලින් අනූන විශ්වවිද්‍යාලයක තත්ත්වයට ඉහළ නැංවීම සඳහා තීරණය කරන ලද අතර ඒ අනුව විද්‍යායතනය 2021.03.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි "ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය" නමින් සම්පූර්ණ පහසුකම් සහිත විශ්වවිද්‍යාලයක් බවට උසස් කිරීම පිණිස 2020 ඔක්තෝබර් මස 28 දිනැති අංක 2199/12 දරන රජයේ ගැසට්පත්‍රය ප්‍රකාරව නියෝගය නිකුත් කරන ලදී. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය 2021.03.01 වැනි දින සිට ස්ථාපිත කරනු ලැබ එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී.

විශ්වවිද්‍යාලය කොළඹ- මහනුවර මාර්ගයේ කොළඹ නගරයෙන් කිලෝ මීටර 30ක් පමණ දුරින් යක්කල නගරයේ දී පිහිටුවා ඇත. නව විශ්වවිද්‍යාලයට ප්‍රථම උපාධි වැඩසටහන් 08ක් සහ පශ්චාත් උපාධි වැඩසටහන් 07 පමණ පිරිනමනු ලබන, අධ්‍යයන අංශ 14කින් සමන්විත පීඨ හතරක් ඇතුළත් වේ. විශ්වවිද්‍යාලයට 2021 වර්ෂයේ උසස් පෙළ ප්‍රතිඵල මත පදනම්ව ප්‍රථම උපාධි මට්ටමේ ශිෂ්‍යයින් 480ක් පමණ ඇතුළත් කර ගෙන ඇති අතර 2023 වර්ෂය වන විට විශ්වවිද්‍යාලයේ සිටින මුළු අභ්‍යන්තර ශිෂ්‍යයින් සංඛ්‍යාව 1225ක් විය.

සමාලෝචිත 2023 මූල්‍ය වර්ෂය අතරතුර දී, විශ්වවිද්‍යාලය පොදු මුද්‍රාවක් සහ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් වේ.

#### 1.2 විශ්වවිද්‍යාලයේ බලතල, කර්තව්‍යය සහ ක්‍රියාකාරකම්

2020 ඔක්තෝබර් මස 28 දිනැති අංක 2199/12 දරන රජයේ ගැසට්පත්‍රය ප්‍රකාරව ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය ස්ථාපිත කරනු ලැබුවේ දේශීය වෛද්‍ය විද්‍යාව, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණය සහ දේශීය සමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන ශාඛාවන්හි උසස් අධ්‍යාපනය ලබාදීමේ, දියුණු කිරීමේ සහ සංවර්ධනය කිරීමේ කාර්යයන් සඳහා වේ.

තව ද, තෝරාගත් විෂයන් සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් ලබා ගැනීමේ හැකියාව ඇතිව ශිෂ්‍යයන්ට ඉතා හොඳ සාමාන්‍ය අධ්‍යාපනයක් ලබාදීමේ අරමුණ ඇතිව විෂයයන් රාශියකට අදාළ පාඨමාලා විශ්වවිද්‍යාලය විසින් ඇති කළ බවත් දේශීය සම්පත් පදනම තුළ වටිනාකම් නිර්මාණය කිරීම විශ්වවිද්‍යාලය වැඩි අවධානයක් යොමු කළ යුතු බවත් එයින් නියම කර ඇත.

#### 1.3 විශ්වවිද්‍යාලයේ පාලක සභාව

පාලක සභාව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වගකීම දරනු ලැබේ.

#### 1.4 නිකුත් කිරීම සඳහා බලයදීමේ දිනය

2024 පෙබරවාරි 27 වැනි දින විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමැතිය මත මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය දී ඇත.

## 2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

### 2.1.1 සකස් කිරීමේ පදනම

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවලට 2023 වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහය, ශුද්ධ වත්කම්/ සමකොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශන, වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඇතුළත් වේ.

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇති අතර අඛණ්ඩ අදාළ කර ගනු ලැබේ. සාධාරණ අගයෙන් පිරිවැයේ ද්‍රව්‍යමය අපගමනය ඇති විට, සාධාරණ අගය මිනුම් පදනම ලෙස භාවිතා කර ඇත.

### 2.1.2 අනුකූලවීමේ ප්‍රකාශනය

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන (මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහය, ශුද්ධ වත්කම්/ සමකොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශන, ගිණුම්කරන ප්‍රතිපත්ති සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (අදාළ වන පරිදි SLPSAS I වැනි වෙළුම, II වැනි වෙළුම සහ III වැනි වෙළුම) අනුකූලව සකස් කර ඇත. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හැරුණු කොට මූල්‍ය ප්‍රකාශන සමුච්චිත පදනම මත සකස් කර ඇත. කෙසේවුව ද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් නොමැති අවස්ථාවල දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ද භාවිතා කර ඇත. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හැරුණු කොට මූල්‍ය ප්‍රකාශන සමුච්චිත පදනම මත සකස් කර ඇත.

### 2.1.3 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශන සමුච්චිත පදනමක් මත සහ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇති අතර යෝග්‍ය අවස්ථා හැරුණු කොට අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම් සිදු කර ඇත. වත්කම් හා වගකීම්වල සාපේක්ෂ ද්‍රවශීලීත්වය නිරූපණය කරන පරිදි ඒවා කාණ්ඩ කර ඇත.

### 2.1.4 තුලනාත්මක තොරතුරු

ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන අවබෝධ කර ගැනීම වැඩිදියුණු කිරීම පිණිස සහ කාලපරිච්ඡේද අතර තුලනාත්මකභාවය වැඩිදියුණු කිරීම පිණිස මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති සියලුම අගයන් සඳහා කලින් කාලපරිච්ඡේදය සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක, විස්තරාත්මක තොරතුරු ඇතුළත් තුලනාත්මක තොරතුරු හෙළිදරව් කරනු ලැබේ. පසු ගිය වර්ෂය (2021) සඳහා අයවැය වෙන්කිරීම් එක් ශීර්ෂයක් යටතේ සිදු කර ඇති බැවින් සහ සමාලෝචිත වර්ෂය තුළ දී විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීමත් සමඟ කිසිදු ප්‍රධාන මූල්‍ය ප්‍රතිපත්ති වෙනස්කම් හෝ වර්ගීකරණ සිදු වී නොමැත. තව ද, විශ්වවිද්‍යාලය 2022.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි SLIPSAS II වෙළුමේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති-හුවමාරු නොකරන ගනුදෙනුවලින් ආදායම (බදු සහ මාරු කිරීම්) SLIPAS II අනුව ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් විකල්ප ගිණුම්කරණ ප්‍රතිකාර යොදා ගෙන ඇති අතර පසු ගිය වර්ෂයේ සංඛ්‍යා ලේඛන නැවත වර්ගීකරණයන් ඒ අනුව සිදු කර ඇත.

### 2.1.5 අඛණ්ඩ පැවැත්ම

විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් අඛණ්ඩව පැවතීම සඳහා සිය හැකියාව පිළිබඳව ඇගයීමක් සිදු කර ඇති අතර පූර්වේක්ෂණය කළ හැකි අනාගතයක් සඳහා සිය කටයුතු පවත්වා ගෙන යාම පිණිස සම්පත් පවතින බවට සෑහීමකට පත් වී ඇත. තව ද, විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට ඇති හැකියාව සම්බන්ධයෙන් සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි සැලකිය යුතු අවිනිශ්චිතතාවන් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ පාලක සභාව නොදනී.

### 2.1.6 ගනුදෙනු කරන සහ ඉදිරිපත් කරන ව්‍යවහාර මුදල

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන එහි කෘත්‍ය හා වාර්තාකරණ ව්‍යවහාර මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරනු ලැබේ. සියලුම මූල්‍ය තොරතුරු ආසන්න රුපියලේ අගයට වටයා ඉදිරිපත් කර ඇත.

### 2.1.7 ඇස්තමේන්තු සහ තීණ්දු භාවිතා කිරීම

අදාළ පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා කළමනාකාරීත්වය මගින් ප්‍රතිපත්ති යොදා ගැනීමට සහ වත්කම් හා වගකීම්වලට, ආදායම හා වියදමට වාර්තා කළ අගයන්ට බලපාන තීන්දු, ඇස්තමේන්තු හා උපකල්පන ඇති කර ගැනීමට අවශ්‍ය වේ. ඇස්තමේන්තු හා ආශ්‍රිත උපකල්පන ඓතිහාසික අත්දැකීම් හා පවතින තත්ත්වයන් යටතේ යුක්තිසහගත බවට විශ්වාස කරන විවිධ වෙනත් සාධක මත පදනම් වේ. තථ්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකිය. ඇස්තමේන්තු සහ උපකල්පන කෙරී ගෙන යන පදනම මත සමාලෝචනය කරනු ලැබේ.

## 2.2 වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති සාරාංශය

විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගැනීමේ දී කළමනාකාරීත්වය මඟින් මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගෙන ඇති අගයන් සඳහා වැඩිම බලපෑමක් සිදු කර ඇති පහත දැක්වෙන විනිශ්චයන් සිදු කර ඇත.

### 2.2.1 ඇස්තමේන්තු සහ උපකල්පන

විශ්වවිද්‍යාලය මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට පවතින පරාමිතීන් මත සිය උපකල්පන සහ ඇස්තමේන්තු පදනම් කරන දී. කෙසේ වුව ද, පවතින තත්වයන් සහ අනාගත වර්ධනයන් පිළිබඳ උපකල්පන, වෙළඳපල තත්වයන් හෝ විශ්ව විද්‍යාලයේ පාලනයෙන් ඔබ්බට පැන නගින තත්වයන් අනුව වෙනස් විය හැකිය. එවැනි වෙනස්කම් සිදු වන විට උපකල්පනවලින් පිළිබිඹු කරනු ලැබේ. ඉදිරි මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ බැරකම් ප්‍රමාණයට වැදගත් ගැලපීම් ඇති කිරීමේ සැලකිය යුතු අවදානමක් ඇති, අනාගතය සම්බන්ධ ප්‍රධාන උපකල්පන සහ වාර්තා කරන දිනයේ අවිනිශ්චිතතාවයේ අනෙකුත් ප්‍රධාන මූලාශ්‍ර පහත සාකච්ඡා කරනු ලැබේ.

**(අ) නිර්මිත ප්‍රතිලාභ සැලසුම්**

නිමිත ප්‍රතිලාභ සැලසුමේ පිරිවැය මෙන්ම වර්තමාන වටිනාකම: පාරිතෝෂිකය තීරණය කරනු ලබන්නේ ජීවගණක තක්සේරු කිරීම් භාවිතා කරමිනි. ජීවගණක තක්සේරුවට වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩිවීම් සහ අනෙකුත් වැදගත් අදාළ දත්ත පිළිබඳ උපකල්පන සිදු කිරීම ඇතුළත් වේ. සේවක ප්‍රතිලාභවල දිගුකාලීන ස්වභාවය හේතුවෙන්, එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ. තවද, ඉහත ප්‍රධාන උපකල්පනවලට අදාළව කළමනාකාරීත්වය විසින් සිදු කරන ලද පරිදි උපකල්පනවල විස්තර සහ ඒවායේ සංවේදීතාව පිළිබඳ විශ්ලේෂණයක් සහ සංවේදීතා විශ්ලේෂණයේ ප්‍රතිඵල 2.3.14 සටහනේ දක්වා ඇත.

**(ආ) දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් කාලය**

සෑම වාර්තාකරණ දිනයකදීම, විශ්වවිද්‍යාලය වත්කම්වල අවශේෂ අගයන්, ප්‍රයෝජනවත් කාලය සහ ක්ෂයවීම් ක්‍රම හෝ ක්‍රමක්ෂය පිළිබඳ සමාලෝචනයක් සිදු කරයි. කළමනාකරණය මඟින් මෙම අගයන්, අනුපාත සහ ක්‍රම තක්සේරු කිරීමේදී විනිශ්චය ක්‍රියාත්මක කරයි.

**(ඇ) අස්පර්ශණීය වත්කම්වල ප්‍රයෝජනවත් කාලය**

විශ්ව විද්‍යාලය එක් එක් වාර්තාකරණ දිනයට අනුව ඉතිරි වටිනාකම්, ප්‍රයෝජනවත් කාලය සහ වත්කම් ක්‍රමක්ෂ කිරීමේ ක්‍රම සමාලෝචනය කරයි; මෙම අගයන්, අනුපාත, ක්‍රම පිළිබඳ ඇස්තමේන්තු කිරීමේදී කළමනාකාරිත්වය විසින් විනිශ්චය ක්‍රියාත්මක කරනු ලබන අතර එබැවින් ඒවා අවිනිශ්චිතතාවයට යටත් වේ.

### (ඈ) අපවයවීම් තක්සේරු කිරීම

වත්කම්වල පොත් වටිනාකම ආපසු අය කර ගත නොහැකි විය හැකි බවට අදාළ සිදුවීම් හෝ තත්ත්වයේ සිදුවන වෙනස්කම්වලින් පෙනී යන්නේ නම් වත්කම්වල රැගෙන යන අගයන් අපවයවීම් සඳහා සමාලෝචනය කරනු ලැබේ. එවැනි දැක්වීමක් පවතින්නේ නම්, තිබෙන්නේ නම්, අපවයවීම් අලාභයක ප්‍රමාණය තීරණය කිරීම පිණිස වත්කමේ ආපසු අය කර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. කිසියම් අපවයවීම් අලාභයක් මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ දීම, වත්කමක් හෝ වත්කම් කළඹක් අපවය වී ඇති බවට විෂයමූලික සාක්ෂි තිබේද යන්න විශ්වවිද්‍යාලය තක්සේරු කරයි. වත්කමක ආපසු ලබාගත හැකි ප්‍රමාණය එහි භාවිතයේ ඇති වටිනාකමට වඩා වැඩි වන අතර, මුදල්වල කාල වටිනාකම සහ වත්කමට විශේෂිත වූ අවදානම් පිළිබඳ වර්තමාන වෙළඳපළ තක්සේරු කිරීම් පිළිබිඹු කරන සුදුසු වට්ටම් අනුපාත භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්, වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලබයි.

## 2.3 වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති සාරාංශය

### 2.3.1 දේපළ, පිරියත හා උපකරණ

### (අ) හඳුනා ගැනීම සහ මිනුම

දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂයවීම් සහ වටිනාකමට කිසියම් සමුච්චිත ක්ෂයවීම සඳහා අඩු කිරීම් සිදු කිරීමෙන් පසුව දරන ලද පිරිවැයට හෝ සාධාරණ වටිනාකමට දක්වනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ සියලුම අයිතම මුල් අවස්ථාවේ දී පිරිවැයට වාර්තා කරනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ අයිතම පසුව ප්‍රත්‍යාගනනය කරන විට එවැනි වත්කම්වල සියලුම පන්ති ප්‍රත්‍යාගනනය කරනු ලැබේ.

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ කලින් හඳුනා ගත් එම වත්කමේ ප්‍රත්‍යාගණන අඩුවීමක් ආපසු හැරවීමක් නොවන තාක් දුරට හැරුණු කොට වත්කමක් ප්‍රත්‍යාගණනය කළ විට එහි රැගෙන යන අගයේ කිසියම් වැඩිවීමක් සෘජුවම ප්‍රත්‍යාගණන අතිරික්තයට බැර කරනු ලබන අතර එවැනි අවස්ථාවක දී වැඩිවීම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

එකම වත්කමක පෙර අතිරික්තයක් හිලව් කරන ඕනෑම ප්‍රත්‍යාගණන හිඟයක් ප්‍රත්‍යාගණන සංචිතයේ අතිරික්තය සම්බන්ධයෙන් සහ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවල වියදමක් ලෙස හඳුනා ගෙන ඇති ඕනෑම වියදමක් සම්බන්ධයෙන් සෘජුව හිලව් කරනු ලැබේ.

විකිණූ වත්කම ආශ්‍රිත ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක් සමුච්චිත අතිරික්තයට හෝ හිඟයට මාරු කරනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ අයිතම ප්‍රතිස්ථාපනය කළ විට, බැහැර කළ විට හෝ එහි භාවිතාවෙන් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට හඳුනා ගනු ලබන්නේ නැත; වත්කම හඳුනා නොගැනීමෙන් මතුවන කිසියම් ලාභයක් හෝ අලාභයක් එකී වත්කම හඳුනා නොගන්නා වර්ෂය තුළ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

වත්කම්වල පොත් වටිනාකම ආපසු අය කර ගත නොහැකි විය හැකි බවට අදාළ සිදුවීම් හෝ තත්ත්වයේ සිදුවන වෙනස්කම්වලින් පෙනී යන්නේ නම් වත්කම්වල රැගෙන යන අගයන් අපවයවීම් සඳහා සමාලෝචනය කරනු ලැබේ. එවැනි දැක්වීමක් පවතින්නේ නම්, තිබෙන්නේ නම්, අපවයවීම් අලාභයක ප්‍රමාණය තීරණය කිරීම පිණිස වත්කමේ ආපසු අය කර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. කිසියම් අපවයවීම් අලාභයක් මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

අයිතිය ඇති ගොඩනැගිලි විශ්වවිද්‍යාලයේ කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන අතර ඒ අනුව ආයෝජන දේපළ අර්ථකථනයට ඇතුළත් නොවේ. භාවිතා කරනු ලබන ගොඩනැගිලි සහ ඉදිකිරීම් පසු කාලීන වැඩිදියුණු කිරීම් එකතු කිරීම, සමුච්චිත ක්ෂයවීම් අඩු කිරීම මගින් ඉදිකිරීම් පිරිවැයට තක්සේරු කරනු ලැබේ. අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවය වැඩි කරන හෝ ඉක්මවා යන ගොඩනැගිලි

සහ ඉදිකිරීම් සම්බන්ධයෙන් සිදු කරන විශාල නවීකරණය කිරීම් සහ වැඩිදියුණු කිරීම් පිළිබඳ පසු කාලීන පිරිවැය, පිරිවැයට තක්සේරු කරනු ලැබේ.

### (ඇ) ක්ෂයවීම

සින්නක්කර ඉඩම් හැරුණු කොට, වත්කම් ඇස්තමේන්තුගත ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලය මත එම වත්කම්වල පිරිවැය කපා හැරීම සඳහා වාර්ෂිකව පහත සඳහන් ප්‍රමාණවලින් සරල රේඛීය පදනම මත මූල්‍ය ප්‍රතිඵල ප්‍රකාශනයට ක්ෂයවීම් ඇතුළත් කොට ඇත. වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලය පහත දැක්වෙන පරිදි වේ:

| <u>**වත්කම් කාණ්ඩය**</u> | වර්ෂය |
|---|---|
| ගොඩනැගිලි | 20 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 10 |
| උපකරණ හා යන්ත්‍රෝපකරණ | 10 |
| කාර්යාල උපකරණ | 5 |
| මෝටර් වාහන | 5 |
| පුස්තකාල පොත් හා වාරසඟරා | 5 |
| විද්‍යාගාර, ශික්ෂණ උපකරණ | 5 |
| ලෝගු | 5 |
| පරිගණක උපකරණ/මෙවලම්** | 5 |
| ජෙනරේටර හා විදුලි සැපයුම් පද්ධති** | 10 |
| ජලාපවහන සහ මළාපවහන පද්ධති** | 10 |
| ක්‍රීඩා මෙවලම්/ අවශ්‍ය කරන දෑ* | 4 |

වත්කමක් භාවිතය සඳහා ලබා ගැනීමට ඇති විට ක්ෂයවීම ආරම්භ වන අතර එය බැහැර කළ විට හෝ ස්ථිර වශයෙන්ම ආපසු ගත් විට අවසාන වේ.

****** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නිකුත් කළ අංක 09/2022 කොමිෂන් සභා චක්‍රලේඛය අනුව 2022.05.10 වැනි දිනයෙන් පසුව අත්කර ගත් වත්කම් 2022.05.10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්ෂය කරන ලදී.

### (ඇ) පසු කාලීන වියදම්

පසු කාලීන වියදම මුදල් බවට හරවනු ලබන්නේ වියදම් මඟින් විශ්වවිද්‍යාලයට එකතු වන කිසියම් අදාළ වත්කමක අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභය හෝ සේවා විභවය වැඩි කරන්නේ නම් පමණි. එදිනෙදා සේවා සැපයීම සඳහා වූ පිරිවැය මූලික වශයෙන් ශ්‍රමය හා පරිභෝජන භාණ්ඩ සඳහා වැය වන පිරිවැය වන අතර සුළු කොටස්වල පිරිවැය ඇතුළත් විය හැකිය. මෙම වියදම්වල අරමුණ බොහෝවිට දේපළ, පිරියත හා උපකරණ "අළුත්වැඩියාව සහ නඩත්තුව" ලෙස විස්තර කරනු ලබන අතර මෙම වියදම් දරනු ලැබූ විට වියදමක් ලෙස මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනා ගනී.

## (ඇ) කෙරී ගෙන යන ප්‍රාග්ධන වැඩ

කෙරී ගෙන යන ප්‍රාග්ධන වැඩ පිරිවැයට ප්‍රකාශ කරනු ලැබේ. මුදල් බවට හැරවීමට අපේක්ෂාවෙන් ඇති ගොඩනැගිලි ඉදිකිරීම, ගොඩනැගිලි නවෝත්පාදන වැඩ, විශාල පිරියත හා යන්ත්‍රෝපකරණ හා පද්ධති ගොඩනැගීම මත දැරූ ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වේ.

වාර්තාකරණ දිනයේ දී සම්පූර්ණ නොකළ නමුත් සිදු කළ ප්‍රාග්ධන වියදම් කෙරී ගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

භාවිතය සඳහා ලබා ගත හැකි වූ පසු, කෙරී ගෙන යන ප්‍රාග්ධන වැඩ දේපළ, පිරියත සහ උපකරණ වෙත මාරු කරනු ලැබේ. එය පිරිවැය ලෙස දක්වා ඇති අතර ගොඩනැගිලි ඉදිකිරීම, ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ කටයුතු, ප්‍රධාන කම්හල් සහ යන්ත්‍රෝපකරණ සහ පද්ධති සංවර්ධනයට සෘජුවම සම්බන්ධ ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් ඇතුළත් වේ. සම්පූර්ණ වගකීම් විශ්වවිද්‍යාලය මඟින් මෙතෙක් පියවා නොමැතිවීම සහ විශ්ව විද්‍යාලය මඟින් පවරාගෙන නොමැති බැවින් මෙම වියදම් ප්‍රාග්ධනීකරණය බලාපොරොත්තු වේ.

## (ඉ) ප්‍රාග්ධන අත්තිකාරම්

එක් එක් වාර්තා කරන දිනය වන විට ගෙවිය යුතුව ඇති දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම හෝ ඉදිකිරීම සඳහා ලබා දී ඇති අත්තිකාරම් ප්‍රාග්ධන අත්තිකාරම් ලෙස අනාවරණය කරනු ලැබේ. සම්පූර්ණ වගකීම් විශ්වවිද්‍යාලය මඟින් මෙතෙක් පියවා නොමැතිවීම සහ විශ්ව විද්‍යාලය මඟින් පවරාගෙන නොමැති බැවින් මෙම වියදම් ප්‍රාග්ධනීකරණය බලාපොරොත්තු වේ.

## (ඊ ) ප්‍රදානය කළ වත්කම්

දේපළ පිරියත සහ උපකරණ ව්‍යාපෘතියක කොටසක් ලෙස සීමිත අරමුදල් හෝ විදේශ අරමුදල් සම්පාදක ව්‍යාපෘති හරහා මිල දී ගන්නා විට ව්‍යාපෘතිය අවසන් කරන තෙක් හෝ ව්‍යාපෘතිය අවසානයේ දී වත්කම ප්‍රතිලාභියාට භාර නොදෙන්නේ නම් හෝ මුල් දායකයාට ආපසු ලබා දෙන්නේ නම්, වත්කමේ පිරිවැය දේපළ පිරියත සහ උපකරණවලට ඇතුළු නොකරයි.

## (උ) විදේශීය අරමුදල් ව්‍යාපෘති යටතේ අත්කර ගත් වත්කම්

උසස් අධ්‍යාපනය ව්‍යාප්තිය සහ සංවර්ධන මෙහෙයුම් වේගවත් කිරීම (AHEAD) 2018 වර්ෂයේ දී ක්‍රියාත්මක කළ දිවයිනේ උසස් අධ්‍යාපන අංශයට අනුග්‍රහය දැක්වීම සඳහා වූ නවතම සංවර්ධනය ඉලක්ක කර ගත් ව්‍යාපෘතිය වේ.

ඒ අනුව, විශ්වවිද්‍යාලයට AHEAD යටතේ පහත දැක්වෙන ප්‍රදාන ලැබී ඇති අතර 2021 සිට 2023 දක්වා දේපළ, පිරියත සහ උපකරණ මිල දී ගෙන ඇත.

| විස්තර | වෙන්කිරීම් රු. | වියදම් රු. | % | |
|---|---|---|---|---|
| STEM ව්‍යාප්ති උපකරණ සිවිල් | 61,956,000.00 | 60,995,833.01 | 98.45 | % |
| ELTAS-ELSE පියය | 29,913,250.00 | 27,372,289.19 | 91.51 | % |
| කලාවන් සඳහා IT | 8,750,000.00 | 8,746,428.60 | 99.96 | % |
| එකතුව | **100,619,250.00** | **97,114,551.00** | 96.52 | % |

AHEAD ප්‍රදාන යටතේ අත්කර ගෙන ඇති දේපළ, පිරියත සහ උපකරණ ව්‍යාපෘතියෙන් විශ්වවිද්‍යාලයට මාරු කර ඇති අතර විශ්වවිද්‍යාලය සඳහා 2023.01.01 දිනයට ශුද්ධ පොත් වටිනාකමට වාර්තා කරනු ලැබේ. වත්කම්වල පිරිවැය මත පදනම්ව එක් එක් වත්කමේ ඉතිරි ප්‍රයෝජනවත් කාලයට අනුකූලව ක්ෂයවීම් අයකර ගෙන තිබේ.

එයට අමතරව, තාක්ෂණික අයිතම/ ගෘහභාණ්ඩ ප්‍රසම්පාදනය කිරීම සහ විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා පහසුකම් ඉහළ නංවීම සඳහා AHEAD ව්‍යාපෘතිය හරහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පහත දැක්වෙන ප්‍රදාන වෙන් කර ඇත.

| විස්තර | වෙන්කිරීම<br>රු. | වියදම<br>රු. | % | |
|---|---|---|---|---|
| සමාජ සංහිදියා මධ්‍යස්ථානයට මූල්‍ය සහාය | 1,000,000.00 | 968,922.50 | 96.89 | % |
| ක්‍රීඩා පහසුකම් ඉහළ නැංවීම සඳහා මූල්‍ය සහාය | 5,000,000.00 | 4,992,315.00 | 99.85 | % |

ඉහත ප්‍රදාන යටතේ අත්කර ගත් දේපළ, පිරියත සහ උපකරණ 2023 වර්ෂය තුළ දී විශ්වවිද්‍යාලයට වාර්තා කර ඇති අතර වත්කම්වල පිරිවැය මත පදනම්ව එක් එක් වත්කමේ ඉතිරි ප්‍රයෝජනවත් කාලයට අනුකූලව ක්ෂයවීම් අයකර ගෙන තිබේ.

**(ඌ) අත්කර ගැනීමේ ක්‍රියාවලිය යටතේ පවතින ඉඩම්**

විශ්වවිද්‍යාලය අනාගත වැඩිදියුණු කිරීම් සිදු කිරීම පිණිස ප්‍රධාන විශ්වවිද්‍යාලයට යාබදව ඇති හිස් ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස අත්කර ගැනීමේ ක්‍රියාවලිය 2010 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර 2013 සැප්තැම්බර් 3 වැනි දින අංක No. 1826/5 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 38 (අ) වගන්තිය පළ කරන ලදී. (ගම්පහ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉල්ලීම මත, විශ්වවිද්‍යාලය ඉඩම් අයිතිකරුවන් සඳහා වන්දි ලබා දෙමින් ඇත. ඉහත සඳහන් කළ ඉඩම් දැනටමත් විසඳී නොමැත. 2023 දෙසැම්බර් 31 වන විට රු. 4,393,825ක මුදලක් බෙදා දී ඇත.

### 2.3.2 අස්පර්ශණීය වත්කම්

විශ්වවිද්‍යාලයේ අස්පර්ශණීය වත්කම්වලට පරිගණක මෘදුකාංගවල වටිනාකම ඇතුළත් වේ. අදාළ වත්කමේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි වන්නේ නම් සහ එයට ආවේණික අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා එන්නේ නම් පමණක් අස්පර්ෂණීය වත්කමක් ලෙස හඳුනා ගන්නා අතර අස්පර්ෂණීය වත්කම් ඇස්තමේන්තුගත ජීවිත කාලය පුරාවට ක්‍රමක්ෂය කරනු ලැබේ. අස්පර්ෂණීය වත්කම්වල ප්‍රධාන පන්තිවල ප්‍රයෝජනවත් ජීවිත කාලය පහත දැක්වෙන පරිදි ඇස්තමේන්තු කර ඇත.

| <u>වත්කම</u> | වර්ෂය |
|---|---|
| මෘදුකාංගය – අභ්‍යන්තරව ගොඩනඟන ලද | 5 |
| මෘදුකාංගය – බාහිරින් අත්කර ගත් | 5 |
| මෘදුකාංගය – බලපත්‍ර අත්කර ගත් | 5 |

අත්කර ගත් පරිගණක මෘදුකාංග බලපත්‍ර අදාළ මෘදුකාංගය අත්කර ගැනීමට සහ භාවිතයට ගැනීමට දරන ලද පිරිවැය මත පදනම්ව ප්‍රාග්ධනීයකරනු ලැබේ. බාහිරින් මිල දී ගත් මෘදුකාංග හෝ මෘදුකාංග බලපත්‍ර එක් ඒකකයක් සඳහා රු. 20,000/-ක් හෝ ඊට වැඩි පිරිවැයක් තිබෙන්නේ නම් ඒවා වත්කමක් ලෙස හඳුනා ගනු ලැබේ. SLPSAS 20 යටතේ හඳුනා ගැනීමේ නිර්ණායක සම්පූර්ණ කරන්නේ නම් පමණක් විශ්වවිද්‍යාලයේ භාවිතය සඳහා ගොඩනඟන ලද මෘදුකාංගයක් ආශ්‍රිත සෘජුව දරන ලද පිරිවැය අස්පර්ෂණීය වත්කම් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. අභ්‍යන්තරව ගොඩනඟන ලද මෘදුකාංගවලට රු. 250,000/-ක් හෝ ඊට වැඩි පිරිවැයක් තිබෙන්නේ නම්, ඒවා වත්කමක් ලෙස හඳුනා ගනු ලැබේ. පුනරාවර්තන ස්වභාවයේ ප්‍රාග්ධන ප්‍රදාන මත දරන ලද වියදම වර්ෂය තුළ සිදු කළ වියදමක් ලෙස හඳුනා ගෙන ඇත.

වර්ෂය තුළ දී පර්යේෂණ සහ සංවර්ධනය සඳහා වැය කළ වියදම සහ ධාරක මුදල SLPSAS 20 හි දක්වා ඇති හඳුනා ගැනීමේ නිර්ණායක සම්පූර්ණ නොකරන බැවින් වියදමක් ලෙස හඳුන්ගෙන ඇත.

### 2.3.3 මානව ප්‍රාග්ධන සංවර්ධනය

විශ්ව විද්‍යාලයේ මානව ප්‍රාග්ධනය සංවර්ධනයට සෘජුවම සම්බන්ධ වන පිරිවැය මූලිකවම ප්‍රාග්ධන වියදම් ලෙස වර්ග කෙරේ. කෙසේවුව ද මෙම පිරිවැය පුනරාවර්තන ස්වභාවය හේතුවෙන් කාල සීමාව තුළ පුනරාවර්තන වියදම් ලෙස හඳුනාගෙන ඇත.

### 2.3.4 දිගු කාලීන, මැදි කාලීන සහ කෙටි කාලීන ආයෝජන

ස්ථාවර තැන්පතුවල ආයෝජන ගනුදෙනු මිලට හඳුනා ගනු ලබන අතර ලැබූ පොළිය සමඟ පිරිවැයට අදාළ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ නිරූපණය කරනු ලැබේ. සියලුම ස්ථාවර තැන්පතු රාජ්‍ය බැංකුවල සිදු කර තිබේ.

ලැබූ පොළිය හෝ වසර සඳහා වූ ආයෝජනවලින් ලැබෙන පොළිය වසර ඇතුළත එවැනි ආයෝජන සඳහා බැංකුවෙන් ප්‍රකාශිත අනුපාතය මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හඳුනා ගෙන ඇත.

අත්පත් කරගත් දින සිට මාස තුනකට වඩා වැඩි කල් පිරෙන ආයෝජන දිගුකාලීන ආයෝජන ලෙස සැලකේ. කෙටි කාලීන ආයෝජන යනු මාස තුනක හෝ ඊට අඩු කල්පිරීමක් සහිත තැන්පතු නියෝජනය කරන අතර, වටිනාකමේ වෙනස්වීම්වල නොසැලකිය යුතු අවදානමකට යටත්ව, පිරිවැය සහ ලැබිය යුතු පොලිය මත සිදු කරනු ලැබේ. ස්ථාවර තැන්පතුවල ආයෝජන ගණුදෙණු මිලට හඳුනාගනු ලබන අතර ඒවා පිරිවැය සහ ලැබිය යුතු පොළිය මත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශවලින් පිළිබිඹු වේ. සියලුම ස්ථාවර තැන්පතු රාජ්‍ය බැංකු තුළ ඇත. එම ආයෝජනවලින් ලැබුණු හෝ ලැබිය යුතු පොලිය වර්ෂය තුළ එම ආයෝජන සඳහා බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද අනුපාතිකය පිළිබඳ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දී හඳුනාගෙන ඇත.

### 2.3.5 වත්කම් අපවයවීම

වත්කම්වල පොත් වටිනාකම ආපසු අය කර ගත නොහැකි විය හැකි බවට අදාළ සිදුවීම් හෝ තත්ත්වයේ සිදුවන වෙනස්කම්වලින් පෙනී යන්නේ නම් වත්කම්වල රැගෙන යන අගයන් අපවයවීම් සඳහා සමාලෝචනය කරනු ලැබේ. එවැනි දැක්වීමක් පවතින්නේ නම්, තිබෙන්නේ නම්, අපවයවීම් අලාභයක ප්‍රමාණය තීරණය කිරීම පිණිස වත්කමේ ආපසු අය කර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. කිසියම් අපවයවීම් අලාභයක් මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

අයිතිය ඇති ගොඩනැගිලි විශ්වවිද්‍යාලයේ කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන අතර ඒ අනුව ආයෝජන දේපළ අර්ථකථනයට ඇතුළත් නොවේ. භාවිතා කරනු ලබන ගොඩනැගිලි සහ ඉදිකිරීම් පසු කාලීන වැඩිදියුණු කිරීම් එකතු කිරීම, සමුච්චිත ක්ෂයවීම් අඩු කිරීම මඟින් ඉදිකිරීම් පිරිවැයට තක්සේරු කරනු ලැබේ. අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවය වැඩි කරන හෝ ඉක්මවා යන ගොඩනැගිලි සහ ඉදිකිරීම් සම්බන්ධයෙන් සිදු කරන විශාල නවීකරණය කිරීම් සහ වැඩිදියුණු කිරීම් පිළිබඳ පසු කාලීන පිරිවැය, පිරිවැයට තක්සේරු කරනු ලැබේ.

වාර්තා කරන දිනය වන විට, එම වත්කම්වල අලාභ හානි සිදුවී ඇති බවට යම් ඇඟවීමක් තිබේ ද යන්න තීරණය කිරීම සඳහා දේපළ, පිරියත සහ උපකරණ සමාලෝචනය කෙරේ. සිදුවිය හැකි අපවයවීමක් පිළිබඳ ඇඟවීමක් තිබේ නම්, බලපෑමට ලක් වූ කිසියම් වත්කමක (හෝ අදාළ වත්කම් සමූහයක) අයකර ගැනීමේ හැකියාව ඇස්තමේන්තු කර, එහි රැගෙන යන මුදල සමඟ සංසන්දනය කෙරේ. ඇස්තමේන්තුගත අයකරගත හැකි මුදල අඩු නම්, රැගෙන යන මුදල එහි ඇස්තමේන්තුගත අයකරගත හැකි මුදලට අඩු කරනු ලබන අතර, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුළ අපවයවීම් අලාභයක් ක්ෂණිකව හඳුනාගනු ලැබේ.

අපවයවීම් අලාභයක් පසුව ආපසු හැරවුයේ නම්, වත්කමේ (හෝ අදාළ වත්කම් සමූහයේ) රැගෙන යන මුදල, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ කිසිදු හානියක් පාඩුවක් ක්ෂණිකව හඳුනාගෙන නොතිබුනේ නම් තීරණය කළ හැකිව තිබූ අගය ඉක්මවා නොව, එහි ආපසු ලබාගත හැකි මුදලේ සංශෝධිත ඇස්තමේන්තුවට වැඩි කරනු ලැබේ (ඉන්වෙන්ට්‍රි සම්බන්ධයෙන් වන විට සම්පූර්ණ කිරීම සහ විකිණීම සඳහා අලෙවි මිලෙන් පිරිවැය අඩු කරනු ලැබේ).

## 2.3.6 භාණ්ඩ ලේඛන (ගබඩා අත්තිකාරම්)

විශ්වවිද්‍යාලයේ නඩත්තුව සඳහා භාවිතා කිරීමට අවශ්‍ය කරන, ගබඩාවල තබා ඇති ලිපි ලේඛන අයිතම, සැපයුම් සහ වෙනත් ද්‍රව්‍යවල වටිනාකම බඩු වට්ටෝරුවලට ඇතුළත් වේ. ප්‍රධාන ගබඩාවල සහ නඩත්තු ගබඩාවල ඇති සියලුම තොග සම්බන්ධයෙන් වෙන වෙනම වාර්ෂික භෞතික බඩු ලේඛන පවත්වනු ලැබේ. වර්ෂය තුළ දී නඩත්තු ගබඩාවල ආරම්භක සහ අවසාන ශේෂයන් හඳුනා ගෙන, වෙන්ව වාර්තා කරනු ලැබේ. කිසිදු බඩු වට්ටෝරුවක් වගකීම් සඳහා ඇපකරයක් ලෙස සලකනු නොලැබේ. භාණ්ඩ ලේඛන අඩුම පිරිවැය හෝ ශුද්ධ හඳුනාගත හැකි අඩුම වටිනාකම මත වටිනාකම් දක්වනු ලැබේ. භාණ්ඩ ලේඛණවල එක් එක් කාණ්ඩයේ පිරිවැය FIFO ක්‍රමය මඟින් තීරණය කරනු ලැබේ.

## 2.3.7 වෙනත් ලැබිය යුතු දේ

එක් එක් වාර්තාකරණ කාලසීමාව අවසානයේ දී, අපවයවීම් සඳහා අනෙකුත් ලැබිය යුතු මුදල් පිරිවැයෙන් දීමනා අඩු කිරීම යටතේ ඇගයීමට ලක් කෙරේ. ලැබිය යුතු මුදල් ආපසු ලබාගත නොහැකි බව පෙන්නුම් කරන විෂයමූලික සාක්ෂි තිබේදැයි තක්සේරු කිරීම සඳහා සමාලෝචනයක් පවත්වනු ලැබේ. එවැනි සාක්ෂි තිබේ නම්, මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයේ අපවයවීම් අලාභයක් වහාම හඳුනා ගැනේ.

## 2.3.8 කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම්

ණය සහ අත්තිකාරම් යනු විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලයට ඇපයක් සහිතව ලබා දී ඇති අරමුදල් වේ. ආපසු ගෙවීම් සේවකයින්ගේ මාසික වැටුපෙන් අඩු කරනු ලබන අතර, සේවකයෙකු ඉවත්ව ගියහොත්, ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් ශේෂයෙන් හිඟ මුදල් සම්පූර්ණයෙන්ම අය කෙරේ. එහි ප්‍රතිඵලයක් ලෙස බොල් ණය අයකර ගැනීමට ප්‍රතිපාදන සලසා නැත.

## 2.3.9 මුදල් හා මුදල් සමාන දෑ

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇති මුදල් හා මුදල් සමාන දෑ යන්නට බැංකුවේ ඇති මුදල් සහ අතැති මුදල් ඇතුළත් වේ.

වක්‍ර ක්‍රමය යටතේ සකස් කරනු ලබන මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනයේ කාර්යය සඳහා මුදල් හා මුදල් සමාන දෑ යන්නට බැංකුවේ ඇති මුදල් සහ අතැති මුදල් ඇතුළත් වන අතර ඉහත විස්තර කළ පරිදි කෙටි කාලීන තැන්පතු විශ්වවිද්‍යාලයේ මූල්‍ය කළමනාකරණයේ අන්තර්ගත කොටසක් ලෙස සලකනු ලැබේ.

## 2.3.10 බැඳුම්කර උල්ලංඝනය කිරීම යටතේ ලැබිය යුතු මුදල්

විශ්වවිද්‍යාලය සඳහා වූ සිය ගිවිසුම්ගත අනිවාර්ය සේවා සම්පූර්ණ නොකර ඉල්ලා අස් වූ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙක් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙක් බැඳුම්කර උල්ලංඝනය කිරීමට යටතේ විශ්වවිද්‍යාලයට රු. 17,928,351.80ක් ගෙවිය යුතුව ඇත. 2024 ජනවාරි 29 දින නිකුත් කළ අංක 01/2024 දරන චක්‍රලේඛය අනුව නිශ්චය කළ කාලයක් ඇතුළත ගෙවීමට නොහැකි තැනැත්තන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් 2023.12.31 වැනි දිනයට ලබා දී ඇති 14.21% ක සාමාන්‍ය බර සහිත ණයදීමේ අනුපාතයට (AWLR) ගණනය කළ අතිරේක පොලියක් අය

කරනු ලැබේ. මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2024.01.01 දින සිට බලාත්මක වන අතර 2024 සිට අවශ්‍ය ගැලපීම් සිදු කරනු ලැබේ.

### 2.3.11 සමුච්චිත අතිරික්තය - පුනරාවර්තන

සමුච්චිත අතිරික්තය - පුනරාවර්තනයට වර්ෂය තුළ එකතු වූ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ අතිරික්තයන් සහ හිඟ සහ වර්ෂය තුළ එකතු කළ පොදු සංචිතවල මාරු කළ ශේෂය ඇතුළත් වේ.

### 2.3.12 සීමා කළ අරමුදල් සහ ප්‍රදාන

සීමා කළ අරමුදල් සහ ප්‍රදාන පර්යේෂණ ප්‍රදාන සහ විශේෂිත කාර්යයන් සඳහා වෙන් කර ඇති ලැබූ වෙනත් ප්‍රදාන නිරූපණය කරයි.

### 2.3.13 ප්‍රතිපාදන

අතීතයේ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස විශ්වවිද්‍යාලයට වර්තමාන නෛතික හෝ සාධනීය වගකීමක් ඇති විට ප්‍රතිපාදන පිළිගනු ලබන අතර, එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය විය හැකි අතර ප්‍රමාණය පිළිබඳ විශ්වාසනීය ඇස්තමේන්තු කළ හැක. විශ්ව විද්‍යාලය යම් ප්‍රතිපාදනයක් හෝ සියල්ල ප්‍රතිපූරණය කිරීමට අපේක්ෂා කරන විට, ප්‍රතිපූරණය වෙනම වත්කමක් ලෙස පිළිගනු ලබන නමුත් එසේ සිදු කරනු ලබන්නේ ප්‍රතිපූරණය ස්ථිර වූ විට පමණි. කිසියම් ප්‍රතිපාදනයකට අදාළ වියදම් ඕනෑම ප්‍රතිපූරණයක ශුද්ධ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ඉදිරිපත් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දන්නා ප්‍රතිපාදන සියල්ල ගිණුම්ගත කර ඇත.

### 2.3.14 උපචිත වියදම්

උපචිත වියදම් විශ්වවිද්‍යාලය සිය මෙහෙයුම් සිදු කරන විට කාලයත් සමඟ එකතු වන වගකීම් නියෝජනය කරන අතර වසරක් හෝ ඊට අඩු කාලයක් තුළ පියවීමට අපේක්ෂා කෙරේ.

### 2.3.15 වෙනත් ගෙවිය යුතු දේ

අනෙකුත් ගෙවිය යුතු දෑ සැපයුම්කරුවන්ට ලබා දී ඇති සාමාන්‍ය ණය කොන්දේසි මත ඇති බැඳීම් වන අතර පොලී දරන්නේ නැත. වසරක් හෝ ඊට අඩු කාලයක් තුළ ගෙවීමට නියමිත නම් මෙම ගෙවිය යුතු වත්මන් වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත.

### 2.3.16 සේවක ප්‍රතිලාභ

#### (i) නිර්මිත ප්‍රතිලාභ සැලසුම්

සංශෝධිත පරිදි විශ්වවිද්‍යාල පනතේ 75 (1) වගන්තිය සහ අංක 19/2022 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව 2023.01.01 සිට ක්‍රියාත්මක වන පරිදි ගුරුවරුන් හැරුණු කොට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සේවකයන්ගේ අනිවාර්ය විශ්‍රාමයාමේ වයස අවුරුදු 60 වේ. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අධ්‍යයන කාර්ය මණ්ඩලයට අනිවාර්ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 65 වන තෙක් සේවය කළ හැකිය. ඉහත සේවා කාලය 2023 වර්ෂය සඳහා පාරිතෝෂික දීමනා සඳහා පදනමක් ලෙස සලකනු ලැබේ.

කෙසේවුව ද, ආණ්ඩුව මඟින් තීරණය කරන ලද පරිදි, 2021.12.31 වැනි දින වන විට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ගුරුවරුන් හැරුණු කොට අනෙකුත් සේවකයින්ගේ අනිවාර්ය විශ්‍රාමයාමේ වයස අවුරුදු 62ක් විය.

විශ්වවිද්‍යාලය මඟින් සුදුසුකම් ඇති සියලු සේවකයින් සඳහා 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීම් පනත යටතේ දක්වා ඇති පරිදි ප්‍රතිපාදන සැලැස්මක් අනුගමනය කරනු ලැබේ.

කෙසේවුව ද, 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීම් පනත යටතේ වගකීම් පැන නඟින්නේ අවම වශයෙන් වසර පහක අඛණ්ඩ සේවාවක් සම්පූර්ණ කළ සේවකයින් සඳහා පමණක් වන අතර වගකීම් සඳහා බාහිරව අරමුදල් සපයනු නොලැබේ. වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම-නොවන වගකීම් යටතේ කාණ්ඩගත කර ඇත.

2023.12.31 වැනි දිනට පාරිතෝෂික වෙන්කිරීම් පිළිබඳ ආයුගණක තක්සේරුවක් වෘත්තීය ආයුගණකයින් විසින් සිදු කරන ලදී.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල (SLPSAS 19) නිර්දේශ කර ඇති "ව්‍යාපෘති ඒකක පිරිවැය ක්‍රමය" භාවිතා කරමින් තක්සේරු කිරීම නිමා කරන ලදී.

තක්සේරුවේදී භාවිතා කළ ප්‍රධාන ආයුගණක උපකල්පන පහත දැක්වෙන පරිදි වේ.

- කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාත - අධ්‍යයන කාර්ය මණ්ඩලය: 2.00%, අනධ්‍යයන කාර්ය මණ්ඩලය: 2.00% වාර්ෂිකව වයස අවුරුදු 54 දක්වා සහ පසුව ශුන්‍ය
- සාමාන්‍ය විශ්‍රාමයාමේ වයස - අධ්‍යයන කාර්ය මණ්ඩලය: වයස අවුරුදු 65, අනධ්‍යයන කාර්ය මණ්ඩලය: අවුරුදු 60<br>(නිශ්චිත විශ්‍රාමයාමේ වයසට වැඩි වයසේ පසුවන කාර්ය මණ්ඩලය ඔවුන්ගේ ඊළඟ උපන් දිනය එළැඹෙන දිනයේ දී විශ්‍රාම යාමට නියමිත බවට උපකල්පනය කරනු ලැබීය.)
- වට්ටම් අනුපාතය - 13.00% වාර්ෂිකව
- වැටුප් වැඩිවීමේ අනුපාත - මූලික වැටුප සහ දීමනා: අධ්‍යයන 12.00% වාර්ෂිකව අනධ්‍යයන10.00% වාර්ෂිකව (දත්තවල නිශ්චිතව දක්වා ඇති සෑම වර්ෂයකම මාසයේ දී වැටුප් වර්ධක නියමිත බවට උපකල්පනය කරනු ලැබේ)
- විශ්‍රාම පාරිතෝෂික සූත්‍රය - අඩ මසක වැටුප සහ දීමනා, අවමය වර්ෂ 5ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් සඳහා

(ii) **නිර්මිත දායකත්ව සැලසුම්**

විශ්වවිද්‍යාලයේ සියලුම සේවකයින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට අනුකූලව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජිකයින් වෙති. විශ්වවිද්‍යාලය මූලික වැටුපෙන් සහ දීමනාවලින් 15%ක් එම අරමුදලට දායකත්වය දක්වයි. තව ද 1999 සැප්තැම්බර් මස 01වැනි දින හෝ ඊට පසු බඳවා ගත් සේවකයින් මෙම දායකත්ව විශ්‍රාම වැටුප් අරමුදලයේ සාමාජිකයින් වෙති. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සිදු කරන 15%ක දායකත්වයෙන් 8%ක් මාසිකව දායකත්ව විශ්‍රාම වැටුප් අරමුදලට මාරු කරනු ලැබේ. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සහ විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

විශ්වවිද්‍යාලය සෑම සේවකයෙක්ගේම වැටුප් සහ දීමනාවලින් 3%ක් සේවක භාර අරමුදලට දායක කරනු ලබන අතර මෙම අරමුදල නිර්මිත දායකත්ව සැලැස්ම යටතේ වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

නිර්මිත දායකත්ව සැලැසුම් වෙත සිදු කරන දායකත්වය සඳහා වූ බැඳීම් ඒවා මතු වන විට සහ මතු වන අවස්ථාවල දී මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ වියදමක් ලෙස වට්ටම් නොකළ පදනම මත හඳුනා ගනු ලැබේ.

**2.3.17 බදු අය කිරීම්**

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 9 (1) වගන්තිය අනුව වි විශ්වවිද්‍යාලය බදු ගෙවීමෙන් නිදහස් කර ඇත.

**2.3.18 වගකීම් සහ අවිනිශ්චිත වගකීම්**

සියලුම වැදගත් වගකීම් සහ අවිනිශ්චිත බැරකම් සැලකිල්ලට ගනු ලබන අතර අවශ්‍ය අවස්ථාවල දී මෙම මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

(අ) ශ්‍රේෂ්ඨාධිකරණ නඩු කටයුතු

**(i)** SC (F/R) අංකය 249/2021 විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරියක් එම සේවයේ නිරතව සිටිය දී දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ (PGIIM) සිය අධ්‍යය කටයුතු සම්පූර්ණ කිරීම සඳහා වැටුප් සහිත නිවාඩු ප්‍රදානය කරන ලෙසට ඉල්ලමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කර ඇති නඩුවකි. කෙසේවුව ද, නඩු තීන්දුව මත මූල්‍ය වන්දි සහ නීති ගාස්තු ගෙවීමට සිදු වනු ඇත. 2023.12.31 වැනි දින වන විට බැඳීම් නිරාකරණය කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ හෝ විභව සේවා අන්තර්ගත සම්පත් පිටතට ගලා යාම අවශ්‍ය කිරීමක් සිදු නොවීය. කිසිදු විධිවිධානයක් හඳුනා නොගනී.

(ii) SC (SPL.) L.A අංකය 245/2020 කථිකාචාර්යවරයෙක් අභියාචනාධිකරණය මඟින් ලබා දුන් තීණ්දුවකට එරෙහිව ගොනු කර ඇති නඩුවකි. ඔහු ප්‍රමාණවත් ලකුණු ලබා ගෙන නොමැති බවට සඳහන් කරමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නිකුත් කළ 1997 දෙසැම්බර් 12 වැනි දිනැති අංක 723 දරන චක්‍රලේඛයේ සඳහන් කර ඇති බඳවා ගැනීමේ පටිපාටියට අනුව තමාව ආශ්‍රිත මහාචාර්ය/ මහාචාර්ය තනතුරට උසස් කිරීම ප්‍රදානය නොකිරීම සම්බන්ධයෙන් කැළණිය විශ්වවිද්‍යාලය විසින් ගන්නා ලද තීරණයට එරෙහිව එකී කථිකාචාර්යවරයා අභියාචනය කිරීම මෙම මූලික නඩුකරයේ නඩු නිමිත්ත වේ. කෙසේවුව ද, නඩු තීණ්දුව මත මූල්‍ය වන්දි සහ නීති ගාස්තු ගෙවීමට සිදු වනු ඇත. 2023.12.31 වැනි දින වන විට බැඳීම් නිරාකරණය කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ හෝ විභව සේවා අන්තර්ගත සම්පත් පිටතට ගලා යාම අවශ්‍ය කිරීමක් සිදු නොවීය. කිසිදු විධිවිධානයක් හඳුනා නොගනී.

(iii) SC (F/R) අංකය 216/2020 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දී සිදු වී ඇති නවක වධය සිදුවීමක් මත ගොනු කළ නඩුවක් වන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂයපථයට ඇතුළත් වන මෙම විශ්වවිද්‍යාලය ඇතුළු සියලුම විශ්වවිද්‍යාල 16ම මෙම නඩුකරයේ වගඋත්තරකරුවන් කර ඇත. 2023.12.31 වැනි දින වන විට බැඳීම් නිරාකරණය කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ හෝ විභව සේවා අන්තර්ගත සම්පත් පිටතට ගලා යාම අවශ්‍ය කිරීමක් සිදු නොවීය. කිසිදු විධිවිධානයක් හඳුනා නොගනී.

(ආ) **දිස්ත්‍රික්ක උසාවි නඩු කටයුතු**

(i) නඩු අංක 6412/M මෙම ආයතනයේ මීට පෙර තිබූ ආයතනය වන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ හිටපු අධ්‍යක්ෂවරයෙක් එම ධූරය දරන කාලය තුළ සිදු කළ නිල කටයුත්තක් සම්බන්ධයෙන් එම අධ්‍යක්ෂවරයාට එරෙහිව කථිකාචාර්යවරයෙක් විසින් ගොනු කළ නඩුකරයක් වේ. මෙම නඩුවෙන් රු. 50,000,000/-ක වන්දියක්, නෛතික පොලිය සහ නීති ගාස්තු ඉල්ලා ඇත. කෙසේවුව ද, නඩු තීන්දුව මත මූල්‍ය වන්දි සහ නීති ගාස්තු ගෙවීමට සිදු වනු ඇත. 2023.12.31 වැනි දින වන විට බැඳීම් නිරාකරණය කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ හෝ විභව සේවා අන්තර්ගත සම්පත් පිටතට ගලා යාම අවශ්‍ය කිරීමක් සිදු නොවීය. කිසිදු විධිවිධානයක් හඳුනා නොගනී.

(ඇ) විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලය ඉදිරියේ ඇති නඩුකර

(i) USAB 1033, USAB 1034, සහ USAB 1035 කථිකාචාර්යවරු තිදෙනෙක් විසින් තවත් නඩුකර හයක් විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලයේ ගොනු කර ඇති අතර (එක් කථිකාචාර්යවරයෙක් දැනටමත් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ නඩුවක් ගොනු කර ඇත) එවකට ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය (GWAI) මඟින් පවත්වන ලද සහ කැළණිය විශ්වවිද්‍යාලය මඟින් ප්‍රදානය කරන ලද කායචිකිත්සාව පිළිබඳ විද්‍යාපති උපාධිය සුදුසුකම මත පදනම්ව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය තනතුර සඳහා ඔවුන්ගේ උසස්වීම ප්‍රදානය කරන ලෙසට ඉල්ලා ගොනු කර ඇති නඩුකටයුතු තුනකි. 2023.12.31 වන විට විශ්වවිද්‍යාලයට එකී කථිකාචාර්යවරුන් තිදෙනාට වන්දි ප්‍රදානය කිරීම සඳහා USAB මඟින් ප්‍රදානය කළ නියෝග තුනක් ලැබී ඇත. USAB මඟින් ප්‍රදානය කළ නියෝග සලකා බලා, පාලක සභාව 2023.12.08 වැනි පැවති එහි 32වැනි රැස්වීමේ දී ඉහත සඳහන් කළ සුදුසුකම් සම්පූර්ණ කිරීමේ කොන්දේසිය මත, 2019 මැයි 29 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය තනතුර සඳහා ඔවුන්ගේ උසස්වීම ප්‍රදානය කිරීමටත් වැටුප් හිඟය ගෙවීමටත් තීරණය කරන ලදී. 2023.12.31 වැනි දින වන විට බැඳීම් නිරාකරණය කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ හෝ විභව සේවා අන්තර්ගත සම්පත් පිටතට ගලා යාම අවශ්‍ය කිරීමක් සිදු නොවීය. කිසිදු විධිවිධානයක් හඳුනා නොගනී.

(ii) USAB 1035 (a) ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ සේවය කරන අතරතුර කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ විද්‍යාපති උපාධිය (පූර්ණ කාලීන අධ්‍යයන) සම්පූර්ණ කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලය ඉදිරියේ ගොනු කරන ලද නඩුවකි. ඇයට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඇයට පිළිගත හැකි විසඳුමක් ලැබී ඇති බැවින් ඇය මෙම කටයුත්ත ඉල්ලා අස්කර ගෙන ඇත. ඒ අනුව විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලය එම කරුණ ඉල්ලා අස්කර ගැනීමට අවසරය ලබා දී ඇත.

USAB 1033 (a), සහ USAB 1034 (a) කථිකාචාර්යවරු දෙදෙනෙක් ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ සේවය කරන අතරතුර කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ විද්‍යාපති උපාධිය (පූර්ණ කාලීන අධ්‍යයන) සම්පූර්ණ කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලය ඉදිරියේ ගොනු කරන ලද නඩු කටයුතු දෙකකි. මෙම නඩු කටයුතු දෙක විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලය ඉදිරියේ විභාගවෙමින් පවතින අතර තීන්දුව මත පදනම්ව මූල්‍ය වන්දියක් ගෙවීමට සිදු වනු ඇත. 2023.12.31 වැනි දින වන විට බැඳීම් නිරාකරණය කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ හෝ විභව සේවා

අන්තර්ගත සම්පත් පිටතට ගලා යාම අවශ්‍ය කිරීමක් සිදු නොවීය. කිසිදු විධිවිධානයක් හඳුනා නොගනී.

## 2.4 මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය

### 2.4.1 ආදායම හඳුනා ගැනීම

විශ්වවිද්‍යාලය 2022.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි SLIPSAS II වෙළුමේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති-හුවමාරු නොකරන ගනුදෙනුවලින් ආදායම (බදු සහ මාරු කිරීම්) SLIPAS II අනුව ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් විකල්ප ගිණුම්කරණ ප්‍රතිකාර යොදා ගෙන ඇති අතර පසු ගිය වර්ෂයේ සංඛ්‍යා ලේඛන නැවත වර්ගීකරණයන් ඒ අනුව සිදු කර ඇත.

#### (අ) හුවමාරු ගණුදෙනුවලින් ආදායම

ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා එන ප්‍රමාණයට සහ එය විශ්වාසදායක අන්දමින් මැනිය හැකි තාක් දුරට හුවමාරු ගනුදෙනුවලින් ආදායම හඳුනා ගනී. ශිෂ්‍යයින්ගෙන් ලැබූ බඳවා ගැනීමේ ගාස්තු, වාර්ෂික ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු, නේවාසිකාගාර ගාස්තු සහ වෛද්‍ය ගාස්තු, දේපළවලින් ලැබෙන කුලිය, තොග අලෙවිය, ණය සහ අත්තිකාරම්වලින් ලැබෙන පොලිය, ආයෝජනවලින් ලැබෙන පොලිය ආදිය ලියාපදිංචිය නිමා කරන අවස්ථාවේ ආදායම සහ ලැබීමේ පදනම මත ආදායම ලෙස හඳුනා ගනී.

විභාග, සම්මන්ත්‍රණ, පාඨමාලා සහ වෙනත් අධ්‍යාපනික කටයුතු පැවැත්වීම සඳහා වූ ගාස්තු වැනි හුවමාරු ගනුදෙනුවලින් ආදායම එවැනි කටයුතු අවසන් කළ විට ආදායම ලෙස හඳුනා ගනී.

ස්වයං-මූල්‍ය වැඩසටහන් වැනි හුවමාරු ගනුදෙනුවලින් ආදායම වර්ෂය අවසානයේ දී එවැනි පාඨමාලා නිමා කළ අදියර මත පදනම්ව ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනී. අනාගත කාලපරිච්ඡේදවලට සම්බන්ධ දේශන ගාස්තු සහ ගෙවීම් ප්‍රවර්තන වගකීම් යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත. තව ද පොළී ආදායම සහ කුළී ආදායම උපචිත පදනම මත හඳුනා ගනී.

#### (ආ) හුවමාරු නොවන ගණුදෙනුවලින් ආදායම

ශ්‍රී ලංකා ආණ්ඩුවේ මහා භාණ්ඩාගාරයෙන් ලැබූ ප්‍රදාන වැනි හුවමාරු නොවන ගණුදෙනුවලින් ලැබූ ආදායම ආදායම ලෙස හඳුනා ගනී. පාර්ලිමේන්තුව මඟින් මූල්‍ය වර්ෂය සඳහා විසර්ජන පනත සම්මත කරනු ලබන අවස්ථාවේ දී අරමුදල් හිමිකාරත්වය ස්ථාපිත කරනු ලැබේ. හඳුනාගත් ආදායම ප්‍රමාණයට වාර්තා කරන දිනයට පෙර නිල වශයෙන් අනුමත කළ වර්ෂය සඳහා වූ විසර්ජන (පරිපූරක ඇස්තමේන්තු) පනතේ අනුමත කළ මුදල් යෙදවීම් සඳහා සිදු කළ යම් සංශෝධන සහ වෙනත් අරමුදල් ගැලපීම් සැලකිල්ලට ගනු ලැබේ.

ඒවාට අමතරව උසස් අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම සහ සංවර්ධනය වේගවත් කිරීම, අතිරේක ශිෂ්‍ය බඳවා ගැනීම පහසු කිරීම සඳහා අවශ්‍ය අතිරේක යටිතලපහසුකම් සඳහා වූ ලෝක බැංකු ව්‍යාපෘතිය වැනි වෙනත් අරමුදල් නියෝජිතායතනවලින් ලැබෙන ප්‍රදාන ආදිය හුවමාරු නොවන ගණුදෙනු ලෙස හඳුනා ගෙන ඇති අතර ආදායම ලෙස හඳුනා ගනී.

පරිත්‍යාග සහ උපපාදන හුවමාරු නොවන ගණුදෙනු විෂයක් වන අතර ඒවා භාවිතා කිරීම පිළිබඳ සීමා තිබිය හැකිය. පරිත්‍යාග සම්බන්ධයෙන් වන විට ඒවා සම්බන්ධයෙන් කාර්යසාධනය ආශ්‍රිත කොන්දේසි ද තිබිය හැකිය. සියලුම අවස්ථාවල දී ආදායම විශ්වාසදායක ලෙස මැනිය හැකි, ආදායමේ ලැබීම නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි සහ ලැබීම සිදු විය හැකි බවට සැලකිය හැකි අවස්ථාවල දී ආදායම හඳුනා ගනී. ශුන්‍ය හෝ නාමික ප්‍රතිශ්ඨාවක් වෙනුවෙන් භෞතික වත්කමක් අත්කර ගෙන ඇති අවස්ථාවක දී වත්කමේ පාලනය විශ්වවිද්‍යාලයට මාරු වූ විට වත්කමේ සාධාරණ වටිනාකම හඳුනා ගනී.

පසු කාලීන කාලපරිච්ඡේදවල දී වියදම් කරන වත්කම් අත්කර ගැනීමට උපයෝජනය කළ රජයේ ප්‍රදාන/ වෙනත් ප්‍රදාන (අතිරේක ශිෂ්‍ය බඳවා ගැනීම යටතේ ලැබුනු ප්‍රදාන) විලම්භිත ආදායම (වියදම් නොකළ ප්‍රාග්ධනය) ලෙස හඳුනා ගනී. මුදල් හා මුදල් සමාන දෑ, අඩු වගකීම් (ලැබූ ප්‍රදාන සම්බන්ධ වගකීම් හැරුණු කොට) ඇතුළු වෙනත් වත්කම්වලින් නිරූපණය කරන රජයේ ප්‍රදාන වගකීම් ලෙස හඳුනා ගනී.

### 2.4.2 වියදම හඳුනා ගැනීම

වියදම්, දැරූ පිරිවැය සහ ආදායමේ නිශ්චිත අයිතමවල ඉපැයීම් අතර ඍජු සම්බන්ධතාව මත පදනම්ව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවල හඳුනා ගනු ලැබේ. ව්‍යාපාර කටයුතු ඉටු කිරීමේ දී සහ දේපළ, පිරියත හා උපකරණ කාර්යක්ෂම තත්ත්වයකින් පවත්වා ගෙනයාමේ දී දැරූ සියලුම වියදම් මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත. මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා විශ්වවිද්‍යාලයේ කාර්යසාධනයේ ලක්ෂණ සාධාරණය ඉදිරිපත් කිරීමේ පදනම මත “වියදම් කටයුතු” ක්‍රමය යොදා ගෙන ඇත.

සියලුම වැදගත් වගකීම් සහ අවිනිශ්චිත වගකීම් සලකා බලන අතර අවශ්‍ය අවස්ථාවල දී මෙම මූල්‍ය ප්‍රකාශනවල වෙනස්කම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

### 2.4.3 ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනු

විශ්ව විද්‍යාලය සාමාන්‍ය ව්‍යාපාර ගනුදෙනු සිදු කරනුයේ අතේ දිග පදනම මත අදාළ පාර්ශ්ව සමඟ වාණිජ අනුපාතයට ය.

#### (අ) ප්‍රධාන කළමනාකරණ නිලධරයින් සමඟ ගනුදෙනු (KMP)

ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් යනු විශ්වවිද්‍යාලයේ කටයුතු සැලසුම් කිරීම, විධානය කිරීම සහ පාලනය කිරීම සඳහා ඍජු හෝ වක්‍ර අධිකාරියක් සහ වගකීමක් ඇති තැනැත්තන් වේ. ඒ අනුව, පාලක සභාවේ සාමාජිකයින් සහ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් සමූහය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන කළමනාකරණ නිළධරයින් (KPM) ලෙස හඳුනා ගෙන ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින් ගන්නා කිසියම් තීරණයකට යුක්තිසහගතව බලපෑම් කළ හැකි කිසිදු වැදගත් ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනුවක් වර්ෂය තුළ දී සිදු වී නොමැත. සමාලෝචිත වර්ෂය තුළ දී පාලක සභාවේ සාමාජිකයින් සහ ජ්‍යෙෂ්ඨ විධායක නිළධරයින් සඳහා වැටුප් සහ දීමනා ලෙස රු. මිලියන 34.5ක් ගෙවා ඇත.

#### (ආ) ප්‍රධාන කළමනාකරණ නිලධරයින්ගේ සමීප පවුල් සාමාජිකයින් සමඟ ගනුදෙනු (KMP)

සමීප පවුලේ සාමාජිකයන් සහකරු හෝ යැපෙන්නන් ලෙස අර්ථ දැක්වේ. යැපෙන්නෙකු යනු ඔහුගේ/ඇයගේ මූල්‍ය අවශ්‍යතාවලින් 50% කට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා අදාළ පාලක සභා සාමාජිකයෙක් මත යැපෙන ඕනෑම අයෙකි. මෙම මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන් විසින් ගනු ලබන ඕනෑම තීරණයකට සාධාරණ ලෙස බලපානු ලබන KMP හි සමීප පවුලේ සාමාජිකයින්ගේ ගනුදෙනුව සම්බන්ධයෙන් කිසිදු වැදගත්කමක් වසර තුළ ඇතුළත් කර නොමැත.

### 2.4.4 අවදානම් කළමනාකරණය

මූල්‍ය වාර්තා අවශ්‍යතා, ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූල වීම, අභ්‍යන්තර පාලනවල සඵලතාවය සහ විශ්වවිද්‍යාලයට බලපාන අවදානම් සහ අවදානම් සාධක නිරීක්ෂණය කිරීම සඳහා පාලක සභාව මගින් විගණන කමිටුවක් පත් කර ඇත.

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| | 2023 | 2022 |
|---|---|---|
| | රු. | රු. |
| **සටහන - 02** | | |
| **මුදල් හා මුදල් සමාන දෑ** | | |
| බැංකු ශේෂය | | |
| ගිණුම් අංකය333-1001-1-0000059 | 6,119,640 | 5,781,177 |
| ගිණුම් අංකය 333-1002-0-0000059 | 5,007,721 | 1,840,622 |
| ගිණුම් අංකය333- 1001-200-64705 | 2,134,542 | 4,426,481 |
| | **13,261,903** | **12,048,280** |
| **සටහන - 03** | | |
| **වෙනත් ලැබීම්** | | |
| ශිෂ්‍යාධාර වාරික ලැබීම්-UGC | 1,444,000 | 2,380,430 |
| | **1,444,000** | **2,380,430** |
| **සටහන- 04** | | |
| **ණය සහ කාර්ය මණ්ඩලයට අත්තිකාරම්** | | |
| ආපදා ණය | 19,363,555 | 18,824,764 |
| කාර්ය මණ්ඩල ණය | 87,890 | 100,470 |
| වාහන ණය | 573,129 | 690,440 |
| පරිගණක ණය | 414,000 | 507,000 |
| විශේෂ අත්තිකාරම් | 400 | - |
| උපකුලපති අරමුදල් ණය | 9,470 | - |
| උත්සව අත්තිකාරම් | 25,000 | 10,000 |
| | **20,473,444** | **20,132,674** |
| **සටහන- 05** | | |
| **ගබඩා අත්තිකාරම්** | | |
| ගබඩා අත්තිකාරම් ගිණුම (භාණ්ඩ ලැයිස්තුව) | 12,225,751 | 5,315,202 |
| | **12,225,751** | **5,315,202** |
| **සටහන- 06** | | |
| **පූර්ව-ගෙවීම්** | | |
| ගෙවූ කුලිය | - | 293,320 |
| ගෙවූ රක්ෂණ වාරිකය | 159,541 | 82,720 |
| කොන්ත්‍රාත් සේවා | 396,341 | 85,638 |
| CGR | 9,300 | - |
| | **565,182** | **461,678** |
| **සටහන - 07** | | |
| **වෙනත්** | 138,500 | 138,500 |
| තැන්පතු - ඉන්ධන | 3,000 | 3,000 |
| ආහාර | 511,395 | 511,395 |
| විදුලිය | 43,768 | 43,768 |
| ගෑස් සිලින්ඩර | 276,000 | 276,000 |
| ජලය | - | 1,500 |
| ඩයලොග් රූපවාහිනිය | 18,000 | 18,000 |
| - වයිෆයි රවුටරය | 3,269 | - |
| ලැබිය යුතු ආපනශාලා ගාස්තු | 2,000 | 1,000 |
| ආයෝජනවලින් ලැබිය යුතු පොලිය | 27,526,296 | 32,356,782 |
| නේවාසිකාගාර ගාස්තු ලෙද ලැබිය යුතු දේ | 240,000 | 299,000 |
| ලැබිය යුතු දේ - AHEAD ව්‍යාපෘතිය | 432,850 | |
| විවිධ අත්තිකාරම් | 91,353 | - |
| යෝග ඩිප්ලෝමාවෙන් ලැබීම් 2021/2022 | - | 5,149 |
| නිල දුරකථන සඳහා ආපසු ගෙවිය යුතු තැන්පතු | 14,000 | 14,000 |
| | **29,300,431** | **33,668,094** |

සටහන - 8 - දේපළ, පිරියත හා උපකරණ

පිරිවැය / ගණනය කිරීම

<u>සින්නක්කර වත්කම්</u>

රු.

| | ඉඩම | ගොඩනැගිලි | කාර්යාල උපකරණ | විද්‍යාගාර හා තාක්ෂණික උපකරණ | ගෘහභාණ්ඩ හා සවිකිරීම | පුස්තකාල පොත් සහ වාරසඟරා | මෝටර් රථ | පිරියත හා යන්ත්‍රසූත්‍ර | ලෝගු | සවිකිරීම සහ තිරවුරු | පරිගණක උපකරණ හා මෙවලම් | ක්‍රීඩා භාණ්ඩ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2023.01.01 දිනට ශේෂය | 236,000,000 | 384,550,744 | 82,979,302 | 21,835,820 | 56,568,878 | 16,489,876 | 38,432,828 | 32,388,629 | 1,055,000 | 1,640,965 | 7,200,817 | 797,350 | **879,940,209** |
| | | | | | | | - | | - | | | | - |
| එකතුව*1 | - | 77,505,354 | 7,425,361 | 6,351,751 | 13,172,310 | 4,703,310 | 4,017,900 | 1,111,758 | - | - | 18,212,750 | 5,326,365 | 137,826,859 |
| බැහැරකිරීම | - | | | | | (317,138) | | | | | | | (317,138) |
| පරිත්‍යාග*2 | | 300,000 | 4,757,000 | 52,220,052 | 6,910,592 | 151,112 | - | 7,473,014 | | | 23,729,526 | | 95,541,296 |
| WIP වලින් මාරු කිරීම | | 158,345,588 | | | | | | | | | | | 158,345,588 |
| ගැලපීම | | (1,190,894) | - | - | - | - | - | (32,388,629) | - | - | - | - | (33,579,523) |
| ප්‍රත්‍යාගණන*3 | | | - | - | - | | | 21,724,480 | | | | | 21,724,480 |
| **2023.12.31 දිනට ශෙෂය** | **236,000,000** | **619,510,792** | **95,161,663** | **80,407,623** | **76,651,780** | **21,027,160** | **42,450,728** | **30,309,252** | **1,055,000** | **1,640,965** | **49,143,093** | **6,123,715** | **1,259,481,772** |

**සමුච්චිත ක්ෂයවීම්**

| | ඉඩම | ගොඩනැගිලි | කාර්යාල උපකරණ | විද්‍යාගාර හා තාක්ෂණ උපකරණ | ගෘහභාණ්ඩ හා සවිකිරීම | පුස්තකාල පොත් සහ වාරසඟරා | මෝටර් රථ | පිරියත හා යන්ත්‍රසූත්‍ර | ලෝගු | සවිකිරීම සහ තිරවුරු | පරිගණක උපකරණ හා මෙවලම් | ක්‍රීඩා භාණ්ඩ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2023.01.01 දිනට ශේෂය | - | 62,523,502 | 25,879,349 | 3,495,598 | 3,169,245 | 15,205,432 | 20,546,611 | 19,239,580 | 227,710 | 39,155 | 114,025 | 16,234 | **150,456,441** |
| වර්ෂය සඳහා අයකිරීම් | - | 22,315,888 | 17,584,320 | 13,338,877 | 6,398,350 | 3,413,804 | 7,906,925 | 2,734,717 | 211,000 | 286,193 | 10,312,852 | 404,535 | 84,907,460 |
| ඉවත් කළ දෑ | - | | | | | (317,138) | | | | | | | (317,138) |
| ගැලපීම | | | | | | | | (19,239,580) | | | | | (19,239,580) |
| ප්‍රත්‍යාගණනය සඳහා ඉවත් කිරීම -එකතු කරන්න*4 | | | | - | | | - | | | | | | - |
| **2023.12.31 දිනට ශේෂය** | **-** | **84,839,390** | **43,463,669** | **16,834,475** | **9,567,595** | **18,302,098** | **28,453,536** | **2,734,717** | **438,710** | **325,348** | **10,426,877** | **420,769** | **215,807,184** |
| **2022.12.31 දිනට ධාරක අගය** | 236,000,000 | 322,027,242 | 57,099,953 | 18,340,222 | 53,399,633 | 1,284,444 | 17,886,216 | 13,149,049 | 827,290 | 1,601,810 | 7,086,791 | 781,116 | 729,483,768 |
| **2023.12.31 දිනට ධාරක අගය** | **236,000,000** | **534,671,403** | **51,697,995** | **63,573,148** | **67,084,185** | **2,725,062** | **13,997,192** | **27,574,535** | **616,290** | **1,315,617** | **38,716,216** | **5,702,946** | **1,043,674,588** |

20

## PPE දේපළ, පිරියත සහ උපකරණ සඳහා සටහන්

1. තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් 2020 වර්ෂයේ දී (අත්කර ගෙන ඇති නව පරිපාලන ගොඩනැගිල්ල සහ දේපළ හැරුණු කොට) දේපළ, ගොඩනැගිලි සහ මෝටර් රථ ප්‍රත්‍යාගණනය කරන ලදී. 2021 වර්ෂයේ දී කාර්යාල උපකරණ, විද්‍යාගාර හා ශික්ෂණ උපකරණ, ගෘහභාණ්ඩ හා සවිකිරීම් ආදියට සම්බන්ධ අනෙකුත් වත්කම්වල වටිනාකම් ප්‍රත්‍යාගණනය කරන ලදී. මෙයට අමතරව, 2023 ජනවාරි 01 වැනි දින වන විට පිරියත සහ යන්ත්‍රසූත්‍රවල ගැලපීම් සහ ප්‍රත්‍යාගණයක් 2023 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් විය.
2. 2022 වර්ෂයේ දී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අත්කර ගැනීමෙන් අනතුරුව 2022 දී තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් රු. මිලියන 10කට ප්‍රත්‍යාගණනය කර, ලේඛනගත කළ අංක WP-KL-6080 දරන මෝටර් රථය.
3. සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් 2022 සහ 2023 වර්ෂවල දී පහත දැක්වෙන වාහන විශ්වවිද්‍යාලයට මාරු කර ඇත: 43-5982, NA-7543, 60-7068, LW-0703, 50-7755, 42-0508, KC-3400, PB-7047, 254-1179, LB-1909, GK-9639, සහ 64-2308. මෙයට අමතරව, වර්ෂය තුළ දී උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ සමාජ සවිබල ගැන්වීම් සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය මඟින් අංක KU-4329 සහ KA-9412 දරන වාහන ලබා දී ඇත. එම වාහනවල හිමිකාරත්වය මාරු කිරීමේ ක්‍රියාවලිය තවමත් සිදු කරමින් ඇත. එහි වාහනවල හිමිකාරත්වය විශ්වවිද්‍යාලය වෙත මාරු කිරීමෙන් අනතුරුව ඒවා ප්‍රත්‍යාගණනය කර, මූල්‍ය ප්‍රකාශනවල වාර්තාගත කරනු ලැබේ.

21

| | 2023 | 2022 |
|---|---|---|
| | රු. | රු. |
| **සටහන - 09** | | |
| **කෙරී ගෙන යන වැඩ** | | |
| අධ්‍යයන ගොඩනැගිල්ල | - | 140,405,078 |
| තෙමහල් ගොඩනැගිල්ල ඉතිරි වැඩ | - | 13,199,278 |
| නානකාමර සංකීර්ණය | - | 4,154,232 |
| ශිෂ්‍යයින් සඳහා නව ආපනශාලාව | - | 587,000 |
| බිත්ති අල්මාරි සවිකිරීම | 785,230 | 785,230 |
| පටක රෝපණ විද්‍යාගාරය | 4,662,063 | - |
| ඉඩම් අත්කර ගැනීම - වන්දි ගිණුම | 4,393,825 | - |
| | **9,841,118** | **159,130,818** |
| **සටහන - 10** | | |
| **අස්පර්ෂණීය වත්කම්** | | |
| ආරම්භයේ දී ශේෂය | 1,549,633 | 157,283 |
| වසර තුළ දී එකතු කිරීම් | 1,555,425 | 1,646,634 |
| අඩු කළා. වසර තුළ දී අය කිරීම | (432,949) | (254,284) |
| | **2,672,109** | **1,549,633** |
| **සටහන - 11** | | |
| **මානව ප්‍රාග්ධන සංවර්ධනය** | | |
| වර්ෂය ආරම්භයේ දී ශේෂය | 221,607 | 170,500 |
| වර්ෂය අතරතුර එකතු කිරීම් | 3,117,593 | 120,000 |
| අඩු කළා. වර්ෂය තුළ දී අය කිරීම් | (3,339,200) | (68,893) |
| | **-** | **221,607** |
| **සටහන- 12** | | |
| **සමුච්ජිත වියදම්** | | |
| විදුලි බලය | 2,935,713 | 880,951 |
| ජලය | 873,416 | 199,055 |
| දුරකථන | 958,248 | 575,991 |
| වෙනත් පුනරාවර්තන | - | 11,730 |
| ක්‍රීඩා කටයුතු | 38,813 | - |
| බාහිර කථිකාචාර්ය ගාස්තු | 1,700,544 | 38,137 |
| ඉන්ධන | 842,464 | 141,848 |
| ප්‍රවාහනය | 16,750 | - |
| අතිකාල | 787,270 | 689,960 |
| විභාග ගාස්තු | 1,525,850 | 584,347 |
| නඩත්තු වියදම් - වාහන | 2,109,000 | 1,879,975 |
| සුරකුම්පත් | 2,200,000 | 1,695,098 |
| පුවත්පත් | 198,555 | - |
| නඩත්තු පිරියත හා යන්ත්‍රෝපකරණ | 1,172,805 | 109,362 |
| පිරිසිදු කිරීමේ සේවා | 1,900,000 | 1,191,318 |
| අනුපාත සහ බදු | 1,379,022 | 1,360,989 |
| කුලිය | 4,323,940 | 14,635,391 |
| වැටුප් | 65,450 | - |
| වෙනත් සේවා | - | 513,774 |
| මුද්‍රණ ගාස්තු | - | 2,588 |
| නිවාඩු ගෙවීම් | 381,229 | 162,536 |
| විශේෂ සේවාවන් | 188,936 | - |
| E.T.F. අරමුදල | 20,016 | 235,561 |
| UPF | 152,697 | - |
| වැඩමුළුව | - | 11,786 |
| | **23,770,719** | **24,920,397** |

| | 2023 | 2022 |
|---|---|---|
| | රු. | රු. |
| **සටහන- 13** | | |
| **කළ යුතු ගෙවීම්** | | |
| **සැපයුම් ණයකරු** | | |
| සීමාසහිත ජෝන් කීල්ස් කාර්යාලය (පුද්) සමාගම | - | 3,675,000 |
| අබාන්ස් පීඑල්සී | 473,975 | - |
| හෙම්සන් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම | 304,593 | - |
| නිස්සිකෝ හෝල්ඩින්ග්ස් | - | 162,730 |
| G M N ජයසූරිය | - | 2,250 |
| සීමාසහිත මයික්‍රොටෙක් බයොලෝජිකල් (පුද්) සමාගම | - | 1,203,391 |
| ජයසිංහ සැපයුම්කරුවෝ | - | 2,235,000 |
| සීමාසහිත ඇවෝන් ෆාමාකෙම් (පුද්) සමාගම | - | 8,513,061 |
| සිරිලුක්හාඩ්වෙයාර් ස්ටෝර්ස් | - | 124,990 |
| දයානි ට්‍රේඩින් | 244,935 | 342,250 |
| රාජා එන්ටර්ප්‍රයිසස් | 2,497,175 | 1,628,350 |
| සේරු එන්ටර්ප්‍රයිසස් | - | 270,400 |
| අයිස් ටෙක්නොලොජීස් (පුද්) සමාගම | - | 220,000 |
| ස්වර්ණ කැලුම් | - | 122,745 |
| ටෙක්නෝ ෆර්මස් (පුද්) සමාගම | - | 80,100 |
| රමින්දි එන්ටර්ප්‍රයිසස් | - | 202,308 |
| තිස්ස බිල්ඩර්ස් පුද්ගලික සමාගම | 4,065,423 | - |
| | **7,586,101** | **18,782,575** |
| **සටහන - 14** | | |
| **ආපසු ගෙවිය යුතු තැන්පතු සහ වෙනත්** | | |
| **ආපසු ගෙවිය යුතු තැන්පතු** | | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 1,408,363 | 657,623 |
| **වෙනත්** | | |
| ඉදිකිරීම්/ සැපයුම් සඳහා රඳවාගැනීම් | 8,041,525 | 9,740,981 |
| ගෙවිය යුතු පාරිතෝෂිකය | 1,000,347 | - |
| යෝග VII ඩිප්ලෝමාව | - | 587,905 |
| විද්‍යාපති 2013/2014 | - | 49,780 |
| විද්‍යාපති කොටස 11 2013/2014 | - | 29,780 |
| විද්‍යාපති පංචකර්ම 2013/2014 | - | 97,000 |
| විද්‍යාපති කායචිකිත්සාව 2013/2014 | - | 100,000 |
| පංචකර්ම ඩිප්ලෝමාව - 2015 | - | 53,445 |
| පංචකර්ම ඩිප්ලෝමාවa - 2016/2017 | - | 786,818 |
| කායචිකිත්සාව ඩිප්ලෝමාවa - 2016/2017 | - | 73,000 |
| කායචිකිත්සාව ඩිප්ලෝමාවa - 2015 * | - | 110,000 |
| ශල්‍යතන්ත්‍රය ඩිප්ලෝමාවra 2016/2017 | - | 1,294,214 |
| ශල්‍යතන්ත්‍රය ඩිප්ලෝමාවa-03 | - | 1,753,023 |
| යෝග සහතිකපත්‍ර පාඨමාලාවga -30 | - | 49,000 |
| කායචිකිත්සාව ඩිප්ලෝමාව- 2017/2018 | 31,622 | 243,207 |
| කායචිකිත්සාව ඩිප්ලෝමාව - 2018/2019 | 788,149 | 1,479,299 |
| පංචකර්මය ඩිප්ලෝමාව - 2017/2018 | 424,583 | 1,233,748 |
| පංචකර්මය ඩිප්ලෝමාව - 2018/2019 | 422,234 | 1,135,362 |
| එම්. ඒ. ඒ. අයි. පිළිබඳ ඩිප්ලෝමාව- 2018/2019 | 1,517,974 | 1,867,965 |
| විගණන ගාස්තු සඳහා වෙන් කිරීම | 1,339,156 | 1,217,156 |
| මුද්දර ගාස්තු | 25,200 | 21,525 |

23

| | 2023 | 2022 |
|---|---|---|
| | රු. | රු. |
| යෝග විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව 2021/2022 | - | 80,051 |
| යෝග පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව-ශිෂ්‍ය කණ්ඩායම 1 | - | 50,000 |
| ආයුර්වේද ඖෂධවේදය පිළිබඳ ඩිප්ලෝමාවy 2021/2022 | - | 27,351 |
| කායචිකිත්සාව පිළිබඳ විද්‍යාපති 2021/2022 | 3,985,959 | 5,717,014 |
| ශල්‍යකර්ම පිළිබඳ විද්‍යාපති 2021/2022 | - | 71,501 |
| කායචිකිත්සාව පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාව 2021/2022 | 1,497,064 | 1,602,148 |
| ශල්‍යතන්ත්‍ර පිළිබඳ පශ්චාත්උපාධි ඩිප්ලෝමාව 2021/2022 | 283,777 | 688,283 |
| කළමනාකරණය පිළිබඳ විද්‍යාපති/කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප | 3,469,949 | 9,599,235 |
| කළමනාකරණය පිළිබඳ විද්‍යාපති/කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප | 4,248,567 | 9,900,667 |
| යෝග පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව-ශිෂ්‍ය කණ්ඩායම 11 | - | 770,500 |
| කළමනාකරණය පිළිබඳ විද්‍යාපති-2023 | 6,067,235 | 701,000 |
| කායචිකිත්සාව පිළිබඳ විද්‍යාපති -2023 | 2,236,069 | 96,000 |
| කළමනාකරණය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාව2023 | - | 98,000 |
| කායචිකිත්සාව පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාව 2023 | 634,873 | 98,000 |
| පංචකර්මය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාව 2023 | - | 95,000 |
| ශල්‍යතන්ත්‍රය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාව 2023 | 2,087,882 | 148,000 |
| ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව-2023 | - | 167,500 |
| යෝග2023 - B III | 86,902 | - |
| යෝග 2023 - B IV | 610,600 | - |
| යෝග 2024 - B V | 128,000 | - |
| SPA කළමනාකරණය - FIHST | 360,246 | - |
| යෝග ඩිප්ලෝමාව | 8,000 | - |
| පංචකර්මය පිළිබඳ පශ්චාත් උපාධි B III | 22,000 | - |
| කායචිකිත්සාව පිළිබඳ පශ්චාත් උපාධි 2024 | 10,000 | - |
| ශල්‍යතන්ත්‍රය පිළිබඳ පශ්චාත් උපාධි 2024 | 28,000 | - |
| කායචිකිත්සාව පිළිබඳ පශ්චාත් උපාධි 2024 | 8,000 | - |
| ජෛව වෛද්‍ය විද්‍යාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 528,350 | - |
| උසස් විශ්ලේෂණ උපකරණ පිළිබඳ ඩිප්ලෝමාව | 628,309 | - |
| කායචිකිත්සාව පිළිබඳ විද්‍යාපති -2023/2024 | 11,670 | - |
| විද්‍යාපති MAAI /පශ්චාත් උපාධි MAAI 2023/2024 | 102,000 | - |
| වැඩමුළුව - GIS | 66,000 | - |
| වැඩමුළුව යෝග | 72,000 | - |
| ක්ෂුද්‍රජීවවිද්‍යාව පිළිබඳ වැඩමුළුව | 86,143 | - |
| යෝග වැඩමුළුව | 68,000 | - |
| වෙනත් අයට ගෙවිය යුතු මුදල් | - | 45,050 |
| පර්යේෂණ හා සංවර්ධන සඳහා ගෙවීම් | 1,674,400 | - |
| ගෙවිය යුතු ලියපදිංචි ගාස්තු | 102,700 | 140,000 |
| ගෙවිය යුතු පාඨමාලා ගාස්තු | 738,750 | - |
| පුස්තකාල පොත් සඳහා ගෙවීම් | 2,661,794 | - |
| මෝටර් රථ සඳහා ගෙවිය යුතු | 1,178,300 | - |
| අතිරික්තය ලෙස ලැබුනුවිශේෂ අත්තිකාරම් | - | 400 |
| ගෙවිය යුතු UPF ණය | 191 | - |
| **එකතුව** | **48,690,882** | **52,676,534** |

24

| | 2023 | 2022 |
|---|---|---|
| | රු. | රු. |
| **සටහන- 15** | | |
| **විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්** | | |
| ආරම්භයේ දී ශේෂය | 138,622,486 | 142,636,305 |
| වසර සඳහා ගෙවීම | (24,743,729) | (22,972,838) |
| වසර සඳහා ගැලපීම | (12,340,997) | (9,297,663) |
| වසර සඳහා අය කිරීම | 32,534,902 | 28,256,682 |
| | **134,072,662** | **138,622,486** |

| | 2023 | 2022 |
|---|---|---|
| **සටහන - 16** | | |
| **සීමා කළ අරමුදල් සහ ප්‍රදාන** | | |
| ජේ. පී. වික්‍රමාරච්චි පරිසංවාදය | 1,166,551 | 1,166,551 |
| සංවර්ධන ප්‍රථම උපාධි වැඩසටහන | 1,214,142 | 1,214,142 |
| පියසීලි වික්‍රමාරච්චි ජයසේකර | 72,450 | 114,450 |
| ත්‍යාග හා ප්‍රදාන | 677,596 | 640,542 |
| ක්‍රීඩා අරමුදල | - | - |
| පර්යේෂණ අරමුදල | 228,148 | 228,148 |
| උපකුලපති අරමුදල | 4,022,228 | 3,774,491 |
| උපකුලපති අරමුදල | 2,480,980 | 1,594,517 |
| එෆ්.ජී.එස්. සංවර්ධන ක්‍රියාකාරකම් | - | 623,482 |
| වික්‍රමාභිණී වැඩසටහන | 17,740 | 17,740 |
| ස්වර්ණමුදික වැඩසටහන | 300,000 | 500,000 |
| විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදල | - | 10,000 |
| වෛද්‍ය ඩී. එම්. ජයසිංහ අනුස්මරණ අරමුදල | 111,970 | - |
| වෛද්‍ය ධර්මවිජය රන් සම්මාන අරමුදල | 111,970 | - |
| වෛද්‍ය ලීලාරත්න අනුස්මරණ ශිෂ්‍යත්වය | 154,624 | 134,674 |
| ජී.පී. වික්‍රමාරච්චි අනුස්මරණ ශිෂ්‍යත්වය | 94,261 | 82,261 |
| වෛද්‍ය සිසිර වික්‍රමාරච්චි ශිෂ්‍යත්වය | 289,612 | 229,612 |
| F.G.S. අරමුදල | 1,247,384 | 485,741 |
| සංවර්ධන අරමුදල (ශල්‍යශාලකාය) | 9,000 | 9,000 |
| ස්වයං-මූල්‍යකරණ ක්‍රියාකාරකම් | - | 11,378,189 |
| බැඳුම්කරු උල්ලංඝනය කිරීම් ගිණුම් | 2,591,301 | 400,000 |
| ක්‍රීඩා ශූරතාවලිය -2022 | - | 1,347,165 |
| අන්තර්ජාතික පර්යේෂණ පරිසංවාදය -2022 | 519,059 | 501,195 |
| පීඨ සංවර්ධන අරමුදල - FIHST | 245,070 | - |
| පාඨමාලා සංවර්ධන අරමුදල | 594,109 | 177,428 |
| පුස්තකාල සංවර්ධන අරමුදල | 1,091,458 | 325,375 |
| විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදල | 61,513,664 | 2,306,233 |
| කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල | 555,188 | 210,337 |
| පර්යේෂණ කවුන්සිල අරමුදල | 1,103,510 | 604,826 |
| B.O.S.රැස්වීම | 209,958 | 144,000 |
| F.G.S.රැස්වීම | 210,000 | 108,000 |
| ප්‍රාග්ධන අයිතම මිල දී ගැනීමේ අරමුදල | 140,443 | - |
| ඉඩම් හා ගොඩනැගිලි අරමුදල - FGS | 2,601,239 | 846,052 |
| | **83,573,657** | **29,174,152** |

| | 2023 | 2022 |
|---|---|---|
| | රු. | රු. |
| **සටහන - 17** | | |
| **<u>ප්‍රත්‍යාගනන සංචිතය සහ වෙනත්</u>** | | |
| ස්ථාවර වත්කම් | 196,103,517 | 196,103,517 |
| මෝටර් වාහන ප්‍රත්‍යාගනන සංචිතය | 24,832,651 | 24,832,651 |
| ගෘහභාණ්ඩ, උපකරණ ආදිය ප්‍රත්‍යාගණනය | 18,189,616 | 9,614,184 |
| | **239,125,784** | **230,550,352** |
| **සටහන - 18** | | |
| **<u>විවිධ ලැබීම්</u>** | | |
| විවිධ ආදායම | 1,874,070 | 1,115,571 |
| ලියාපදිංචි ගාස්තුව (සැපයුම්කරුවන්) | 153,000 | 168,500 |
| **එකතුව** | **2,027,070** | **1,284,071** |
| **සටහන - 19** | | |
| **<u>දේපළ කුලිය</u>** | | |
| ආපනශාලාවලින් කුලිය | 13,000 | 9,750 |
| දේපළවලින් කුලිය | 813,137 | 591,780 |
| **එකතුව** | **826,137** | **601,530** |
| **සටහන - 20** | | |
| **<u>ශිෂ්‍යාධාර සහ මහපොළ</u>** | | |
| ශිෂ්‍යාධාරවලින් ලැබීම් | 18,296,430 | 17,356,430 |
| ශිෂ්‍යාධාර ගෙවීම් | (18,296,430) | (17,356,430) |
| **ශුද්ධ** | - | - |

*** සටහන**

මහපොළ භාරකාර අරමුදල මගින් 2023 වර්ෂය තුළ දී මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් එක් එක් ශිෂ්‍යයාගේ බැංකු ගිණුමට සෘජුවම බැර කරන ලදී.

26

## අයවැය සහ තථ්‍ය සැසඳුම් ප්‍රකාශනය - 2023

| | 2023 අයවැය රු. | අතිරේක වෙන්කිරීම් මාරු කිරීම රු. | මුළු සංශෝධිත අයවැය රු. | 2023 තථ්‍ය රු. |
|---|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | | | | |
| පුනරාවර්තන ප්‍රදාන | 679,000,000 | - | 679,000,000 | 656,500,000 |
| | **679,000,000** | | **679,000,000** | **656,500,000** |
| වෙනත් ආදායම | | | | |
| (1) ණය සහ අත්තිකාරම් පොලිය | 825,000 | | 825,000 | 803,946 |
| (2) විවිධ ලැබීම් | 1,850,000 | | 1,850,000 | 2,027,070 |
| (3) ආයෝජනවලින් පොලිය | 30,750,000 | | 30,750,000 | 71,989,416 |
| (4) ලියාපදිංචි ගාස්තු | 1,650,000 | | 1,650,000 | 1,338,100 |
| (5) විභාග ගාස්තු | 265,000 | | 265,000 | 209,850 |
| (6) පුස්තකාල දඩ | 50,000 | | 50,000 | 44,439 |
| (7) වෛද්‍ය ගාස්තු | | | - | 50,200 |
| (8) දේපළ කුලිය | 350,000 | | 350,000 | 826,137 |
| (9) පැරණි තොග අලෙවිය | | | - | 166,000 |
| (10) මහපොළ සහ ශිෂ්‍යාධාර | | | - | 18,296,430 |
| (11) ස්වයං මූල්‍ය වැඩසටහන් | 16,750,000 | | 16,750,000 | 41,652,686 |
| **එකතුව** | **52,490,000** | | **52,490,000** | **137,404,274** |
| **මෙහෙයුම් වියදම්** | | | | |
| (1) පුද්ගලික පාරිතෝෂිකය | 519,000,000 | | 519,000,000 | 489,833,756 |
| (2) ගමන් | 3,000,000 | | 3,000,000 | 308,458 |
| (3) සැපයුම් හා පරිභෝජන | 37,585,000 | | 37,585,000 | 26,012,771 |
| (4) නඩත්තුව | 24,000,000 | | 24,000,000 | 23,994,105 |
| (5) කොන්ත්‍රාත් සේවා | 106,210,000 | | 106,210,000 | 109,626,817 |
| (6) ක්ෂයවීම | | | - | 81,492,871 |
| (7) උත්පාදිත අරමුදල් වියදම් | | | - | 13,975,839 |
| (8) වෙනත් මෙහෙයුම් වියදම් | 76,630,000 | | 76,630,000 | 30,914,499 |
| (9) මහපොළ ශිෂ්‍යාධාර | | | - | 18,296,430 |
| (10) ස්වයං මූල්‍ය වැඩසටහන් | 16,550,000 | | 16,550,000 | 34,922,606 |
| **එකතුව** | **782,975,000** | | **782,975,000** | **829,378,151** |
| **ප්‍රාග්ධන වියදම්** | | | | |
| පාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම | 62,000,000 | | 62,000,000 | 81,523,254 |
| ස්ථාවර වත්කම් අත්කර ගැනීම | 35,000,000 | | 35,000,000 | 56,303,604 |
| ඉදිකිරීම් ව්‍යාපෘති - අඛණ්ඩව | | | - | |
| ඉදිකිරීම් ව්‍යාපෘති - නව | | | - | |
| පර්යේෂණ සහ සංවර්ධනය | 2,000,000 | | 2,000,000 | 1,900,033 |
| මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය | 1,000,000 | | 1,000,000 | 1,233,750 |
| | **100,000,000** | | **100,000,000** | **140,960,640** |

**සටහන**

1. අයවැය කෘත්‍ය වර්ගීකරණය මගින් මුදල් පදනම මත අනුමත කරනු ලැබේ. අනුමත අයවැය 2023.01.01 සිට 20231.12.31 දක්වා මූල්‍ය වර්ෂය ආවරණය කරනු ලැබේ.

2.අයවැය සහ ගිණුම්කරන පදනම් වෙනස් වේ. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වියදම්වල ස්වභාවය මත පදනම් වූ වර්ගීකරණයක් භාවිතා කරමින් සමස්ත - රජය සඳහා මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත සකස් කර ඇත. මූල්‍ය ප්‍රකාශන 2023 ජනවාරි 1 සිට 2023 දෙසැම්බර් 31 දක්වා මූල්‍ය කාලසීමාව සඳහා සකස් කර ඇත. මුදල් ප්‍රකාශන මුදල් පදනම මත අනුමත කරන අයවැයෙන් වෙනස් වේ.

# 22. තිරසාර සංවර්ධන ඉලක්කවලට අනුකූලවීම 2023/2024

## පීය ප්‍රගති වාර්තාව

## ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

**දේශීය වෛද්‍ය පීඨය මඟින් තිරසාර සංවර්ධන ඉක්ක සාක්ෂාත් කර ගැනීම පිණිස පහත දැක්වෙන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇත:**

I. අන්තර්ජාතික කාන්තා දින සැමරුමට සමගාමීව පාසැල් ශිෂ්‍යයින් සහ ආයුර්වේද, වෛද්‍ය සහ ශල්‍යවෛද්‍ය BAMS) ප්‍රථම උපාධි අපේක්ෂකයින් සඳහා සම්මන්ත්‍රණයක් පැවැත්වීම කෞමාරභෘත්‍ය සහ ස්ත්‍රී රෝග අධ්‍යයන අංශය මගින් කරන ලද විශිෂ්ට මූලාරම්භයකි. කාන්තාවන්ගේ සෞඛ්‍ය ගැටළු පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම සහ තරුණ ශිෂ්‍යයින් සහ අනාගත සෞඛ්‍ය රැකවරණ වෘත්තිකයින් ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව සහ කාන්තාවන්ගේ සුභසිද්ධිය පිළිබඳ උද්දේශනය කිරීම පිණිස සවිබල ගැන්වීම සඳහා එවැනි වැඩසටහන් විශාල වශයෙන් දායක වේ. (SDG 4)

II. සියලුම අභ්‍යන්තර ශිෂ්‍යයින් සඳහා තිරසාර සංවර්ධන ඉලක්ක (SDG 4) අනුකූලව සියලුම අභ්‍යන්තර ශිෂ්‍යයින් සඳහා කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍රයක් පිරිනැමීමට දේශීය වෛද්‍ය පීඨය ආරම්භ කරන ලද මූලාරම්භය පැසසිය යුතුය. එමඟින් සාකල්‍ය අධ්‍යාපනය සඳහා වන කැපවීම ප්‍රදර්ශනය කරන අතර ශිෂ්‍යයින්ව ඔවුන්ගේ විශේෂිත ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පමණක් නොව කළමනාකරණය වැනි අත්‍යවශ්‍ය කුසලතාවලින් සූදානම් කරවීම ඔවුන්ගේ සමස්. සංවර්ධනය සහ අනාගත වෘත්තීය අපේක්ෂාවන් සඳහා ද ඉතා වැදගත් වනු ඇත.

III. ආයුර්වේද අධ්‍යාපනය - ආයුර්වේද දෙපාර්තමේන්තුව ආශ්‍රිත පාඨමාලාව පීඨයේ උපාධි අපේක්ෂකයින්ගේ දැනුම ඉහළ නැංවීමට සඳහා ආරම්භ කරන ලදී. (SGD 4)

IV. ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය මඟින් ආයුර්වේද ඖෂධාගාරය පිළිබඳ ඩිප්ලෝමාවක් ආරම්භ කිරීමස සහභාගීත්ව සහ සමාන ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ ජීවිත කාලය පුරාවට වන ඉගෙනුම් අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ අවධානය යොමු කරනු ලබන තිරසාර සංවර්ධන ඉලක්කය SDG 4) අනුකූල වේ.

V. වතුපිටිවල ඖෂධ උද්‍යානය සංවර්ධනය කිරීම සඳහා යෝජනාවක් ද්‍රව්‍යගුණ විඥාණ අධ්‍යයන අංශය මඟින් ක්‍රියාත්මක කිරීම යහපත් සෞඛ්‍ය සහ සුබසිද්ධිය සහ ගුණාත්මක අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම (SDG 4) යන තිරසාර සංවර්ධන ඉලක්කවලට දායකවීමක් වන බැවින් එය තිරසාර සංවර්ධන ඉලක්ක (SDG 3) සහ SDG 4 අනුකූල වේ.

VI. දේශීය වෛද්‍ය පීඨයේ ශිෂ්‍යයින් 2023 දී ශ්‍රී ලංකාවේ ජ්‍යොතිශාමතී තරඟයට සහභාගවීම සහභාගීත්ව සහ සමාන ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැම දෙනා හට ජීවිත කාලය පුරාවට ඉගෙනීමේ අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධාරණය කරන (SDG 4) තිරසාර සංවර්ධන ඉලක්කයට අනුකූල වන උපාධි අපේක්ෂක ශිෂ්‍යයින් අතර ආයුර්වේද දැනුම ව්‍යාප්ත කිරීමට දායක වෙයි.

VII. "නවක වධයට එරෙහි පීඨ කමිටුවක්" ස්ථාපිත කිරීම විශ්වවිද්‍යාලය තුළ සියලුම ශිෂ්‍යයින් සඳහා ආරක්ෂිත සහ ගෞරවාන්විත පරිසරයක් පවත්වා ගැනීම වෙනුවෙන් ඉටු කරන ලද ප්‍රගාමී පියවරකි.

නවක වධය ශිෂ්‍යයින්ගේ මානසික සහ ශාරීරික සුහසිද්ධිය කෙරෙහි බරපතල ප්‍රතිවිපාක ගෙන දෙන අතර පීඨය මගින් එම තත්ත්වය තුරන් කිරීම සඳහා පියවර ගැනීම ප්‍රශංසනාත්මක කටයුත්තකි. (SDG 5/ SDG 10)

VIII. ස්වස්ථවෘත්ත (ප්‍රජා ඖෂධ) ඉලක්ක කර ගත් ක්ෂේත්‍ර චාරිකාව සියලුම වයස්වල ජනතාව සඳහා සෞඛ්‍යසම්පන්න ජීවිත සහතික කිරීම සහ සුහසිද්ධිය ප්‍රවර්ධනය කිරීම ඉලක්ක කර ගත් (SDG 3) තිරසාර සංවර්ධන ඉලක්කයට ඍජුවම අනුකූලවීමකි.

IX. පීඨ ශිෂ්‍ය සංගමය සංස්කෘතික සැමරුම්, ක්‍රීඩා තරඟාවලි සහ ආගමික වැඩසටහන් ඇතුළු විවිධ උත්සව සංවිධානය කිරීම ගතික විශ්වවිද්‍යාල ජීවිතයක් සහතික කිරීමට දායකවීමකි (SDG 3/ SDG 10).

X. BAMS ශිෂ්‍යයින් සඳහා වැඩිදියුණු කළ සායනික අත්දැකීම් ලබා දෙමින් බාහිර ආයුර්වේද රෝහල් සමඟ සහයෝගීතා සායනික පුහුණු වැඩසටහන් ස්ථාපිත කරන ලදී. (SDG 4)

**සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය මගින් තිරසාර සංවර්ධන ඉක්ක සාක්ෂාත් කර ගැනීම පිණිස පහත දැක්වෙන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇත:**

## <u>තාක්ෂණික අධ්‍යයන අංශය – FIHST</u>

තාක්ෂණ පීඨය (DT), තාක්ෂණික අධ්‍යාපනය ඉහළ නංවීම, සෞඛ්‍ය රැකවරණය ප්‍රවර්ධනය කිරීම, නවෝත්පාදනය පෝෂණය කිරීම සහ පාරිසරික තිරසාරභාවය වැඩිදියුණු කිරීම ඉලක්ක කර ගත් විවිධ මුලපිරීම් හරහා තිරසාර සංවර්ධන ඉලක්ක has been actively contributing to sustainable development goals (SDGs) ඉටු කර ගැනීම කෙරෙහි සක්‍රියව දායක වී ඇත. මෙම විස්තීරණ වාර්තාව මගින් 2023 වර්ෂය තුළ අධ්‍යයන අංශයේ ක්‍රියාකාරකම් සහ ඒවා විශේෂිත තිරසාර සංවර්ධන ඉලක්කවලට අනුකූලවීම විස්තර කරනු ලබයි.

I. දියවැඩියාව පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන - ජෛව වෛද්‍ය තාක්ෂණ (ගෞරව) ආයුර්වේද වෛද්‍ය උපාධිය හදාරන උපාධි අපේක්ෂකයින් විසින් සංවිධානය කරන ලද "සුවපත්වීමට පියවරක් - Step to Cure" (2022 නොවැම්බර් 14) වැඩසටහන මගින් තිරසාර සංවර්ධන ඉලක්ක 3 (යහපත් සෞඛ්‍ය සහ සුහසිද්ධිය) අනුකූලව දියවැඩියාව සහ එහි ප්‍රතිඵල පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම ඉලක්ක කරයි. දියවැඩියා රෝගය වළක්වා ගැනීමේ ක්‍රමවේද සහ දියවැඩියාව කළමනාකරණය කිරීමේ උපක්‍රම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම මගින් බෝ නොවන රෝග වැළදීම අවම කරයි.

II. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය මගින් සංවිධානය කළ පරිගණක චින්තනය, Arduino, සහ යන්ත්‍ර ඉගෙනුම පිළිබඳ වැඩමුළුව (2023 ජනවාරි 28-29, 2023). මෙම වැඩමුළු මගින් උපාධි අපේක්ෂක ශිෂ්‍යයින් සඳහා පරිගණක චින්තනය, ගැටළු විසඳීම, Arduino

වැඩසටහන්කරණය, සහ යන්ත්‍ර ඉගෙනුම පිළිබඳව ප්‍රායෝගික අත්දැකීම් ලබා දුනි. ශිෂ්‍යයින්ගේ තාක්ෂණික නිපුණතා වැඩිදියුණු කිරීම මගින් මෙම වැඩසටහන් හරහා තිරසාර සංවර්ධන ඉලක්ක 4 (ගුණාත්මක අධ්‍යාපනය) සහභාගීත්ව සහ සමාන අධ්‍යාපනයක් ප්‍රවර්ධනය කිරීම, සහ තාක්ෂණික නවෝත්පාදනය පෝෂණය කිරීම මගින් තිරසාර සංවර්ධන ඉලක්ක 9 (කර්මාන්ත, නවෝත්පාදනය සහ යටිතලපහසුකම්) පවර්ධනය කිරීම සඳහා සෘජුවම අනුග්‍රහය දක්වයි.

III. තාක්ෂණ පීඨය මගින් සංවිධානය කළ ලේ දන්දීමේ ව්‍යාපාරය සහ වැඩිහිටි රැකවරණ පරිත්‍යාග ව්‍යාපාරය (2023 ජූනි 6) මගින් තිරසාර සංවර්ධන ඉලක්ක 3 (යහපත් සෞඛ්‍ය සහ සුභසිද්ධිය) සහ තිරසාර සංවර්ධන ඉලක්ක 10 (අසමානතා අඩු කිරීම) යන ඉලක්කවලට දායක වෙමින් සමාජ වගකීම සහ ප්‍රජා සුභසාධනය වෙනුවෙන් අධ්‍යයන අංශයේ කැපවීම පෙන්වා දෙයි.

IV. රොබෝ තරඟාවලිය සහ STEM අධ්‍යාපන වැඩමුළු ඔස්සේ තාක්ෂණ සාක්ෂරතාව සහ නවෝත්පාදනය පෝෂණය කිරීමෙන් තිරසාර සංවර්ධන ඉලක්ක 4 (ගුණාත්මක අධ්‍යාපනය) සහ තිරසාර සංවර්ධන ඉලක්ක 9 (කර්මාන්ත, නවෝත්පාදනය සහ යටිතලපහසුකම්) අනුකූලව වෙමින්, විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු ශිල්පය සහ ගණිතය (STEM) යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් උනන්දුවක් සහ නිපුණතාවක් ප්‍රවර්ධනය කරයි.

V. වෙරළ පිරිසිදු කිරීමේ මෙහෙයුම සහ අපජලය කළමනාකරණ ක්ෂේත්‍ර අධ්‍යයනය තාක්ෂණ පීඨය මගින් සංවිධානය කරන ලද අතර මෙම පරිසර සංරක්ෂණ ව්‍යායාම වගකීම් සහගත පාරිසරික භාරකාරත්වයක් ප්‍රවර්ධනය කිරීම සහ ස්වභාවික සම්පත් තිරසාර කළමනාකරණය ඔස්සේ තිරසාර සංවර්ධන ඉලක්ක 6 (පිරිසිදුජලය සහ සනීපාරක්ෂාව) සහ තිරසාර සංවර්ධන ඉලක්ක 14 (ජලය යට ජීවිතය) සාක්ෂාත් කර ගැනීමට දායක වේ.

VI. උසස් ජෛව-වෛද්‍ය උපකරණ සහතිකපත්‍ර පාඨමාලාව සහ සෞඛ්‍ය රැකවරණ පහසුකම් පිළිබඳ ක්ෂේත්‍ර අධ්‍යයන මගින් ගුණාත්මක සෞඛ්‍ය රැකවරණයක් සහ තිරසාර සංවර්ධන ඉලක්ක 9 (කර්මාන්ත, නවෝත්පාදනය සහ යටිතලපහසුකම්) සහ වෛද්‍ය තාක්ෂණය සහ ප්‍රවීණත්වය ප්‍රවර්ධනය කිරීමෙන් තිරසාර සංවර්ධන ඉලක්ක 3 (යහපත් සෞඛ්‍ය සහ සුභසිද්ධිය) සාක්ෂාත් කර ගැනීමට දායක වෙයි.

VII. වෙබ් ජාල සංවර්ධන පාඨමාලාව සහ සම්මුඛසාකච්ඡා සැසි ශිෂ්‍යයින්ගේ සේවානියුක්තිභාවය සහ වෘත්තීය කුසලතා වැඩිදියුණු කිරීමෙන් ජීවිත කාලය පුරාවට ඉගෙනීම පෝෂණය කිරීමෙන් සහ සේවානියුක්ති අවස්ථාවන්වලට ප්‍රවේශය ලබා ගැනීමට පහසුකම් සැලසීමෙන් තිරසාර සංවර්ධන ඉලක්ක 4 (ගුණාත්මක අධ්‍යාපනය) සහ තිරසාර සංවර්ධන ඉලක්ක 8 (ශිෂ්ටසම්පන්න වැඩ පරිසරයක් සහ ආර්ථික වර්ධනයක්) ඉටු කර ගැනීමට දායක වෙයි.

VIII. තාක්ෂණ පීඨය මඟින් 2023 වර්ෂය තුළ ඉටු කළ ක්‍රියාකාරකම් සෞඛ්‍යාරක්ෂණය, අධ්‍යාපනය, නවෝත්පාදනය, පරිසර සංරක්ෂණය, සහ සමාජ වගකීම ආදි අංශ ඇතුළත් තිරසාර සංවර්ධනය සඳහා වූ බහුවිධි ප්‍රවේශයක් නිරූපණය කරයි. විවිධ තිරසාර සංවර්ධන ඉලක්කවලට අනුකූලවීමෙන් අධ්‍යයන අංශය මඟින් තිරසාර සංවර්ධනය සඳහා වූ ජාතික න්‍යායපත්‍රය ඉටු කර ගැනීම සහ ශ්‍රී ලංකාව සඳහා විශිෂ්ට අනාගතයක් නිර්මාණය කිරීම වෙනුවෙන් එහි කැපවීම විදහා පෙන්වයි.

## දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයන අංශය – FIHST

දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයන අංශය (DIMR) ශිෂ්‍යයින්ගේ විශ්වවිද්‍යාල අත්දැකීම් ඉහළ නංවන පමණක් නොව තිරසාරකත්වය සහ සංවර්ධනය සඳහා වූ අපගේ ක්‍රමෝපායන ඉලක්ක සමඟ අනුකූලවන විවිධ උත්සව සහ මූලාරම්භයන් සංවිධානය කිරීමේ ප්‍රමුඛ අංශයකි. දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයන අංශය තිරසාර සංවර්ධන ඉලක්ක අත්කර ගැනීම සඳහා පහත දැක්වෙන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇත:

I. තෛපොංගල් සහ නත්තල් උත්සව වැනි විවිධ සංස්කෘතික සහ ආගමික උත්සව සහ IPT 2 වැනි වසරේ ශිෂ්‍යයින් බුත්පිටිය මහ විද්‍යාලයේ දී පවත්වන ලද පොත් ප්‍රදානය කිරීමේ වැඩසටහන සහභාගීත්ව සහ සංස්කෘතික විවිධත්වය පෝෂණය කිරීමට ඇති අපගේ කැපවීම සඳහා සාක්ෂියකි. විවිධ පසුබිම්වලින් පැමිණෙන ශිෂ්‍යයින්ට එකට එකතුවීමට, එක් ප්‍රජාවක් යන හැඟීමක් ඇති කිරීමට සහ විශ්වවිද්‍යාලය තුළ අසමානතාවන් අවම කිරීමට සහ සහභාගීත්වය සහ ගතික විශ්වවිද්‍යාල ජීවිතයක් ප්‍රවර්ධනය කිරීමට මෙම අවස්ථාවන් ඉඩප්‍රස්ථාවල සලසයි. (තිරසාර සංවර්ධන ඉලක්ක 3, 10).

II. දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයන අංශයේ 2 වැනි ශිෂ්‍යයින් විසින් දියතලාවේ ස්ථාපිත කර ඇති ලෝකයේ පළමු ඇනලොග් වනාන්තරය (Analog Forest) වන බෙලිපොල රුක් උයන සහ පර්යේෂණ මධ්‍යස්ථානයේ සිදු කළ දින 3ක සංචාරය විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක කරන පර්යේෂණාත්මක ඉගෙනුම් ක්‍රමවේදය සඳහා උදාහරණයකි. මෙම අත්දැකීම ඔස්සේ ශිෂ්‍යයින්ට පරිසර පද්ධති සහ ජෛව-විවිධත්වය සංරක්ෂණය (තිරසාර සංවර්ධන ඉලක්ක 15) පිළිබඳ අවබෝධය වැඩිදියුණු කර ගැනීමට පමණක් නොව, ඉහළ ගුණාත්මක අධ්‍යාපනයක් පිළිබඳ අපගේ ඉලක්කය (තිරසාර සංවර්ධන ඉලක්ක 4) අනුව ඔවුන්ගේ පෞද්ගලික සහ ශාස්ත්‍රීය සංවර්ධනය සඳහා දායකවීමට ද අවස්ථාව උදා කරන ලදී.

III. ඖෂධමය පාන පිළිබඳව පර්යේෂණ කිරීම සහ ගොඩනැගීම සඳහා අධ්‍යයන අංශය මගින් මා නිෂ්පාදන (පුද්) සමාගම සමඟ ඇති කර ගත් හවුල්කාරත්වය සෞඛ්‍ය සහ සුබසාධනය (තිරසාර සංවර්ධන ඉලක්ක 2, 3) ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ගන්නා ලද වැදගත් පියවරක් නියෝජනය කරයි. මෙම හවුල්කාරිත්වය මඟින් ඖෂධමය නිෂ්පාදන අංශය තුළ තිරසාර ව්‍යවහාර සඳහා මූලික අඩියර ස්ථාපිත කරමින්, නවෝත්පාදනය සහ කර්මාන්ත සංවර්ධනය (තිරසාර සංවර්ධන ඉලක්ක 9,12,17) පෝෂණය කරයි.

IV. උසස් විශ්ලේෂණ සහ අණුක ජෛවවිද්‍යා උපකරණ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව දියත් කිරීම නවීන සේවාස්ථානවල ඉල්ලුමට සරිලන නවීන අධ්‍යාපනික වැඩසටහන් පිරිනැමීමට අධ්‍යයන අංශයේ කැපවීම ඉස්මතු කරයි (තිරසාර සංවර්ධන ඉලක්ක 4). මෙම මූලාරම්භය ශිෂ්‍යයින්ගේ ශාස්ත්‍රීය

විශිෂ්ටත්වය ඉහළ නැංවීම සිදු කරනු පමණක් නොව තිරසාර සංවර්ධනයට අත්‍යවශ්‍ය වන කුසලතා සහ නිපුණතාවලින් පිරිපුන් ශ්‍රම බලකායක් ගොඩනංවා ගැනීමට ද දායක වේ (තිරසාර සංවර්ධන ඉලක්ක 4).

V. (2023 නොවැම්බර් 01 වැනි දින අධ්‍යයන අංශ පරිශ්‍රයේ දී පවත්වන ලද) ශාක පටක පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා මුල් ගල තැබීම ජෛව විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණ සහ නවෝත්පාදන සිදු කිරීම සඳහා වූ අධ්‍යයන අංශයේ කැපවීම පෙන්නුම් කරයි (තිරසාර සංවර්ධන ඉලක්ක 4, 9). මෙම පහසුකම ශාක විද්‍යාව සම්බන්ධයෙන් ශිෂ්‍යයින් සහ පර්යේෂකයින් සඳහා නව ගවේෂණ මංපෙත් විවර කරනු පමණක් නොව තිරසාර කෘෂිකර්මාන්තය සහ පරිසර සංරක්ෂණය (තිරසාර සංවර්ධන ඉලක්ක 15) වෙනුවෙන් දායකවීමට මෙන්ම ශ්‍රී ලංකාව තුළ වාණිජ මට්ටමින් ශාක ප්‍රචාරණය සහ වගා කිරීම සිදු කිරීම සඳහා සක්‍රියව දායකවීමට ද අවස්ථාව උදා කරයි (තිරසාර සංවර්ධන ඉලක්ක 8).

VI. අධ්‍යයන අංශය මඟින්ඖෂධමය නිෂ්පාදන සංවර්ධ නය, ජෛව-ව්‍යවසායකත්වය, ජෛව ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ අවස්ථාවන් සහ අභියෝග, පර්යේෂණවල වැදගත්කම සහ අලෙවිකරුවන් නොවන තැනැත්තන් සවිබලගැන්වීම පිළිබඳ විශේෂ කතාබහක්/ සාකච්ඡාවක්: අලෙවිකරුවන් නොවන අය සඳහා CX පිළිබඳ වැඩමුළු මාලාවක් යනා දී මාතෘකා සම්බන්ධයෙන් ජීවිත සහ වෘත්තීය කුසලතා සංවර්ධන වැඩසටහනක් පවත්වන ලදී (තිරසාර සංවර්ධන ඉලක්ක 3, 4, 9).

VII. අධ්‍යයන අංශයේ උපාධි අපේක්ෂක ශිෂ්‍යයින් විසින් (විලවුන්, පෝෂක ඖෂධ, සහ ඖෂධ වැනි) විවිධ ඖෂධමය නිෂ්පාදන ගොඩනැගීම නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම පමණක් නොව (තිරසාර සංවර්ධන ඉලක්ක 9) පමණක් නොව සෞඛ්‍ය සහ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ස්වභාවික ප්‍රතිකාරවල ඇති හැකියාව ද ඉස්මතු කරයි (තිරසාර සංවර්ධන ඉලක්ක 3).

VIII. දරිද්‍රතාව, කුසගින්න සහ අසමානතාව යනා දී කරුණු ආමන්ත්‍රණය කිරීම සඳහා වූ අපගේ කැපවීම නිරූපණයක කරමින් දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයන අංශයේ උපාධි අපේක්ෂක ශිෂ්‍ය කණ්ඩායමක් මඟින් නිෂ්පාදන කළ SLAAS මඟින් පළමු ස්ථානය සඳහා වූ සම්මානය ප්‍රදානය කරන ලද, "ශ්‍රී ලංකාව තුළ හිස ඔසවන ආහාර අනාරක්ෂිතභාවය: හේතු සහ විසඳුම්" යන සම්මානලාභී වීඩියෝ පටය බරපතල සාමාජීය ගැටළු සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම පිණිස අප විශ්වවිද්‍යාලයේ කැපවීම මනාව නිරූපණය කරයි (තිරසාර සංවර්ධන ඉලක්ක 1, 2, 10).

IX. මේ ආකාරයේ මුලපිරීම් හරහා දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයන අංශය උපාධි අපේක්ෂකයින් ඔවුන්ගේ ප්‍රජාව තුළ සහ ඉන් ඔබ්බට ධනාත්මක වෙනස්කම් ඇති කිරීමේ නියෝජිතයින් බවට පත් කිරීමට උත්සාහ කරයි.

## දේශීය සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන අංශය – FIHST

දේශීය සෞඛ්‍ය අධ්‍යයන අංශයේ ඉලක්ක අංක 01, 02,03 සහ 05 යෝග, පාරමනෝවිද්‍යාව සහ සෞඛ්‍ය හා සුවය සංචාරක කාර්මාන්තය වැනි ආකර්ශණීය විෂයන් එහි විෂයමාලාවට ඇතුළත් කර ඇත. මෙම ප්‍රගතශීලී ප්‍රවේශය සාම්ප්‍රදායික දේශීය ව්‍යවහාර සහ සමකාලීන සුවතා ප්‍රවණතා යන අංග දෙකම පිළිගනියි. උපාධි අපේක්ෂක ශිෂ්‍යයින්ගේ පර්යේෂණ පරිසංවාදවලට සක්‍රියව සහභාගීවීම හරහා ශිෂ්‍යයින් මෙම විෂයයන් විචාරාත්මකව ගවේෂණය කිරීම සඳහා අනුග්‍රහය දක්වන කථිකාචාර්යවරු සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. මෙම පරිසංවාද දේශීය සෞඛ්‍ය ව්‍යවහාරවල ඇඟවීම් වඩාත් හොඳින් අධ්‍යයන කිරීමට සහ හෙළිදරව් කිරීම්වලට අර්ථාන්විතව දායකවීමටත් ශිෂ්‍යයින් සඳහා සුදුසු වේදිකාවන් ලෙස කටයුතු කරයි. අවසාන වශයෙන්, අධ්‍යයන අංශයේ මූලාරම්භයන් ශිෂ්‍යයින් ගෝලීය සෞඛ්‍ය සහ සුවතා ක්ෂේත්‍රය තුළ ධනාත්මක වෙනසක් ඇති කිරීමේ නියෝජිතයින් බවට පත්වීම සඳහා සවිබල ගන්වමින් සාම්ප්‍රදාය සහ නවෝත්පාදන මුසු කරනු ලබයි.

1) සෑම අධ්‍යයන වාරයකටම පසුව මාසයක ආධුනිකත්වයක් ආරම්භ කිරීම දේශීය සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන අංශයේ ශිෂ්‍යයින් සඳහා පරිවර්තනීය අත්දැකීමක් බවට සනාථ වී ඇත. යෝග, මනෝවිද්‍යාව, සෞඛ්‍ය නිකේතන සහ විවේක මධ්‍යස්ථාන ආදී ක්ෂේත්‍රවල ව්‍යාපාර කටයුතුවල නියැලි කීර්තිමත් ආයතනවල සේවය කිරීම සඳහා අවස්ථාවක් ලබා ගැනීමෙන් ශිෂ්‍යයින්ට ඉතා අගනා ප්‍රායෝගික අත්දැකීමක් සඳහා අවස්ථාවක් හිමි වේ. මෙම ප්‍රායෝගික ප්‍රවේශය ශිෂ්‍යයින්ගේ සංජානන චින්තනය ඉහළ නංවමින් සහ සත්‍ය ලෝකයේ යෙදවුම් සමඟ ඔවුන්ගේ කුසලතා ඉස්මතු කරමින් ශිෂ්‍යයින්ගේ විෂය දැනුම ප්‍රගතිශීලී ලෙස සංවර්ධනය කර ගැනීමට පහසුකම් සලසයි. විවිධ වෘත්තීය පරිසරයන් තුළ කටයුතු කිරීම හරහා ශිෂ්‍යයින් ඔවුන්ගේ අනාගත වෘත්තීය ගමන් මඟ හැඩගස්වන තීක්ෂ්ණ බුද්ධියක් අත්පත් කර ගන්නා අතර ඔවුන් ගතික සහ විකාශනය වන කර්මාන්තවල දියුණුවීමට සූදානම් දක්ෂ වෘත්තිකයින් ලෙස ස්ථානගත කරයි. මෙම අත්දැකීම් සහිත ඉගෙනීම ඔවුන්ගේ අධ්‍යාපන ගමන පොහොසත් කිරීම පමණක් නොව ඔවුන් තෝරාගත් ක්ෂේත්‍රවල විශිෂ්ටත්වයට පත්වීමට අවශ්‍ය මෙවලම් සහ අත්දැකීම්වලින් ද ඔවුන් සන්නද්ධ කරවයි. මෙය ඉලක්ක 05 ආවරණය කරයි.

2) බොහෝ සමාජ සත්කාර ක්‍රියාකාරකම් හරහා ශිෂ්‍යයන් සමාජයට සහ පරිසරයට ඇති කැපවීම ඵලදායී ලෙස ප්‍රදර්ශනය කර ඇත. පරිසරය පිරිසිදු කිරීමේ ව්‍යාපාර, පාසැල් ශිෂ්‍යයින්ගේ දැනුම සංවර්ධන මුලපිරීම් සහ ප්‍රශ්න විචාරාත්මක තරඟ සඳහා ක්‍රියාකාරී සහභාගීත්වය ඔවුන්ගේ පෞද්ගලික සංවර්ධනයට දායකවනවා පමණක් නොව, ප්‍රජාව සහ සොබාධහම යන අංශ සමඟ ඔවුන්ගේ බැඳීම ශක්තිමත් කර ඇත. ඉලක්ක 05 වන ශිෂ්‍ය ප්‍රජාව අතර සමාජ හා පාරිසරික යහපැවැත්ම වෙනුවෙන් වූ වගකීම පිළිබඳ හැඟීමක් ඇති කිරීම සඳහා මෙම කටයුතු උත්ප්‍රේරක ලෙස ක්‍රියා කරයි.

3) ඉලක්ක අංක 05 සමඟ සමභාමීව,සංචාර, උත්සව කළමනාකරණය, කුඩා ව්‍යාපාර සංවර්ධනය, පළාත් සභාවේ විදාතා ඒකකය ඇතුළු විවිධ ක්ෂේත්‍රවල ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් ඇතුළත් ව්‍යවසායක සංවර්ධන වැඩමුළු මාලාවක් සංවිධානය කර ඇත. මෙම වැඩමුළු සංචාරක සිසුන් සඳහා අගනා අවබෝධයක් ලබා දෙන අතර, නවෝත්පාදනයන්, සෞඛ්‍ය සංචාරක කර්මාන්තයේ නිෂ්පාදන සංවර්ධනය සහ අලෙවිකරණ උපාය මාර්ග පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දෙයි. මෙම සැසි සඳහා ක්‍රියාකාරී

සහභාගීත්වය තුළින් සිසුන් සංචාරක කර්මාන්තයේ ගතික හා දර්ශනයේ සැරිසැරීමට අත්‍යවශ්‍ය ප්‍රායෝගික අත්දැකීම් සහ කුසලතා ලබා ගනී.

4) එක් දෙපාර්තමේන්තු කථිකාචාර්යවරයෙක් විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන රුසියානු භාෂා සංවර්ධන පාඨමාලාවක් සම්පූර්ණ කිරීමෙන් ප්‍රාගාමී නියැලීමක් පෙන්නුම් කර ඇත. එසේම, තරුණ සංසදවලට සහභාගී වීමට අවස්ථාව, සහ කාර්ය මණ්ඩල පුහුණු සංවර්ධන වැඩසටහන් සම්පූර්ණ කිරීම. මීට අමතරව, ඔවුන් ජාත්‍යන්තර පර්යේෂණ සංසදවල සහ ඉන්දියාවේ අධ්‍යාපන සංවර්ධන සංසදවල, විශේෂයෙන් යෝග කෙරෙහි අවධානය යොමු කිරීම, ඔවුන්ගේ ප්‍රවීණත්වය සහ ඉදිරි දර්ශන පොහොසත් කර ඇත. මෙම අත්දැකීම් සිසුන්ට සහ ඉලක්ක අංක 01, 02 සහ 4 සමඟ සමපාත වන අධ්‍යයන පරිසරයට ප්‍රයෝජනවත් වන පරිදි දේශන බෙදා හැරීමේ ගුණාත්මක භාවය සැලකිය යුතු ලෙස ඉහළ නංවා ඇත.

5) දේශීය සෞඛ්‍ය විද්‍යා දෙපාර්තමේන්තුව ඉලක්ක අංක 01 සහ 02 සමඟ සමපාත වන ජාතික සංචාරක මාර්ගෝපදේශකයන් සඳහා සෞඛ්‍ය සංචාරක පාඨමාලාව සඳහා ස්පා කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍රයක් දියත් කර සාර්ථකව පවත්වන ලදී.

**දේශීය සමාජ විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය මඟින් තිරසාර සංවර්ධන ඉක්ක සාක්ෂාත් කර ගැනීම පිණිස පහත දැක්වෙන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇත:**

සිසුන් සඳහා ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සඳහා, සීඝ්‍රයෙන් පරිණාමය වන සමාජයක, ජාතියක සහ ලෝකයක අවශ්‍යතා සපුරාලීම සඳහා සුදුසු සමාලෝචනය, වැඩිදියුණු කිරීම මෙන්ම නව උපාධි වැඩසටහන් නිර්මාණය කිරීම සඳහා පීඨය කැපවී සිටී. ඉගෙනීම විෂය මාලාව ඉක්මවා අත්‍යවශ්‍ය වෘත්තීය සහ ජීවන කුසලතා බවට පත්වන ශිෂ්‍ය කේන්ද්‍රීය පරිපූර්ණ අධ්‍යාපනය වෙත අපි යොමු වී සිටිමු. අපගේ අනාගත පරම්පරාව සඳහා ගුණාත්මක අධ්‍යාපනයක් අවශ්‍යතා සපුරාලීම සඳහා දයානුකම්පාව, සහයෝගීතාව, ඍජුභාවය සහ ඇතුළත් කර ගැනීම වැනි සාරධර්ම ඉහළ මට්ටමක ප්‍රවර්ධනය කර ඇති අතර සිසුන්ට සහ කාර්ය මණ්ඩලය සඳහා පීඨයේ ධනාත්මක වැඩ සංස්කෘතියක් නිර්මාණය කිරීම අපි අපේක්ෂා කරමු. සිසුන්ට සහ ගුරුවරුන්ට උසස් තත්ත්වයේ අධ්‍යාපනයක් ලබා දීමට හැකි වන පරිදි නවතම දැනුම පීඨයට සහ විශ්ව විද්‍යාලයට ගෙන ඒම සඳහා අපි විෂය මූලික වැඩමුළු සහ වෙබ්නාර් පවත්වමු.

I. තිරසාර සංවර්ධන ඉලක්ක (4) වෙත අපගේ අධ්‍යාපනික වැඩසටහන් පෙළගස්වමින්, රටේ ආර්ථික සංවර්ධනය සම්බන්ධයෙන් ගත් කල තීරණාත්මක ක්ෂේත්‍ර වන සේවා පරිපාලනය, සේවා විශිෂ්ටත්වය සහ සෞඛ්‍ය ආරක්ෂණය සම්බන්ධ අත්‍යාවශ්‍ය දැනුම සහ කුසලතා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් කළමනාකරණ අධ්‍යයන අංශය අපගේ සිසුන්ට සේවා කළමනාකරණ අධ්‍යාපනය පිරිනැමීමට අභියස සිටී. එපමණක් නොව, කළමනාකරණ අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණ පද්ධති සහ ක්‍රියාවලීන් අඛණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා සංවර්ධිත රටවල ජනප්‍රිය විෂය ක්ෂේත්‍රයක් වන ‘lean Management‘ සම්බන්ධ

කෙටි පාඨමාලා සහ වැඩමුළු පවත්වයි. තොරතුරු තාක්‍ෂණ අධ්‍යයන අංශය තොරතුරු තාක්‍ෂණ කර්මාන්තයේ හෝ තොරතුරු තාක්‍ෂණ පාදක සේවා/අයදුම්පත් අදාළ ව්‍යාපාර තුළ භාවිත වන ඕනෑම කර්මාන්තයක/ වසමක රැකියා අවස්ථා වැඩි කිරීම සඳහා තොරතුරු තාක්ෂණ දැනුම සහ කුසලතා වැඩි දියුණු කිරීම සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ සුදුසුකම් ලබා දීම සඳහා වැඩසටහන් පවත්වයි.

II. තිරසාර සංවර්ධන ඉලක්ක (10) ට අනුකූලව අඩු අසමානතාවයන් ඇති සහභාගීත්ව පරිසරයක් නිර්මාණය කිරීමට අපි කැපවී සිටිමු. මෙම පීඨය ශ්‍රී ලාංකීය සමාජයේ කුඩා පැතිකඩක් නියෝජනය කරන විවිධාකාර වූ ප්‍රජාවකට නිවහනකි. එබැවින්, වාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂ භාවය හෝ භෞතික සීමා නිර්ණය නොතකා සෑම පුද්ගලයෙකුම පිළිගෙන කණ්ඩායමක් ලෙස එකට වැඩ කිරීමට පිළි ගන්නා සහයෝගී සහ විවෘත පරිසරයක් අපි සහතික කර ඇත්තෙමු. ශිෂ්‍ය යහපැවැත්ම ආරක්ෂා කිරීම සඳහා පීඨය තුළ උපකාරක පද්ධතියක් මෙන්ම ආධාරක පරිසරයක් සක්‍රීය කිරීමට අපි කැපවී සිටිමු. එසේ කිරීමෙන් ශිෂ්‍යයින්ට කාර්ය මණ්ඩලය වෙත ප්‍රවේශ විය හැකි බවට අපි වග බලා ගන්නා අතර, අධ්‍යයන හා අනධ්‍යයන ගැටළු සඳහා ශිෂ්‍යයින්ට නිරන්තර උපදෙස් සහ මඟ පෙන්වීම් ලබා දෙන උපදේශන වැඩසටහනක් අපි සකස් කර ඇත්තෙමු. සිංහල සහ දෙමළ කතා කරන සිසුන් අතර අසමානතා අවම කිරීම සඳහා ඉංග්‍රීසි භාෂාව ප්‍රවර්ධනය කිරීම කෙරෙහි ද අපි විශේෂ අවධානයක් යොමු කරමු.

III. දේශගුණික ක්‍රියාකාරකම්, තිරසාරභාවය සහ පරිසරය පිළිබඳ සාමාන්‍ය විඥානය සහ භාවිතාවන් ඉහළ නැංවීමේ ප්‍රයත්නයක් ලෙස, පීඨයේ කාර්ය මණ්ඩලය සහ සිසුන් ප්‍රමුඛ ප්‍රජාව සම්බන්ධ කර ගනිමින් අපි ලෝක පරිසර දින වැඩසටහනක් සංවිධානය කළෙමු. ලෝක පරිසර දිනය නිමිත්තෙන් වාර්ෂික පෝස්ටර් තරඟය සහ රුක් රෝපණ ව්‍යාපාරය වැනි වැඩසටහන් අඛණ්ඩව සිදුකිරීමට පීඨය කැපවී සිටින අතර එමඟින් පීඨයේ සිසුන් පරිසරය සුරැකීමේ සහ එහි තිරසාරභාවය ආරක්ෂා කිරීමේ වැදගත්කම ඉගෙන ගනී.

IV. තිරසාර සංවර්ධන ඉලක්ක (8) සමඟ සමපාත වෙමින්, රැකියා නියුක්ත උපාධිධාරීන් බිහි කිරීමට අවශ්‍ය මෘදු නිපුණතා ලබා දීම සඳහා පීඨය වෘත්තීය සංවර්ධන ඉසව් සංවිධානය කරන අතර තරුණ තරුණියන් සඳහා රැකියා අවස්ථා සුරක්ෂිත කිරීමේදී පවතින අභියෝගවලට අප මුහුණ දෙන බව සහතික කෙරේ. එසේම, අපගේ සිසුන් වත්මන් රැකියා වෙළෙඳපොළ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය කුසලතා සහ දැනුමෙන් සන්නද්ධ බව සහතික කිරීම සඳහා අදාළ විෂය ක්ෂේත්‍රවල වර්තමාන ඉල්ලීම් සහ ප්‍රවණතා සපුරාලීම සඳහා පීඨය නිතර විෂයමාලා සංශෝධනය කරයි. සිසුන්ට අවශ්‍ය නිරාවරණය ලබා දීමට, සැබෑ ලෝකයේ සිදුවන්නේ කුමක්ද යන්න පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීමට පීඨය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ට නිතර ආරාධනා කරයි.

V. තිරසාර සංවර්ධන ඉලක්ක (10) ට සමගාමීව සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන්වල කොටසක් ලෙස පීඨ ශිෂ්‍ය සංගමය විසින් සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද, නත්තල්, තෛපොංගල්, වෙසක්, රාමසාන් සහ හජ් උත්සව ඇතුළු සංස්කෘතික උත්සව මාලාවක් සංවිධානය කර ඇත.

VI. තිරසාර සංවර්ධන ඉලක්ක (14) සමඟ සමගාමීව, ගල්කිස්ස වෙරළ තීරයේ සැලකිය යුතු අහිතකර බලපෑම් වළක්වා ගැනීම පිණිස සාගර සහ වෙරළබඩ පරිසර පද්ධති ආරක්ෂා කිරීම සඳහා පීඨයේ සිසුන් වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

VII. තිරසාර සංවර්ධන ඉලක්ක (3) සමඟ සමගාමීව පීඨය මඟින් "ලිංගික හා ප්‍රජනක සෞඛ්‍යය" පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කරන ලද අතර එය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ වෛද්‍ය නිලධාරී වෛද්‍ය සඳුන් රාජපක්ෂ විසින් මෙහෙයවන ලදී.

VIII. දේශීය සමාජ විද්‍යා හා කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් තිරසාර සංවර්ධන ඉලක්ක (5) වෙත යොමු කිරීම සඳහා "විවිධත්වය සමඟ ජීවත් වීමට ඉගෙනීම" මැයෙන් වැඩමුළු මාලාවක් සංවිධානය කරන ලදී.

IX. පීඨය සිය ක්‍රියාකාරකම් තිරසාර සංවර්ධන ඉලක්ක (6) සමඟ පෙළගස්වා ඇති බව සහතික කිරීම සඳහා ප්‍රජාව සම්බන්ධ කර ගනිමින් පීඨය විසින් ලෝක ජල දිනය සමරන ලදී. එපමනක් නොව, 2023 ලෝක පරිසර දිනය නිමිත්තෙන් පරිසර සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම සඳහා පීඨය විසින් මාර්ගගත පෝස්ටර් තරඟයක් සංවිධානය කරන ලදී. මෙම ක්‍රියාකාරකම තිරසාර සංවර්ධන ඉලක්ක (7) සමඟ සමපාත වේ.

X. දේශීය සමාජ විද්‍යා හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ සිසුන් පිරිසක් කැස්බෑව ජයවර්ධන වැඩිහිටි නිවාසයේ වැඩිහිටියන්ට සමාජ හුදකලාව මඟහරවා ගැනීම සඳහා සහයෝගීතාව, චිත්තවේගීය සහයෝගය සහ විනෝදාස්වාදය සැපයීම සඳහා එහි සංචාරය කරන ලදී. මෙම ශිෂ්‍ය කණ්ඩායම විසින් පීඨයේ ක්‍රියාකාරකම් තිරසාර සංවර්ධන ඉලක්ක (2) සමඟ සමපාත කරමින් වැඩිහිටියන් සඳහා සවස කෙටි ආහාර සහ තේ සහ විනෝදාස්වාද ක්‍රියාකාරකම් කිහිපයක් ලබා දුනි.



# 23. විගණකාධිපති වාර්තාව - 2023





මගේ අංකය / எனது இல. / My No. WPCG/GP/D/GWUIM/1/23/11 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2024 ජූනි 20 දින

උපකුලපති
ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කල මතය**

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.


අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

**1.2** **තත්ත්වාගණනය කල මතය සඳහා පදනම**

(අ) ස්ථාවර තැන්පතු දෙකකට අදාලව සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම රු.1,839,646ක් වුවද එය රු.2,759,470ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා ලැබිය යුතු පොලී ආදායම රු.919,824 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල වියදම් ගිණුම්ගත කිරීමේදී එකතුව රු.2,171,245ක් වූ අතිකාල හා වැටුප් වැඩියෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා උපචිත වියදම් එම ප්‍රමාණයෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.**

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| **නීතිරීති/ විධානවලට යොමුව** | **විස්තරය** |
| --- | --- |
| (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආයතන චක්‍රලේඛ ලිපි අංක 15/2015 | විභාග පවත්වන ලද දින සිට මාස 3 ක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කළ යුතු වුවද විශ්වවිද්‍යාලයේ 2022 හා 2023 වර්ෂවල පවත්වන ලද විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 5 සිට මාස 15 දක්වා අතර කාලයක් ගත කර තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**2.3 වෙනත් කරුණු**

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සීමාකාරී අරමුදල් 4 ක පැවති එකතුව රු.2,407,433 ක් අදාල අරමුණු සඳහා උපයෝජනය කිරීමට වර්ෂය තුලදී කටයුතු කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට හඳුනාගෙන තිබුණු ක්‍රියාකාරකම් 109න් 46ක්ම ආරම්භ කිරීමට නොහැකිවී තිබුණි. වර්ෂය තුළ ආරම්භකර තිබුණු ක්‍රියාකාරකම් 20ක ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

# 24. 2023 වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාවට පිළිතුරු






ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
கம்பஹா விக்ரமாராச்சி சுதேச மருத்துவ பல்கலைக்கழகம் - இலங்கை
Gampaha Wickramarachchi University of Indigenous Medicine - Sri Lanka
නුවර පාර, යක්කල கண்டி சாலை, யக்கல Kandy Road, Yakkala

මගේ : GWUIM/IA/AG/2023/09

2024 අගෝස්තු 06

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල

**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

උක්ත විගණන වාර්තාවට අදාළ පිළිතුරු හා පැහැදිලි කිරීම් පහත දක්වා ඇත.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කල මතය

1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

(අ) ස්ථාවර තැන්පතු අංක 333-60-01-00017919-8 හා 333-60-01-00017921-4 සඳහා ආයෝජන පොළී ගණනය කිරීමේදී ප්‍රමාද දෝෂයකින් අදාළ දින ගණන වැරදි ලෙස සටහන් වීමෙන් ආයෝජන පොළී ආදායම් වැඩිපුර ගණනය කිරීමේ දෝෂය සිදු වී ඇත. එසේ වැඩිපුර ගණනය කරන ලද ආයෝජන පොළී ආදායම ජ'නල් අංක 2024/79 මඟින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ආ) විශ්ව විද්‍යාල අභියාචනා සේවා මණ්ඩලය හමුවේ විභාග වූ නඩුවකට අදාළව අධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජිකයින් තිදෙනෙක් වෙත ලබා දී තිබූ වැටුප් රහිත නිවාඩු, වැටුප් සහිත නිවාඩු බවට පරිවර්තනය කිරීමට නිර්දේශයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉදිරිපත් වූ අතර ඒ අනුව මෙම හිඟ වැටුප් ගෙවීම සඳහා 2023 මුල් කාර්තුවේදී ගෙවීමට සිදුවේ යැයි අපේක්ෂාවෙන් සහ මුදල් මහා භාණ්ඩාගාරයෙන් නිකුත් කරනු ඇතැයි යන අපේක්ෂාවෙන් උපචිත වියදම් වෙන් කිරීමක් සිදු කළද එම හිඟ වැටුප් ගෙවීම සඳහා භාණ්ඩාගාරයෙන් මුදල් නිදහස් කිරීම සිදු වූයේ 2023 වර්ෂයේ ජූලි මාසය තුළදී 2023 වර්ෂයට ලැබුණු අතිරේක ප්‍රතිපාදනයක් ලෙසය. එම නිසා වර්ෂය තුළ ලැබුණු භාණ්ඩාගාර මුදලින් මෙම අධ්‍යයන කාර්යය මණ්ඩල හිඟ වැටුප් ගෙවීම් සිදු වූ හෙයින් ඒවා වර්ෂයේ වියදමට ගළපන ලදී. එම නිසා උපචිත වියදම් වෙන් කිරීමේ ගිණුමේ අධි වෙන් කිරීමක් සිදු වී ඇත. එම ප්‍රමාණය Acc. Surplus Recurrent ගිණුමට ගළපා ඇත.

උපකුලපති: துணை வேந்தர் Vice Chancellor: Fax : 0332215771 0332222739
ලේඛකාධිකාරී: பதிவாளர் Registrar: Fax : 0332215772
මූල්‍යාධිකාරී: தவிசாளர் Bursar: Fax : 0332223785
සාමාන්‍ය: பொது General: 0332222740 0332222748
Web site: www.gwu@ac.lk

තවද, උපචිත වියදම් ප්‍රතිපාදන වෙන් කරනු ලබන්නේ, දෙසැම්බර් 31 වන විට ගෙවීමට සිදු වේ යැයි අපේක්ෂා කරන වියදම්හි ආසන්න ඇස්තමේන්තුවක් සහ 2024 ජනවාරි පෙබරවාරි වවුචර් පදනම් කරගෙනය. කෙසේ වුවද කාර්යය මණ්ඩල උසස්වීම්, පෙරදාතම කිරීම් වැනි හේතු මත හිඟ වැටුප් ගෙවීම් හා ඒ මත හිඟ අතිකාල ගෙවීමට සිදුවන බැවින් ඒ සඳහා යම් අතිරික්ත ප්‍රමාණයක් වෙන් කරනු ලබයි

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.2.2

(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛ ලිපි අංක 15/2015

2022/2023 වර්ෂවල රටේ පැවති අර්බුදකාරී තත්ත්වයන් හා වාහන භාවිතා කිරීමට නොහැකි තෙල් අර්බුදයන් හමුවේ උත්තර පත්‍ර පරික්ෂා කරන කථිකාචාර්ය/බාහිර කථිකාචාර්යවරු හට තම උත්තර පත්‍ර බෙදීම හා ලබාගැනීම විධිමත්ව සිදු කිරීමට නොහැකි වූ අතර එම නිසා පළමු පරික්ෂකගෙන් හා දෙවෙනි පරීක්ෂකගෙන් ලකුණු කරන ලද ප්‍රශ්න පත්‍ර නියමිත කාලයට ලබාගැනීමට නොහැකි වූ අතර මේ නිසා යම්කිසි ප්‍රමාදවීමක් සිදු වී ඇත.
තවද මෙම වකවානුව තුළ අධ්‍යයන අංශ 8ක් සඳහා අවශ්‍ය කාර්යමණ්ඩල බඳවා ගැනීම සිදු නොවීම නිසා ආචාර්යවරුන් හට පැවති කාර්යබහුලතාවය මතද ප්‍රතිපල නිකුත් කිරීමේ ප්‍රමාදවීම් සිදුවී ඇත.

2.3 වෙනත් කරුණු

(අ)

(i) <u>ජී.පී.වික්‍රමාරච්චි සම්භාෂා අරමුදල</u>
2023 වර්ෂයේදී රටේ පැවති ආර්ථිකමය හා මූල්‍යමය තත්ත්වය අනුව සහ කෝවිඩ් වසංගතය තත්ත්වය හමුවේ දේශීය වෛද්‍ය පීඨයේ අතපසු වූ අධ්‍යයන කටයුතු සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබා දීමට සිදුවීමෙන් ජී.පී.වික්‍රමාරච්චි සම්භාෂා වැඩසටහන පැවැත්වීම කල් දැමීමට කටයුතු කර තිබුණි.

(ii) <u>පංචකර්ම පුහුණු වැඩ සටහන</u>
මේ පිළිබඳව දේශීය වෛද්‍ය පීඨයේ පීඨාධිපති දැනුවත් කර මෙම අරමුදල් භාවිතයට ගැනීමට යෝජනා ඉදිරිපත් කරන ලෙස දන්වා සිටි නමුත් පසුගිය කාලපරිච්ඡේදයේ පැවති කොරෝනා වසංගත තත්ත්වය මත අතපසු වූ අධ්‍යයන කටයුතු කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට පසුගිය වර්ෂය තුළ සිදුව තිබූ හේතුවෙන් සිසුන් මේ සඳහා යොමු කිරීමට ප්‍රමාණවත් කාලපරිච්ඡේදයක් නොතිබුණි. කෙසේ වුවද ඉදිරියේදී මේ පිළිබඳව අවධානය යොමු කිරීමට සටහන් කර ගතිමි.

(iii) <u>වික්‍රමාභිමාන වැඩ සටහන</u>
මෙම මුදල් ඉදිරියේදී භාවිතයට ගැනීමට කටයුතු කිරීමට අදාළ අධ්‍යයන අංශය දැනුවත් කර ඇත.

(iv) සංවර්ධන අරමුදල - මෙම අරමුදල් ගිණුමේ ප්‍රමාණවත් ශේෂයක් නොමැති බැවින්, ඉදිරියේදී අරමුදලට තවදුරටත් වෙන් කිරීම් සිදු කර ගෙන භාවිතයට ගැනීමට නියමිතව ඇත.

(ආ) 2023 වර්ෂයේ දී විශ්වවිද්‍යාලයේ ඉදිරි දැක්ම සඳහා අත්‍යවශ්‍ය මෙන් ම විශ්වවිද්‍යාලයේ අරමුණු ලගා කරගැනීමට අත්‍යවශ්‍ය ක්‍රියාකාරකම් පමණක් ඇතුලත් ව ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ අතර එම වර්ෂය තුලදී ද අප බලාපොරොත්තු වූ පරිදි භාණ්ඩාගාරයෙන් අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීමත් සහ විශ්වවිද්‍යාලය මගින් අපේක්ෂිත උත්පාදන ආදායම් ද පැවති ආර්ථික අර්බුදය හමුවේ ලගා කර ගැනීමට නොහැකි විය. ඒ හේතුවෙන් එම ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ ක්‍රියාකාරකම් නැවත සමාලෝචනය කර එම වසර තුළ පවතින මුදල් ප්‍රමාණය තුල ඉටුකිරීමට කටයුතු කරන ලදී. එහෙත් සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා පැවති ක්‍රියාකාරකම් හැකි උපරිම අයුරින් ඉටු කිරීමට ද උත්සහ ගන්නා ලදී.

Professor Ranjana W. Seneviratne
Vice Chancellor
The Gampaha Wickramarachchi
University of Indigenous Medicine, Sri Lanka

මහාචාර්ය රංජන ඩබ්. සෙනෙවිරත්න
උපකුලපති

පිටපත් :- 1 ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය
2 ලේකම්, මුදල් ,ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති ආමාත්‍යාංශය
3 සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව